# 10 ශ්‍රේණිය සිංහල

## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පොත අංක-01-2022




සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)


(විවිධ පළාත්, කලාප සහ පාසල් මගින් පළමුවන වාරය සඳහා නිකුත් කළ ප්‍රශ්න පත්‍ර 07ක් සහ ලැබී ඇති පිළිතුරු පත්‍ර අන්තර්ගතය.)


Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

**පළමු වාර ඇගයීම**
**முதலாம் தவணைமதிப்பீடு - 2018**
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper I | පැය / மணித்தியாலம் / Hours 01 |

සැලකිය යුතුයි.

I) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 කි.
II) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති **(1),(2),(3),(4)** පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.
III) පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවයේ (x) ලකුණ යොදන්න.
IV) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ,ඒවා ද පිළිපදින්න.

---

- අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයේ **තද කළු අකුරින්** මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

(01) ශීල ව්‍යාපාරයේ යෙදුණු රුදව්යෝ **කිසි හැලහොල්මනක් නැතිව** භාවනාවේ යෙදුණහ.
(1) කලබලයකින් තොර ව (2) බොහෝ නිශ්ශබ්ද ව
(3) කතාබහක් නොමැති ව (4) ඉතා සාමකාමී ලෙස

(02) ඇතැම් දූෂිත මිනිසුන්ගේ **උල්පන්දම් දීම** නිසා මත් උවදුර සමාජ පිළිලයක් බවට පත් වී ඇති බව පෙනේ.

(1) උපකාර කිරීම (2) රහසින් අනුබල දීම
(3) උපදේශ දීම (4) දිරි ගැන්වීම

(03) ‘ඕවා **කෝපි කාලේ වැඩ**’යි,කියමින් තරුණ පුතු සිය පියාගේ යෝජනාව එක් වර ම ප්‍රතික්ෂේප කළේ ය.
(1) ඉංග්‍රීසි යුගයේ (2) රාත්‍රී කාලයේ
(3) අසීරු අවධියේ (4) පුරාණ කාලයේ

- අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

(04) නගරයේ වෙළෙඳ ප්‍රජාවගේ ........................... සුවිසල් වෙසක් තොරණ ඉදිරිපත් කෙරිණි.
(1) අනුබලයෙන් (2) අනුවාදයෙන් (3) අනුග්‍රහයෙන් (4) අනුසාරයෙන්

(05) මෙවර මැතිවරණයේ දී කොට්ඨාස මට්ටමෙන් අලුතින් සීමා .................... කෙරිණි.

(1) තීරණය (2) සාධනය (3) සටහන් (4) නිර්ණය

(06) ඉපැරණි සිංහල සාහිත්‍යය පිළිබඳ ..................... දැනට විද්‍යමාන නොවන කෘතිවලින් උපුටා ගත් පාඨ විශාල පිටිවහලක් සපයයි.

(1) ගවේෂණයේ දී (2) පරීක්ෂණයේ දී (3) නිරීක්ෂණයේ දී (4) නිගමනයේ දී

(07) අකාරාදී පිළිවෙළට යෙදුණු පද පේළිය තෝරන්න.

( 1) මිහින්තලය , වෙස්සගිරිය , දඹුල්ල, සිතුල්පව්ව

( 2) යාපහුව, සීතාවක , කුරුණෑගල , කෝට්ටේ

(3) කැරගල ,තොටගමුව, දෙවිනුවර , පැපිලියාන

(4) කැලණිය , කැරගල , වීදාගම , දෙවිනුවර

(08) සෑම පදයක ම අක්ෂර වින්‍යාසය **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.

(1) අෂ්ඨාංගික , ඓශ්වර්ය,කැලණිය, දෘශ්ටිගෝචර

(2) සණ්ටාරය , පිළිබිඹුව , පැමිණිල්ල , ශිෂ්ටාචාර

(3) ක්ෂණික , ඖෂධ , නිශ්චල , කාණ්ඩය

(4) ස්ථූප , ස්ථිර, පෘෂ්ඨ , කණගාටුව

(9) මුලින් දී ඇති වර්ගයට අයත් අක්ෂර **නිවැරදි ව** දැක්වෙන වරණය තෝරන්න

(1) සඤ්ඤක - හ , ඡ , ඞ , ඳ , ම

(2) මහාප්‍රාණ - ස , ජ , බ , ඵ , හ

(3) ඌෂ්මාක්ෂර - ස , හ, ළ , ෂ , ශ

(4) නාසික්‍ය - ඞ , න, ම, ණ, ඤ

(10) <u>**ප,ශ,ෂ,ස**</u> අක්ෂර හැඳින්වෙන නාම **නිවැරදි ව** දැක්වෙන වරණය තෝරන්න.

(1) ඕෂ්ඨජ , තාලුජ, මූර්ධජ , දන්තජ

(2) ඕෂ්ඨජ, මූර්ධජ, දන්තජ, තාලුජ

(3) දන්තජ , මූර්ධජ , ඕෂ්ඨජ , තාලුජ

(4) තාලුජ, දන්තජ, ඕෂ්ඨජ, මූර්ධජ

(11) <u>කැ</u>නේ<u>ඩි</u> <u>යා</u> <u>නු</u> යන පදයේ ඉරි ඇඳි අකුරේ යෙදුණු පිල්ලම් නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(1) ඇදපිල්ල , ඉස්පිල්ල , පාපිල්ල , ඇලපිල්ල

(2) පාපිල්ල , ඉස්පිල්ල , ඇලපිල්ල, ඇදපිල්ල

(3) ඇදපිල්ල , ඉස්පිල්ල , ඇලපිල්ල , පාපිල්ල

(4) පාපිල්ල , ඉස්පිල්ල . ඇදපිල්ල , පාපිල්ල

(12) පිළිවෙළින් ඇලපිල්ල ,යංශය, ගැටපිල්ල **යෙදුණු** පදය තෝරන්න.

(1) සාමාන්‍යග්‍රය (2) මාධ්‍යවේදීන් (3) භාෂෝත්පාද (4) වාද්‍ය වෘන්ද

(13) උක්ත නාම පද **පමණක් යෙදී ඇති** වරණය තෝරන්න.

(1) මිනිස්සු ,දරුවෝ , සතෙක් , දුනුවායන්

(2) ළමයා , රජතුමා , ශිල්පියෝ, දියණියක්

(3) අප , හරක් , ලිහිණියෙක් , කේවට්ටයෝ

(4) වෙළෙන්දෝ , ගැහැනියක , වලස්සු , මම

(14) වනත් නොයෙක් ගං හෝ ඇළ කඳුරු පැන
මහත් ගැඹුරු සිඳු නො යෙනෙ'වි වෙරළ පැන
ලදත් මෙමුළු දඹදිව රජ සිරි සුදන
සිරිත් ලෙසට පවතී උඩඟු නොවෙමින

මෙහි සඤ්ඤක අක්ෂර ගණන **නිවැරදි ව** දැක්වෙන වරණය කුමක් ද?

(1) 3 කි (2) 4 කි (3) 5 කි (4) 6 කි.

(15) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) වානර - වඳුරු , සාමුව, සුව, ශාඛාමෘග
(2) මොනර - මයුර , පිල්බර , නිල්ගෙල, මීයුරු
(3) අශ්ව - හය, තුරඟ, අසු, හසුන්
(4) සියොත් - සකල, විහඟ, සකුණ, පක්ෂි

(16) විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

(1) උත්තම - අධම (2) කුලීන -කුලවත්
(3) ඌන - අනූන (4) සංකෝචනය - ප්‍රසාරණය

(17) උපසර්ගයක් නොවන පදයක් **ඇතුළත්** වරණය තෝරන්න

(1) අපවිත්‍ර , ඉමහත් , දුගඳ , නිර්මල
(2) අවමාන ප්‍රභේද, සද්භාව, ඔවදන්
(3) අපද්‍රව්‍ය , පිරිසිදු, උපදේශ, සුචරිත
(4) අනුභව , අපගමනය, උදුල, සාම්ප්‍රදායක

- අංක 18 සිට 20 දක්වා ප්‍රශ්නවල **තද කළු අකුරින්** මුද්‍රිත වචනයේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

(18) මුවින් නිකුත් වන ශබ්ද ලියා දක්වන **දෘෂ්ටි ගෝචර** සංකේත අක්ෂර නම් වේ.

(1) ඇසට පෙනෙන (2) ඇස පිනවන (3) ඇස රවටන (4) ඇස් ඇද ගන්නා

(19) එච්.එම්.කුඩලිගම, පී.බී.අල්විස් පෙරේරා ,මීමන ප්‍රේමතිලක, **සමකාලීන** කවියෝ වූහ.

(1) කොළඹ යුගයට අයත් (2) දෙවන පරපුරට අයත්
(3) එක ම යුගයට අයත් (4) නූතන යුගයට අයත්

(20) නිර්මාණකරුවෝ තම **පරිකල්පනය** මෙහෙයවා තමා ලත් අත්දැකීම් ප්‍රතිනිර්මාණය කරති.

(1) ඉදිරිපත් කිරීමේ ශෛලිය (2) සිතින් මවා ගැනීම
(3) සිද්ධි එකිනෙක ගැළපීම (4) අපූරු වස්තු නිර්මාණය

(21) පහත දැක්වෙන ක්‍රියා පද **නිවැරදි ව** ගළපා ඇති පිළිතුර තෝරන්න

A. ඒ වතුරෙන් වෙල <u>සරු වී</u> E පූර්ව ක්‍රියා
B ඉදි කළ වැව් <u>බලන්</u> F අසම්භාව්‍ය ක්‍රියා
C හිනා වෙනවා ඇද <u>කර කර</u> G විධි ක්‍රියා
D <u>වුව හොත්</u> රජ නපුරු වෙතේ H මිශ්‍ර ක්‍රියා

(1) A-H (2) B-E (3) C-H (4) D-G

(22) එක් එක් පේළිවල දී ඇති පදවලට සමානාර්ථවත් යෙදුමක් ඇතුළත් **නොවන පද** පේළිය තෝරන්න.

(1) චෛත්‍යය -සෑය , පටිමාඝර - පිළිම ගෙය , ප්‍රදක්ෂිණා - පැදකුණු

(2) වාලුකාංගණ-වැලිමළුව , ශ්වේත ඡත්‍ර-සේසත , බෝධිඝරය-බෝ ගෙය

(3) චේතියඝර -සෑ ගෙය ,පුප්ඵාධාන -මල් අසුන ,හත්ථිප්‍රාකාර- ඇත් පවුර

(4) අජාතශත්‍රු-අජාසත් , සම්බුද්ධ -සම්බුදු , ධාතු ගර්භ -දැගැබ

(23) අසම්භාව්‍ය ක්‍රියාවක් **යෙදී ඇති** වාක්‍යය තෝරන්න.

(1) ගංගා තරඟ නගමින් යශෝ ගී ගයයි.

(2) කම්කරුවන් කර බා ගෙන වැඩ කිරීමට පටන් ගත්හ.

(3) මහ තෙරුන් පිළිගනු ලබද්දී එතුමන් අසල සිටීමට මම වග බලා ගත්තෙමි.

(4) උන් වහන්සේ ඉතා වෙහෙස වී වැඩපළෙහි යෙදුණහ.

(24) උපමාවක් **යෙදී ඇති** වාක්‍යය තෝරන්න

(1) එම අලුත් දෑ තුළ ඉතා තුටුපහටු බවක් විය.

(2) නිර්ධන පන්තික දුක් විඳින මිනිසා කරත්තයක බැඳි ගොනකු සේ ය.

(3) ඒ පොළොවේ සූරිය මල නුඹ නිසා ය.

(4) සාහිත්‍යය යනු භාෂාත්මක වික්‍රමයකි.

(25) පහත සඳහන් කවියේ හතර වන පදය දී ඇති පද අතුරෙන් තෝරන්න.

නව වැස්සට වැව පිරිලා
කෙකටිය මල් උඩ ඇදිලා
ඒ අතටයි මේ අතටයි
..........................................

(1) ගොයම් පැහෙනවා (2) නැමී වැනෙනවා (3) හිතේ ඇඳෙනවා (4) කුඹුර කොටනවා

(26 ) **වැරදි** ව්‍යාකරණ විග්‍රහය ඇතුළත් වරණය තෝරන්න.

(1) වෙනත් අකුරක උපකාරයක් නොමැතිව,තනිව ශබ්ද කළ හැකි අක්ෂර ව්‍යාංජන නම් වේ.

(2) ව්‍යාංජනයකට එකතු වන ස්වරයේ ස්වරූපය සංකේතවත් වන්නේ පිලි මගිනි.

(3) නාම ප්‍රකෘතියකින් පසුව විශේෂ අර්ථයක් සහිත ප්‍රත්‍යය යොදා සාදා ගන්නා නාම තද්ධිත නාම වේ.

(4) කෘදන්ත නාම යනු ධාතුවකට පසුව විශේෂ අර්ථ සහිත ප්‍රත්‍යය යොදා සාදා ගන්නා නාම ය .

(27) පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් සූචනය වන නිවැරදි ග්‍රාම නාමය ඇතුළත් වරණය තෝරන්න.

(1) ම් පන් ගහ (2) එකරතගම (3) ඩු වෙ ක ලස (4) ජ ධ ර් ය ර න ව පු

(28) නිවැරදිව පද බෙදා ඇති වරණය තෝරන්න.

(1) බහු+අර්ථ (2) නීති + අනුකූල (3) තද් +අනුබද්ධ (4) සත් +ආශ්‍රය

අංක 29 සිට 30 දක්වා දී ඇති ප්‍රස්තාව පිරුළුවලට **වඩා ගැළපෙන** අදහස සහිත වරණය තෝරන්න.

(29) **ගින්නක් නැතිව දුමක් නොනගී**

(1) හේතුවක් නැතිව කිසිවක් සිදු නොවේ.

(2) සියලු දේ සඟවා තබා ගත නොහැකි වේ.

(3) සත්‍යය කවර දා හෝ ජය ගනු ඇත.

(4) සැකය නිසා විනාශයට පත් වේ.

(30) **උඩ පැන්නොත් බිම වැටේ.**

(1) කරදර පිට තවත් කරදර ඇති වීම.

(2) උඩඟුකමින් කටයුතු කිරීම නිසා විපතට පත් වීම.

(3) බයකින් සැකයකින් තොරව කටයුතු කිරීම.

(4) තමන්ට නුපුරුදු කාර්යයක් කිරීමට ගොස් අමාරුවේ වැටීම.

(31) 'කුඩා කල දී ම අනාගතය පිළිබඳ යහපත් ලකුණු දැකිය හැකි ය.' යන්නට **යෙදිය හැකි** ප්‍රස්තාව පිරුළ තෝරන්න.

(1) යන යකා කොරහත් බිඳගෙන යනවා ලු

(2) ඉබ්බා දියට දැම්මා වගේ

(3) හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ

(4) ගල හොඳ නම් අඹරන කහ මක් වේ ද?

(32) පහත දැක්වෙන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

" මාත් එක්ක ඔක්කොමලා ගෙදර ගියා "

(1) මා සමග සියලු දෙනා නිවසට ගියහ.

(2) මම සමග සියලු දෙනා නිවසට ගියෝ ය.

(3) මා සමග සියලු දෙනා නිවසට ගියේ ය.

(4) මං සමග සියලු දෙනා නිවසට ගියේ ය.

- 33 සිට 35 තෙක් දී ඇති වාක්‍යවලින් ව්‍යාකරණානුකූල ව **වැරදි** වාක්‍යය තෝරන්න.

(33) (1) මුව රංචුව වනයේ සැරිසරති. (2) උදෑසන පියුම්හු විකසිත වෙයි.

(3) රජ්ජුරුවෝ ධාර්මික ව වැසියන් රකිති. (4) නදීතොමෝ ගලා බසියි.

(34) (1) ඕ තොමෝ පින්කම්හි යෙදුණා ය . (2) කේවට්ට තුමූ වියත්තාහ.

(3) එක් අයෙක් සභාවෙන් ඉවත් වූහ. (4) මහෞෂධ පණ්ඩිතයෝ මිථිලා නුවර ආරක්ෂා කළහ.

(35) (1) ඔවුහු කතාබහ කරමින් පැමිණියෝ ය.

(2) දවස් ගිය සේ සුව දැයි බමුණා රජුගෙන් විමසුවේ ය.

(3) තුරු පෙළ අහසේ බබළයි.

(4) නාට්‍ය කණ්ඩායම වීදි කොනක දී නාට්‍ය ඉදිරිපත් කෙරිණි.

(36) " අර මිනිස්සුන්ටත් වතුර තිබහ ඇති. තේ ටිකක් දුන්නොත් නරක ද" ?
මෙහි ඇතුළත් **නොවන** විරාම ලක්ෂණය තෝරන්න

(1) තනි උඩු කොමාව (2) ප්‍රශ්නාර්ථ ලකුණ
(3 ) තිත (4) යුගල උඩු කොමාව

(37) මෙහි (අ), (ආ) කොටස් යටතේ දැක්වෙන සංඛ්‍යා නාම ගණනින් එකිනෙකට ගැළපූ විට නිවැරදි වරණය වන්නේ

| (අ) | (ආ) |
|---|---|
| P -අටළොස් | T - 16 |
| Q - සොළොස් | U - 84 |
| R - සූවිසි | V - 18 |
| S - සුවාසූ | W - 24 |

(1) P W (2) Q U (3) R V (4) S U

(38) '**නැතිව** 'යන්නට " **නැතුං**" සේ යෙදෙන්නේ
(1) දකුණු ප්‍රදේශයේ (2) උඩරට ප්‍රදේශයේ (3) මොනරාගල ප්‍රදේශයේ (4) ඌව ප්‍රදේශයේ

(39) පියාගේ වැඩිමහල් සහෝදරයා හැඳින්වීමට යෙදෙන පදයක් නොවන පිළිතුර ඇතුළත් වරණය තෝරන්න.
(1) මහප්පා (2) කුඩප්පා (3) බක්කප්පච්චි (4) ලොකු අප්පච්චි

(40) හිස් තැන්වලට ගැළපෙන යුගල පද නිවැරදි ව යෙදී ඇති වරණය තෝරන්න.

" අවුරුදු චාරිත්‍ර ................. හරියට ම ඉෂ්ට .................... කරන්න ඕනෑ.

ගෙවල් ......... සුද්ද ............ කරලා හිටිමුකෝ කලින් ම. "

(1) චාරිත්‍ර , නිෂ්ට , දොරවල් , බද්ද
(2) චාරිත්‍ර , සිද්ධ , දොරවල් , බද්ද
(3) චාරිත්‍ර , සිද්ධ , දොරවල් , බුද්ද
(4) චාරිත්‍ර , අනිෂ්ට , දොරවල් , බද්ද

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

***සැලකිය යුතුයි.***

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.

---

01. (I) සිට ( x) තෙක් ඇති සියලු ම ප්‍රශ්නවල අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් ,එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්
(අ) අනුනාසික අක්ෂරයක් (ආ) අර්ධ ස්වරයක් ලියා දක්වන්න.

(ii) පහත දැක්වෙන වචන යොදා අර්ථවත් වාක්‍යය බැගින් නිර්මාණය කරන්න.
(අ) අගල (ආ) කඳ

(iii) පහත සඳහන් ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු ව්‍යවහාර ලියන්න.
(අ) ගහමප ආ) දොරං

(iv) චෛත්‍යයක පහත දැක්වෙන අංග සඳහා භාවිත වූ විශේෂ යෙදුම් ලියා දක්වන්න.
(අ) ධාතූන් වහන්සේලා නිදන් කර ඇති ස්ථානය (ආ) චෛත්‍යයෙහි ඉහළ ම පේසාව

(v) මෙම පදවල ප්‍රකෘති වෙන් කර දක්වන්න.
(අ) වැද්දෝ (ආ) සොයති

(vi) පහත දී ඇති වචන සඳහා විරුද්ධාර්ථවත් පද ලියන්න.
(අ) ජනාකීර්ණ (ආ) නිරාශ්‍රය

(vii) පහත දැක්වෙන වාක්‍යාංශ සඳහා තනිපද ලියන්න.
(අ) කාව්‍යය සඳහා යොදා ගන්නා කියමන්
(ආ) අලුතින් නිර්මාණය කරන ලද්දා වූ

(viii) මෙහි සඳහන් ක්‍රියා පදවල ක්‍රියා වර්ගය ඉදිරියෙන් ලියන්න.
(අ) බල බලා (ආ) නටවයි

(ix) මෙම අර්ථය ලබා දෙන ඉඟි වැකි ලියන්න.
(අ) බලවතා දුබලයා පෙළීම (ආ) නිශ්ශබ්ද ව

(x) පහත සඳහන් උක්ත පදවල අනුක්ත බහු වචන රූප ලියන්න.
(අ) විද්වතා (ආ) මගියා ( ලකුණු 2 X 10 = 20)

(02) පහත දැක්වෙන (අ) , (ආ) , (ඉ) , (ඊ) විස්තර අතරින් එකක් තෝරා ගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

- අන්තර්ගත විය යුතු කරුණු
- ඡේද සංඛ්‍යාව
- කරුණු පෙළ ගැස්වීමේ දී අනුගමනය කළ හැකි ක්‍රියා පිළිවෙළ
- යොදන මාතෘකාව ; ආදිය පිළිබඳව මග පෙන්වීමක් අදාළ විස්තරය ඇසුරෙන් ලබා ගන්න

අ) කියවීම කෙරෙහි සිසුන් යොමු කරවීම සමාජ වගකීමකි. විද්‍යුත් මාධ්‍ය භාවිතය නිසා වත්මන් සිසු පරපුරෙහි කියවීමේ රුචිය හීන වී ඇතැයි ඇතැම්හු පවසති. කියවන සිසු පරපුරක් බිහි කරලීම කෙරෙහි ගත හැකි ක්‍රියා මාර්ග රැසක් තිබේ. ඒවා පිළිබඳව අවධානය යොමු කරමු.

ආ) අප රටේ පාරිසරික පද්ධතියට ප්‍රබල බලපෑමක් ඇති කරන සාධකයක් වන්නේ දිරාපත් නොවන අපද්‍රව්‍යයයි. මිනිස් ජීවිතවලට මහත් තර්ජනයක් වන නිසා මේ පිළිබඳ ව දැඩි අවධානයක් යොමු කළ යුතු ය.මේ සඳහා විවිධ ක්‍රියා මාර්ග රැසක් මේ වන විට ගෙන ඇතත් මහජනයාගේ දැනුම්වත් බව මෙහි දී වඩාත් වැදගත් සාධකයයි.

ඉ) උසස් සංස්කෘතියකට නෑකම් කියන ශ්‍රී ලාංකිකයෝ එයින් මහත් උද්දාමයට පත් වෙති. එදා තැනුණු වැව, දාගැබ, බිතු සිතුවම් අපේ අනන්‍යතාව හෙළි කරයි. මෙහි අගය වටහා ගෙන ඒවා අනාගතය වෙනුවෙන් සංරක්ෂණය කිරීම අපගේ යුතුකමකි; වගකීමකි.

ඊ) සමබල ආහාර වේලක් පිළිබඳ ව පුන පුනා කතා කළත් මේ ගැන නිසි අවබෝධයක් නැති බව අපි දනිමු. රටපුරා ම ක්ෂණික ආහාර අලෙවි සැල් ව්‍යාප්ත වෙමින් පවතියි. මේවා පිළිබඳ ව සොයා බලා විධිමත් ප්‍රමිතියකින් යුතු ව අධීක්ෂණයක යෙදිය යුතු කාලය එළඹ තිබේ.

(ලකුණු 25 යි.)

(03) පහත දැක්වෙන ඡේදය හොඳින් කියවා වචන 40-45 වන සේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශයේ ඇතුළත් වචන ගණන උත්තරය අග ලියන්න.

ආධ්‍යාත්මික හා බාහිර වශයෙන් පුද්ගලයාගේ දියුණුවට හෝ පිරිහීමට ඇසුරු කරන්නන්ගේ ස්වභාවය බෙහෙවින් බලපානු ඇත.එක ම මවගේ දරුවන් වුව ඇසුරු කරන්නන්ගේ ආභාසය අනුව වෙනස් වූ අයුරු ගිරා පැටවුන් දෙදෙනෙකු හා සම්බන්ධ කතා පුවතක් වන සත්තිගුම්භ ජාතකයෙන් ප්‍රකට වේ. ඇසුරට සුදුසු මිතුරා අවබෝධ කර ගැනීමෙන් පුද්ගලයාගේ ආධ්‍යාත්මික හා බාහිර දියුණුව මෙන් ම මෙලොව පරලොව යහපත ද උදාකර ගත හැකි ය. අපේ දුර්වලතා අඩුපාඩු දුරු කරවීමේ අදහසින් වැරදි පෙන්වා දෙන තැනැත්තා කල්‍යාණ මිත්‍රයෙකු ලෙස බුදුරජාණන් වහන්සේ ද පෙන්වා දුන් සේක. යමෙකු කරුණාවෙන් අපේ දුර්වලතා පෙන්වා දීමේ දී ඔවුන් සමග ගැටුම් ඇති කර නොගෙන තම අඩුපාඩු අවබෝධ කොට ගෙන තම ජීවිතය සකස් කර ගත යුතු ය. දීර්ඝ කාලයක් ඇසුරු කළත් නියම මිතුරා යනු කවරෙක්දැ' යි තේරුම් ගැනීම ඉතා අසීරු ය. එහෙත් විමර්ශනාත්මක සිහි බුද්ධියෙන් යුතු ව පුද්ගලයන් ඇසුරු කිරීමෙන් කලණ මිතුරා හෙවත් සැබෑ මිතුරා යනු කවරෙක්දැ 'යි අවබෝධකර ගත හැකි ය.

(ලකුණු 10 යි.)

(04) පහත දැක්වෙන පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

කවර තරම්වත් විපතක් පැමිණි ව ර
අදරව පිහිටවන අය හිඟ හෙයින් ස ර
අසරණ අයට වෙයි හැම තින්ම කර ද ර
නියර මිටි තැනින් පිට වේ මය වතු ර

අසල් වැසියෙකුට දුක්පත් වුව නොම ද
තුමුල් පැණැති ගුණවත් අයෙකු පිළිබ ද
එකල් දැනගන්න හැක ඇතැඹුලක් ලෙ ද
ඉගිල්ලෙන විටක වද කොකෙකුගේ සු ද

යමෙක් යම් විපතකින් හැර වැනසෙන් න
කෙනෙක් සිටියහොත් ඔහු සතු දෙය ගන් න
එකෙක් අත නැර කුඩ මස්සන් කන් න
කොකෙක් දිය සිඳෙන තුරු සිටියා වැන් න

i. මෙම පද්‍ය පන්තියට අනුව කරදර ඇති වන්නේ කුමන අයට ද?
ii. අසල් වැසියකුට දුකක් පැමිණි විට පිහිට වන්නේ කෙබඳු අය ද?
iii. අනුන් සතු දේ පැහැර ගන්නා අයුරු උපමා කර ඇත්තේ කුමකට ද ?
iv. පළමුවන පද්‍යය ඇසුරෙන් ප්‍රකට ප්‍රස්තාව පිරුළක් ලියන්න.
v. අර්ථ පහදන්න
(අ) පැණැති (ආ) තුමුල්

(ලකුණු 2 X 5 =10 යි.)

(05) ඔබ පාසලේ වාර්ෂික ව පැවැත්වෙන ශිෂ්‍යනායක නිල ලාංඡන පැලඳවීමේ උත්සවය පැවැත්වීමට සියලු කටයුතු සූදානම් ය. එහි න්‍යාය පත්‍රය පිළියෙල කිරීම පැවරී ඇත්තේ ඔබට යි. නිවැරදි ශිල්පීය ක්‍රම යොදමින් එය සකසන්න.

නැතහොත්

කුරුණෑගල ප්‍රාදේශීය වාර්තාකරු පසන් මධුශංක මහතා පසුගිය දා පැවති අත්කම් භාණ්ඩ ප්‍රදර්ශනයක් නැරඹීමට ගියේ ය. එහි දී ඔහු තබා ගත් සටහනක් පහත දැක් වේ. ඒ අනුව වචන 100- 125 අතර වන සේ පුවත්පත් වාර්තාවක් සකසන්න.

ස්ථානය :- කුරුණෑගල "සුදම්සිරි" ශාලාව

දිනය :- 2018.02.16

ප්‍රධානත්වය :- ඇතුගල්පුර "නව නිර්මාණ" සංසදය

සහභාගීත්වය :- පාසල් දරුවන් , ප්‍රදේශයේ ප්‍රජා සංවිධානයන්හී සාමාජිකයන්, පළාත් නියෝජිතයන්

මූලාසනය :- කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ සභාපතිතුමා

(ලකුණු 15 යි.)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 10 | විෂයය / பாடம் / Subject සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper III | පැය / மணித்தியாலம் / Hours 02 |

- සැලකිය යුතුයි.
- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- 1,2,3,4 ප්‍රශ්නවලටත් 5,6,7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

---

01) අංක (I) සිට ( x ) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත සිංහලයට නැගීමට අනුග්‍රහය දැක් වූ ඇමතිවරයාගේ නම කුමක් ද?

(ආ) සිංහල ජාතක කතාවන්ට නියමිත ආකෘතික ලක්ෂණයක් දක්වන්න.

(ii ) අපි කුමක් බවත් නොදනුම්හ.

(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවුරුන්හට ද?

(ආ) මෙහි 'අපි' යනුවෙන් සඳහන් කර ඇත්තේ කවරෙක් ද?

(iii) සොඬින් ගන්නා ලද මුගුරු ඇති
ලෝහ **ප්‍රාකාර** වී නමුත් පිටින් ඇන සුනු විසුනු කරන්නට සමර්ථ..........

(අ) ඉහත ප්‍රකාශයෙන් කියැවෙන්නේ කවුරුන් ගැන ද?

(ආ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(iv) පඤ්චාල රාජධානිය සන්තක වූ මේ සේනා තොමෝ මෙතෙකැ යි පමණ නැත්තී ය.

(අ) මේ ප්‍රකාශය කරනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ආ) පඤ්චාල රාජධානිය සතු රජුගේ නම ලියන්න.

(v) බෙර ගසව; ගී කියව;**එළුසන්,ඔල්වරසන් ,අසුරුසන් දෙව.**

(අ) ඉහතින් දැක්වෙන විධානයන් කෙරෙන්නේ කා හට ද?

(ආ) එම විධානයන් කරන්නේ කුමන අවස්ථාවක ද?

(vi) (අ) ගුත්තිල කාව්‍යය රචනා වූයේ කුමන ජාතක කතාවක් පදනම් කරගෙන ද?

(ආ) ගුත්තිල කාව්‍යය රචනා කළේ කුමන රාජ්‍ය සමයේ ද?

(vii ) (අ) ගුත්තිල කාව්‍යයේ එන බෝසත් චරිතය කුමන නමකින් හැඳින්වේ ද?

(ආ) ගුත්තිල කාව්‍යය ආරම්භ කර ඇත්තේ කුමන කාව්‍ය ගණයෙන් ද?

(viii) කැර මිණි බරණ රැස්
රසින් සුර සැවු සුවහස්
සුරන් සහ සහසැස්
නො කැර සිටියේ අහස් කුස හිස්

(අ) ඉහත කවියේ 'රාශියක්' යන්න අර්ථ ගැන්වෙන පදය උපුටා දක්වන්න.
(ආ) මේ කවිය හා සම්බන්ධ අවස්ථාව දක්වන්න.

(ix) එමා සත්හු වෙණ නද අසමානය
සමා නොවෙති කොවුලෝ උපමානය
තමා නාද මිහිරැයි යන මානය
-------------------------------------------

(අ) මෙහි අවසන් පද්‍ය පාදය සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි සඳහන් ආකාරයට අවමන් වින්දෝ කවරහු ද?

(x ) දෙදෙන ම ඉඳ දෙ පිට
සව් සත සතන් තුටු කොට
සුර ගඳඹුන් ලෙසට
පටන් ගෙන වෙණ ගායනාවට

(අ) මෙම පද්‍යය ඇතුළත් කෘතියෙහි කතුවරයා නම් කරන්න.
(ආ) ඉහත කවියේ ශබ්දාලංකාරයක් දක්වන්න.

(ලකුණු 2x10 = 20 යි )

02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

i) "සයින් පීඩිත වැ නො හිඳ, නැති කෙනෙක් උළු කැන් බත් ආදිය පිස කව;බොව"

( අ) ඉහත ප්‍රකාශය කළෝ කවරහු ද?

(ආ) එය කුමන අවස්ථාවක කරන ලද ප්‍රකාශයක් ද?

(ii ) " මඟුල් උයන නඳුන් උයනක් සේ සරසා දහස් ගණන් **කුඩම්වල** රා පුරා තම්බා අනේක **ප්‍රකාර මසවුළු** ඒ ඒ ස්ථානයෙහි වළන් පුරා රැස් කොට තබව"

(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.

(ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iii) රජ්ජුරුවන්ගේ කෝප නැමති ගින්නෙන් නැඟි දුම් කඳ සේ උස් වී ,
කන්තලින් කන්තල ගසා සිටවන ලද්දා වූ ඇත් වළල්ලෙකින් ද ..........

(අ) මේ පාඨයෙහි සඳහන් උපමාවක් ලියන්න.
(ආ) මේ පාඨය හා සම්බන්ධ අවස්ථාව කෙටියෙන් ලියන්න.

(iv) සුන් එ තතින් එ සඳ
පසු කැර සුරන් වෙණ නද
දියුණු දියුණු ව නද
නික්ම **පැතිරෙත** දසත විනිවිද

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ ලියන්න.

(ආ) කවියේ අදහස සරල බසින් ලියන්න.

(v) කන් කලු වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දැල් කොලහල වන බියෙනේ
සන් සල නොව එහි පිළිරූ ලෙසිනේ
නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ

(අ) 'ගෙජ්ජි වැල්' සහ 'අශ්ව' යන පද සඳහා කවියා භාවිත කර ඇති වචන ලියන්න.

(ආ) ගුත්තිල වෙණ නාදයට ප්‍රතිචාර දක්වන අශ්වයින්ගේ ආකාරය කවියා ඉදිරිපත් කරන්නේ කෙසේ දැයි කෙටියෙන් ලියන්න.

(ලකුණු 4x5 = 20 යි )

- 03,04 යන ප්‍රශ්න වලට වචන 150-200 අතර විය යුතු ය.

03) (i) මහානුභාව සම්පන්න ගුණයත්
(ii ) නිර්භීතභාවයත්

උම්මග්ග ජාතකයෙහි එන මහෞෂධ පණ්ඩිතයන්ගේ චරිත ලක්ෂණ වේ. නිර්දිෂ්ට කොටස ඇසුරින් සාකච්ඡා කරන්න. එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් සපයන්න.

( ලකුණු 15 යි )

නැතහොත්

උම්මග්ග ජාතකයේ සාර්ථකත්වය සඳහා

(i) අවස්ථා හා සිද්ධි නිරූපණයත්
(ii ) උපමා භාවිතයත්

හේතු වී ඇති බවට නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විමසන්න.

( ලකුණු 15 යි )

04) ගුත්තිල කාව්‍යය

(i) ගුත්තිල මූසිල සුමධුර වීණා තරගයත්

(ii) අද්භූත රසයත්

මතු කරයි. නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

නැතහොත්

ගුත්තිල කතුවරයා අසිරිමත් අවස්ථා නිරූපණයකට

(i) ධ්වනි පූර්ණ භාෂාව
(ii) උචිත උපමා භාවිතය

මගින් දැක් වූ දක්ෂතාව නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න

(ලකුණු 15යි )

- **05,06,07 ප්‍රශ්නවලින් එකකට උත්තර සපයන්න.වචන 125-150 ත් අතර විය යුතුය.**

05) මූසිලගේ දුර්ගුණ ඔහුගේ පරාජයට හේතු වූ බව ගුත්තිල කාව්‍යයෙන් නිදසුන් **තුනක්වත්** දක්වමින් සනාථ කරන්න.

(ලකුණු 10 යි )

06) 'ගුත්තිල කාව්‍යයේ දැක්වෙන්නේ අසිරිමත් සුරඟන වැනුමකි.' **නිදසුන් තුනක්වත්** දක්වමින් මේ අදහස විස්තර කරන්න.

(ලකුණු 10 යි )

07) 'උම්මග්ග ජාතකයෙහි එන චූලනී බ්‍රහ්මදත්ත රජු වහා කිපෙන සුලු චරිතයකින් යුතු වූවෙකි.' අදාළ කොටසින් නිදසුන් **තුනක්වත්** දක්වමින් විමසන්න.

(ලකුණු 10 යි )

# රිච්මන්ඩ් විද්‍යාලය Richmond College

## පළමු වාර පරීක්ෂණය - 2020
## First Term Test - 2020

| 21 | S | I, II, III |
|---|---|---|

**සිංහල භාෂාව හා සාහිත්‍යය I, II, III** කාලය පැය තුනයි.

නම / අංකය : ...................................................................... **10 ශ්‍රේණිය**

## I කොටස

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

- අංක **01** සිට **15** තෙක් **තද කළු අකුරින්** මුද්‍රිත පදවලට සමාන අර්ථය දෙන පද තෝරන්න.

නූතන ලෝකය තුළ විද්‍යාව හා තාක්ෂණය කෙරේ පවත්නා **(01). බලාපොරොත්තු** (01.ඉෂ්ටවීම්, 02 පරමාර්ථ, 03 අපේක්ෂණ, 04 දෘෂ්ටීන්) තර වෙමින් පවතී. ජීවිතය හා බැඳුනු ක්‍රියාදාම **(02). සූක්ෂ්ම** (01. සියුම්, 02. ව්‍යාකූල, 03. තීක්ෂණ, 04.නොතිර) ලෙස අවබෝධ කරගැනීමේ **(03). විස්මය එළවන** (01 භ්‍රාන්තිය දනවන, 02. පුදුමය දුරු කරන,03. ඇතට තල්ලුකරන, 04. මවිතය) දනවන සංසිද්ධීන්හා සාධක බවට පත් වී ඇත. මීළඟ ශතවර්ශයේ ලෝකයේ ඇතිවිය හැකි **(04). වික්ෂිප්ත භාවය** (01.කේන්ද්‍ර ගතවීම,02. සැකමුසු බව, 03 කැලඹෙන සුලු බව,04. විශේෂ සිද්ධීන්) මිනිස් හදවත් තුළ හොල්මන් කරයි. දුප්පත් රටක් පොහොසත් රටක් කිරීමේ ගුප්ත බලයක් විද්‍යාවට හා තාක්ෂණයට නැත. එය **(05). කෝකටත් තෛලය** (01. හැම ප්‍රශ්නයකට ම විසඳුම්,02.සර්වාංග වෛද්‍ය ක්‍රමය,03. විද්‍යාත්මක විනිශ්චය,04. ගොඩ වෙදකම) ලෙස සැලකීම මුළාවකි.

- **අංක 6 සිට 10 තෙක් ඇති ප්‍රශ්නවලට හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(06). නගරෝද්‍යානයේ සෞන්දර්ය නැරඹූ කාන්තාවන්ගේ නෙත් සිත් ප්‍රබෝධවත් ............................

i. වූවාය. ii. විය iii. වූහ. iv. වූණාය

(07). ........................... විනා සෙසු අය දරුවන්ගේ අභිවෘද්ධිය සඳහා කුමට වෙහෙසෙත් ද?

i. දෙමව්පියෝ ii. දෙමව්පියහු iii. දෙමාපියන් iv.දෙමාපියවරු

(08). සාමාන්‍ය ස්ත්‍රියකගේ ප්‍රමාණයට වඩා වැඩුනු සිරුරක් ඇති ............................................ දේශනය ආරම්භයේ දී ම පිරිස මවිතයට පත් කළාය.

i. ඕ තොමෝ ii. ඇය iii. ඕ තුමූ iv. ඕ තෙමේ

(09). විනීතා පාසල් ..................................................... ව සිටියදී ලත් තෑගි සමූහය අපට පෙන්නුවාය.

i. ශිෂ්‍යාවක් ii. ශිෂ්‍යාවක iii. ශිෂ්‍යාවෙක් iv.ශිෂ්‍යාවෙකු

(10). පරණවිතානයන් විසින් අපේ ඉතිහාසය අළලා පොත් පත් රාශියක් ..........................................

i. ලියවිණි. ii. ලියුවේය. iii. ලියන ලදහ. iv. ලියුවාය.

- අංක 11 සිට 14 තෙක් ප්‍රශ්නවල ඒක් ඒක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටස් අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වාක්‍ය තෝරන්න.

(11). වැලේ වැල් නැතිව ගත කළ කාලය පිළිබඳව මන්ත්‍රීතුමා කල්පනා කරන්නට විය.

i. බොරුවට දුක්වීමෙන් ii. ඉඩකඩම් අහිමිවීමෙන්.
iii. ආර්ථික දුෂ්කරතා ඇතිවීමෙන්. iv. හුදකලාවීමෙන්

(12). තමාගේ පැමිණීම පිළිබඳව දණින් පහළට මායිම් නොකිරීම ගැන ඔහු ට තරහක් ඇති නොවීය.

i. ගණන් නොගැනීම ii. මිලක් නියම කිරීම.
iii. අධික සතුටක් ඇති නොවීම. iv. වැඳුම් පිදුම් නොකිරීම.

(13). මිතුරාගේ උප්පරවැට්ටියකට අසුවීම නිසා ජිනදාසට රැකියාව එපා විය.

i. ප්‍රයෝගයක ii. ආයෝජනයකට.
iii. තර්ජනයකට iv.ණය මුදලකටය.

(14). එකිනෙකාට කඹුරා ලැබූ සොච්චම ඉතා සුපරික්ෂාකාරීව බැංකුපොතේ දමා ගත් සිරිදාස විශාල මුදලකට හිමිකරුවෙක් වූයේය.

i. විශාල මුදල ii. ස්වල්පයක් iii. නෝට්ටු. iv. පාරිතෝෂය.

(15). සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

i. ජනගහනය,ජෑවිවිය, මොනරපිල, සංඛ්‍යාලේඛන
ii. අනුමානය, ඇළවේළි, මනමාළිය, සංශෝධනය
iii. ජොෂ්ට, ශීර්ෂපාය, භාෂනය, වලාකුල
iv. ඇතුළුවීම, උද්ඝෝෂණය, සණ්ඨාර, පුපුරනවා

(16). පහත දී ඇති පද පේළිවල ඇතුළත් පදවල දෙනව අක්ෂරයෙහි පිළිවෙලින් ඉස්පිල්ල, ඇලපිල්ල, පාපිල්ල, දීර්ඝ පාපිල්ල යෙදී ඇති වරණය සොයන්න.

i. අඹිලින්, නැට්ට, අටුව, බූරුවා
ii. ඉම්හිරි, අමාරුව, දරුවා, ස්තූපය
iii. ඉසිර, රසැති, රුපියල, පෙරළු
iv. නිවිති, අමාව, කටුවල, අරුමය

(17). සෑම පදයකම ඌෂ්ම අක්ෂරයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.

i. පුරුෂයා, සමනලයා, ඝාතිමා, කමල්
ii. දක්ෂතා, ඝවුසි, කම්හල, ප්‍රශංසනීය
iii. ප්‍රශ්න, ගුවන, ළමයා, යහළුවා
iv. ඛනිජ, ඡන්දය, සංඝ, ප්‍රථම

(18). පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් සූචනය වන නිවැරදි ග්‍රාම නාමය ඇතුළත් වරණය වන්නේ,

i. යලිගිදින්ගටහන ii. වලාකකිදි.
iii. ලවඩකන්දරම iv.යරපුරාමඅනු.

(19). ගී ගයන්නී නන්දා මාලිනී ය යන වාක්‍යයේ 'ගයන්නී' යනු

i. නිපාතයකි ii. කෘදන්තයකි
iii. විශේෂ්‍යයකි. iv.මිශ්‍ර ක්‍රියා පදයකි.

(20). අනුක්ත නාම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

i. ගොනුන්, කාන්තාවන්, කෙනෙක්, අප
ii. බලවත්තු, නුගතුන්, ශිෂ්‍යයින්, කුමාරවරුන්
iii. ගංඟාවන්, මවක්, තොප, ඔවුන්
iv. සොරුන්, ගැහැනියක, නිලධාරීන්, දෙවිවරුන්

(21). එකම කාලයකදී පැවතුණ යන යෙදුම සඳහා වඩාත් සුදුසු තනි පදය වන්නේ,

i. සමකාලීන ii. චිරස්ථායී iii. යාවත්කාලීන iv. දීර්ඝකාලීන

(22). ප්‍රාදේශික ව්‍යවහාර යෙදෙන ප්‍රදේශ අනුව ගැළපූ විට නිවැරදි වරණය තෝරන්න.

i. දකුණු පළාත - අම්මණ්ඩි, මුත්තා, දැවා, කන්ට

ii. මොනරාගල - ඉඟුරු, පුහුල්, කරහල්ලා,කුදහළු

iii. උඩරට පළාත - අපුච්චා, හිට්ටා, බැච්චා, සකලයා

iv. සත්කෝරළය - වයිකාලය, හබය මක්කයි, සුම්බරේ

(23). පහත ඉරි ඇඳි පද වල ක්‍රියා වර්ගය පිළිවෙලින් නිවැරදිව ලියා ඇති වරණය තෝරන්න.

'<u>වූවහොත්</u> රජ නපුරු වෙතේ'

'අඳුරට <u>බියවෙයන්</u> පුතේ'

'කළුවළා <u>කැලඹෙමින්</u> මුදුන්වී නැගෙනවා'

'යන එන සැම තැනකම <u>තියා</u> යනවාමයි ගෙඩියක්'

i. අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා

ii. අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා

iii. අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

iv. අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ආශිර්වාද ක්‍රියා

(24). බලයි යන පදයේ උත්තම පුරුෂ, කර්මකාරක බහුවචන අතීතකාල ක්‍රියාපදය වන්නේ,

i. බලමු ii. බලන්නෙමු iii. බැලීමු iv. බැලෙමු

- අංක 25, 26, 27 තෙක් ඇති ප්‍රස්ථාව පිරුළු සඳහා වඩාත් ගැළපෙන අදහස ඇති වරණය තෝරන්න.

(25). 'ගිරයට අසුවූ පුවක් ගෙඩිය වගේ'

i. නුසුදුසු පිළියම් යෙදීම.

ii. තමාට අයිති නැති කාර්යයක යෙදීම.

iii. විනාශවීමට කැමැත්ත ප්‍රකාශකිරීම.

iv. කිසිදු අයුරකින් නිදහසක් ලියන්න.

(26). ඉස අතගා ඇහැ උලුප්පනවා වාගේ.

i. යහපත් දෙදෙනෙකුගේ ඒකතුවීම.

ii. එක දෙයක් වෙනුවට වෙන දෙයක් කිරීම.

iii. මිතුරු වෙසින් සිට සතුරුකම් කිරීම.

iv. යහපත් ලෙසින් සිට උදව් කිරීම.

(27). කණ කොකාගේ සුද පෙනෙන්නේ ඉගිළෙන විටලු

i. උපන් ගති වෙනස් කළ නොහැකි බව.

ii. නියම තත්ත්වය ක්‍රියාවෙන් හෙළිවෙයි.

iii. වෙනස් ස්ථානයකදී වඩා හොඳවීම.

iv. ලැබුණු අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම.

(28). කුරුල්ලා, පොත් , පන්සල් , සොඳුරු යන නාම පදවල ප්‍රකෘති වෙනකළ විට නිවැරදි වරණය වන්නේ කුමක්ද?

i. කුරුලු පොත්, පන්සිල්, සොඳුරු

ii. කුරුල්ලා, පොත්, පන්සල සොඳුරු

iii. කුරුල්ලා, පොතට, පන්සල, සොඳුරුය

iv. කුරුල්, පොත, පන්සිල්, සොඳුර්

(29). ගයන්න, නටනවා, දුවයි, බලති යන ක්‍රියාපද වල ධාතු ප්‍රකෘති පිළිවෙලින්
- i. ගය, නට, දුව, බල
- ii. ගසා, නටා, දුවා, බලා
- iii. ගයයි, නටයි, දුවයි, බලයි
- iv. ගැයූ, නැටූ, දිවූ, බැලූ

(30). මුලින් දැක්වෙන අක්ෂර වර්ගයට අකුරක් නොයෙදුනු වචනය සහිත වචනය තෝරන්න.
- i. අන්තඃස්ථාක්ෂර - වරලස, රුවල්, ලවය, වරය
- ii. වර්ගාන්තාක්ෂර - ඥාණපාල, මඬගල, ප්‍රාණය, සෙත්කවි
- iii. මහාප්‍රාණ අක්ෂර - කුෂ්ඨ, දෘඪ, ස්වීඩායනය, ප්‍රභල
- iv. අඝෝෂ අක්ෂර - බණිජ, තාපය, ඡන්ද, ගවරළ

(31). අකාරාදී පිළිවෙලට නම් යෙදී ඇති වරණය තෝරන්න.
- i. හංස සන්දේශය, අමාවතුර, දළදා සිරිත, පූජාවලිය
- ii. ගිරා සන්දේශය, බුත්සරණ, බුදුගුණ අලංකාරය, සඳ කිඳුරුදා කව
- iii. මඩොල්දූව, විජයබා කොල්ලය, රන්මුතු දූව, ගම්පෙරළිය
- iv. කාව්‍ය ශේඛරය, බෝධිවංශය, ජාතක පොත, ධර්ම ප්‍රදීපිකාව

(32). කිසියම් දෙයක යථාතත්වය නොදැන විවිධ අදහස් පළකිරීම.
- i. ඇටිකෙහෙල් කෑ උගුඩුවා වාගෙයි.
- ii. පරංගියා කෝට්ටේ ගියා වගෙයි
- iii. කතරගම ගිහින් කිරි වෙහෙර නොදැක්කා වාගෙයි.
- iv. අන්ධයින් අලියාගේ හැඩරුව කීවා වාගෙයි

(33). අර්ථ රහිත යුගළ පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.
- i. ලටපට, වංහුං, තක්කු මුක්කු, දනිපනි
- ii. ඕපදූප, අතංමනං, ලවක් දෙවක්, ලට්ට ලොට්ට
- iii. අතොර පතොර, අන්දුන් කුන්දුන්, ආවතේව, ආවරමේවර
- iv. ඊස්මීස්, කසුකුසු, සිරාබිරා, හදිහුනියම්

(34). පහත 'අ' 'ආ' කොටස් යටතේ දැක්වෙන නම් හා එමගින් සැදී ඇති සංඛ්‍යා වඩාත් නිවැරදි ලෙස එකිනෙකට ගැළපෙන වරණය තෝරන්න.

| අ | ආ |
|---|---|
| A දසඑකඩමස | F 14 |
| B අර්ධ ශතකය | G 9 ½ |
| C සතළොස් | E 17 |
| D තුදුස | H 50 |

i. AF ii. BG iii. CE iv. DH

(35). A - සිරිදාස ඊයෙත් අපේ ගෙදර ආවේය. අදත් ආවේය.
B - බල්ලාගෙන් මාරාන්තික රෝග සැදෙයි, ඌ අහිංසක සත්ත්වයෙකි.
C - අම්මා අප වෙනුවෙන් ජීවිතයම කැප කළාය. තාත්තා ද අපට දැඩිව ආදරය කරයි.
D - බසය මහරගමට ගමන් කරයි. එය අවිස්සාවේල්ලට පැමිණෙයි.

K සේ M නැවත N එහෙත් O නිතර

ඉහත A B C D වාක්‍ය තනි වාක්‍යයක් ලෙස ගැළපීමේදී නිපාත පද භාවිතයේ යෝග්‍ය අනුපිළිවෙල වන්නේ

i. N O K M ii. K M N O iii. M O N K iv. O N K M

- 37, 38 ප්‍රශ්නවල දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

(36).

i. නුඹලා අපේ රට ආරක්ෂා කරන නිර්භීත සේවකයෝලු.
ii. මාර්ටින් වික්‍රමසිංහ මහතා දක්ෂ ලේඛකයෙකු වෙයි.
iii. සැකකරුවන් සියලුදෙනා බන්ධනාගාරය වෙත ගෙන ගියහ.
iv. ගුරු සංගමයේ සාමාජිකයෝ බලාපොරොත්තු වන්නේ මොනවාද?

(37).

i. ශිෂ්‍ය ශිෂ්‍යාවෝ උත්සවයට පැමිණෙතියි සංවිධායකයෝ සිතති.
ii. නව සාමාජික මණ්ඩලයේ කාන්තාවන් ද ඇත.
iii. මහ වෘක්ෂ තුමූ මනුෂ්‍යයාට ආහාර සෙවණද ඖෂධ ද සපයයි.
iv. සූර්ය තෙමේ චන්ඩ රශ්මිය පතුරවයි.

(38).

i. ශිෂ්‍යයෝ කැටුව ගුරුවරු දේශන ශාලාවට පැමිණෙති.
ii. ඇය දෙවඟනක් මෙන් හඳ පැළඳ උත්සවයට පැමිණියාය.
iii. සමණුන් දැ වෙහෙරට වැඩියාය.
iv. දෙමාපියෝ ගෙදර වැඩ කරද්දී ළමෝ නිදහසේ රූපවාහිනිය නරඹති.

- 39, 40 ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා වඩාත් සමීප අර්ථය දෙනවරණය තෝරන්න.

(39). පෘථිවිතලය මත ජීවය ඇති වන්නට පෙර දීර්ඝ කාලීන රසායන පරිණාමයක් සිදුවී ඇති බවට විද්‍යාඥයෝ මත පළ කරති.

i. පොළොව මත ජීවය ඇති වී ඇත්තේ රසායනික ක්‍රියාවලියෙන් පසුවයි.
ii. දීර්ඝ කාලීනව සිදු වූ රසායන ක්‍රියාවලියකින් අනතුරුව පොළොව මත ජීවය ඇතිවී ඇති බව රසායන විද්‍යාඥයින්ගේ මතයයි.
iii. ජීව රසායන විද්‍යාඥයින්ගේ මතය වන්නේ පෘථිවියේ ජීවය ආරම්භවන්නට කලින් දිගු කාලයක් තිස්සේ ක්‍රමික රසායනි ක්‍රියාවලියක් සිදුව ඇති බවයි.
iv. ජීව රසායන විද්‍යාඥයින්ගේ මතයට අනුව පෘථිවිය මත ජීවය ඇතිවීම සඳහා රසායන ක්‍රියාවලියක් හේතුවී ඇත.

(40). නවීන තාක්ෂණික මෙවලම් මිනිසාගේ යහපත වෙනුවෙන් යොදාගත යුතු වූවත් වර්තමානයේ ඒය මිනිසාගේ යහපතට වඩා අයහපතට හේතු වී ඇති බව පෙනේ.

i. නවීන තාක්ෂණික මෙවලම් භාවිතය මිනිසාගේ යහපත සඳහා වියයුතුය.
ii. වර්තමානයේ භාවිත වන තාක්ෂණික මෙවලම් සිනිසාට අයහපත උදාකරයි.
iii. නවීන තාක්ෂණික මෙවලම් මිනිසාගේ කාර්යයන් පහසුකිරීමට වඩා විවිධ අපහසුතා ඇති කිරීමට හේතු වී ඇත.
iv. මිනිසාගේ යහපත වෙනුවෙන් නවීන තාක්ෂණික මෙවලම් යොදාගත යුතු වුවත් අද වන විට එය මිනිසාට අයහපත ද උදාකර ඇත.

# II කොටස

(01). අංක (1) සිට (x) තෙක් ඇති සියලු ම අනු කොටස් වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනු කොටසකට උත්තර නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්වන පහත සඳහන් අක්ෂර කාණ්ඩ දෙක නම් කරන්න.

(අ) ශ ෂ ස හ ෆ (ආ) ය ර ල ව

ii. පහත සඳහන් අදහස්වලට ගැළපෙන තනිපදය බැගින් ලියන්න.

(අ) අපූරු වස්තු නිර්මාණය සඳහා පවත්නා හැකියාව.
(ආ) කවර ලෙසකින් හෝ තීරණයක් දී විසඳීමට නොහැකි.

iii. පහත දැක්වෙන පදවල විරුද්ධාර්ථ පද ලියන්න.

(අ) ආරෝහණ (ආ) උදක

iv. පහත සඳහන් එක් එක් වාක්‍ය ඛණ්ඩය සඳහා අර්ථවත් තනි පදය බැගින් ලියන්න.

(අ) කිසියම් ව්‍යාපාරයක් සඳහා මුදල් යෙදවීම.
(ආ) වචනවල සැඟවී ඇති තේරුම.

v. මෙහි (අ) (ආ) වාක්‍යවල යෙදී ඇති කලාපය යන වචනයට තේරුම් දෙකක් ඇත. ඒ තේරුම් දෙක වෙන් වෙන් ව ලියන්න.
(අ) සඟරාවේ දෙවන කලාපය දැන් නිකුත් වී ඇත.
(ආ) දකුණු ආසියානු කලාපය දියුණුවෙමින් පවතී.

vi. පහත දැක්වෙන (අ) (ආ) යෙදුම්වල පළමු වැනි පදය සමග දෙවැනි පදයෙහි නොගැළපීමක් ඇත ගැළපෙන සේ එක් පදයක් සකස් කර ලියන්න.
(අ) කර්තෘ වැකි (ආ) සොබා ධර්මය

vii. පහත දැක්වෙන කර්තෘ කාරක වාක්‍ය දෙක කර්ම කාරක වාක්‍ය බවට හරවා ලියන්න.

(අ) ගුරුවරු විනය ගරුක ශිෂ්‍යයින් අගය කරති.
(ආ) ගොවියා වගා හානි කරන කීඩැවන් මර්දනය කළේය.

viii. පහත සඳහන් වාක්‍යවල පද ගැළපීම අවුල් සහගතය ඒවා නිසි ලෙස ගළපා සම්පූර්ණ වාක්‍යම ලියන්න.

(අ) නිර්මාංශාහාර හිතකර බව ශරීරයට ආයුර්වේද අපේ පුරාණ පොත පතෙහි දැක්වේ.
(ආ) විශාල ජනකායක් වසන ඉන්දියාව ගොවිතැනින් යැපෙන අපේ ආසියාවේ පිහිටි අසල්වැසි රටකි.

ix. (අ) බලයි යන ක්‍රියාපදයේ පූර්ව ක්‍රියාපදයක් ලියන්න.
(ආ) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියාපදයක් ලියන්න.

x. (අ) අකුරක් ශබ්දයක් පදයක් පුන පුනා යෙදීම හඳුන්වන නම ලියන්න.
(ආ) වචනයක අර්ථයට වැඩියෙන් ප්‍රතියමාන වන අර්ථයට භාවිත නම ලියන්න.

(02). පහත දැක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා සුදුසු මාතෘකාවක් ද දෙන්න.

(අ) අපේ රටේ ජනගහනයෙන් වැඩි කොටසක් ජීවත් වන්නේ ගම්බද ප්‍රදේශවලය. ඔවුන්ගෙන් වැඩි දෙනෙකු ගොවිතැනින් ජීවත්වන අතර රටේ ඉඩම්වලින් විශාල කොටසක් යටවී ඇත්තේ ද ගොවිතැනටය. රටේ ස්වාධීනත්වය රැක ගැනීම සඳහා දරණ ප්‍රයත්නයේදී ආහාර අතින් ස්වයං පෝෂණය වීම මුල්තැන ගනී. මේ කාර්යයෙහිලා ක්‍රියාත්මක වන ව්‍යාපාර බොහෝය. පාසල් ළමයින් වශයෙන් අපද එයට දායක විය යුතුය.

(ආ) රටවැසියන්ගේ සෞඛ්‍යය නගා සිටුවීම සඳහා රෝගවලට ප්‍රතිකාර කිරීම වෙනුවෙන් විශාල පිරිවැයක් දැරීමට සෑම රටකට ම සිදුවේ. රෝග සඳහා පිළියම් යොදන අතරම රෝගවලින් ආරක්ෂා වීමේ අවශ්‍යතාවය පිළිබඳව ද සියලු දෙනාම අවධානය යොමු කළ යුතුය. සෞඛ්‍ය සම්පන්න පුරවැසියන් වෙසෙන රටක රෝග ප්‍රතිකාරය මෙන්ම නිවාරණයද එකසේ වැදගත් වේ.

(ඉ) දරුවාගේ ආරක්ෂාව, දැනුම හා දියුණුව සැලසීමට වැඩිහිටියෝ දිවා රෑ වෙහෙසෙති. වැඩිහිටියන් වයස්ගත වූ පසු නිවෙස්වලම රඳවා ඇප උපස්ථාන කිරීම දරුවන්ගේ වගකීමකි. ඒහෙත් දිනෙන් දින බිහිවන වැඩිහිටි නිවාස දෙස බලන විට මේ වගකීම සමාජයේ ගිලිහීයමින් පවතින බව පෙනේ. වයස්ගත නැදැයෝ මෙම වැඩිහිටි නිවාසවලට කොටුවී අසරණ ලෙස ජීවත් වෙති. මේ නිසා වැඩිහිටියන් නිවෙස්වලම රඳවාගෙන ඔවුන් ආදරයෙන් රැකබලා ගැනීම සමාජයේ වගකීමකි.

(ඊ) පාසල ඇරී එන ජයසේන තම විවේක කාලය බෙහෙවින්ම ගත කළේ පියාගේ වඩු මඩුවෙහිය. ලී කැටයම් කැපීමට පුරුදු වූ ඔහු පාසලේ ප්‍රදර්ශනයට ඉදිරිපත් කළ නිර්මාණ දෙකකටම ප්‍රථම ස්ථානය දිනා තෑගි ලබා ගත්තේය. පාසල් දිවිය හමාර කොට කුඩා කර්මාන්තශාලාවක් පටන්ගත් ඔහු සේවකයින් දොළහක් සමග කැටයම් ශිල්පයෙහි යෙදෙයි. තම නිමැවුම් පිටරට යැවීමට අවශ්‍ය සියලු පහසුකම් ඔහුට ලැබී ඇති අතර අතර ප්‍රදේශයේ දියුණුවට කිසියම් සේවාවක් කිරීමට ඔහුගේ අරමුණයි. ඔබ ජයසේන යයි සිතා ඔහුගේ කතාව ලියන්න.

(03). පහත දැක්වෙන පාඨය වචන 50 - 60 අතර වනසේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

මිහිඳු හිමියන් පැමිණීමට පෙර පවා මෙරට ගනුදෙනු වූ ලිපි ලේඛන පිළිබඳව ඉතිහාසඥයෝ කරුණු දක්වති අශෝක රජු හා දේවානම්පියතිස්ස රජු අතර පණ්ඩුල බමුණා හා පණ්ඩුකාභය අතරත් ගනුදෙනු වූ ලිපි ගැන මහා වංශයේ සඳහන් වේ. ඒ හැමතැනම ලේඛනයන පදය සඳහන්වෙයි. මින් තැනුණු ලේඛන යන පදය පසු කළ වාර්තා යන තේරුම ඇති ලියුම යන අදහස ද යොදාගත්හ. ලිවීම සඳහා රත්තරන් රිදීපත් තඹපත් යොදාගත් බව පුරාවස්තු අතර හමුවූ විවිධ ද්‍රව්‍ය වලින් පැහැදිළි වේ.
කෙටි ලිපි සඳහා පොඩි තහඩු කෑලි යොදාගත්හ. මේ තහඩු පසු කාලයක දී රන්පත් රිදීපත් ලෙස භාවිතයට පැමිණියේ තල් කොළවල ලිවීමට පටන්ගත් නිසයි. ලිවීමට අකුරු සහ ලියන්නා සඳහා ලේඛන අක්ෂර යන ශබ්ද ද ලීයෙන් හා උණපතුරින් තැනූ උපකරණ ද පත්‍ර වර්ගද 'ලීඛා' 'දීපනී' 'ලිපිකාර' යන වචන අශෝක සෙල්ලිපිවල හා පාණිනී ව්‍යාකරණයේ ඇති බව තෙන්නකෝන් විමලානන්ද මහතා පෙන්වයි. ලිය යන සිංහල ධාතුව බිඳී එන්නේ සීරීම් අර්ථය දෙන ලිඛ ධාතුවෙනි දිගු කලක් මෙහි ලිවීමට භාවිත කළේ තල්පත්‍රය. අක්ෂර සඳහා යොදන පාට යන අරුත් ඇති වර්ණ යන පදය පොතු හෝ පවුරු මතුපිට තෙලියෙන් අකුරු ලිවීම හා සම්බන්ධවේ. එහෙත් ලංකාවේ ආදිම කාලයේ තෙලි තුඩින් අකුරු ලියූ බවට සාක්ෂි නැත. අකුරු සඳහා වර්ණ යන පදය ලක්දිව භාවිතයට පැමිණියේ පාලි සංස්කෘත වියරණ ඇදුරන්ගේ මාර්ගයෙනි.

(04). පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

භාමහ විශ්වාස කරන්නේ වක්‍රෝත්තිය යනු කාව්‍යයෙන් හීදී යෙදෙන අලංකාරයන්හි පමණක් නොව ලොව පුරා පවත්නා මුඛ්‍ය ලක්ෂණයක් බවයි. කාව්‍ය අවශේෂ ලේඛනයෙන් වෙන් කොට ගැනීම වක්‍රොත්තිය පදනම් කොටගෙන සිදුවන්නකි. ඉතිහාස ශාස්ත්‍රාදී ලේඛන වක්‍ර භාෂණයෙන් තොර ඍජු උක්ත ක්‍රමයක් අනුගමනය කරන රචනා වේ. කාව්‍ය අලංකාරෝක්තීන්ගේ මාර්ගයෙන් වක්‍රෝත්තිය ගරුකොට ගනී. කිසියම් අදහසක් හුදෙක් වචන මාර්ගයෙන් ප්‍රකාශ කිරීමෙන් වචනයේ ශෝභාවක් ඇති කරනුයේ වක්‍රෝක්ති නම් උක්ත ක්‍රමය මගිනුයි. භාමහ පවසයි. වක්‍රෝත්තියෙන් තොර වූ වර්ණනා ක්‍රමය භාමය හඳුන්වන්නේ වාර්තා නමිනි. වාර්තා යනු කාව්‍ය තත්වයට පත් නොවන ඉතිහාස ආදී යමක් සිදුවූ හැටියෙන් පවසන වර්ණනා ක්‍රමය වේ. සූර්යයා බැස ගියේය සඳ බබළයි.වැනි කියුම් කාව්‍ය නොවේ. ඒවා වාර්තා පමණයි. වක්‍රෝත්තියට නොනැගූ ඍජු භාෂණ බැවිනි.

i. මේ ඡේදයේ පෙන්වන ආකාරයට වාර්තාව යනු කුමක්ද?
ii. වාර්තාව චමත්කාරයක් නොඋපදවන්නේ මන්ද?
iii. කාව්‍ය පුරා පවතින ප්‍රධාන ලක්ෂණය කුමක්ද?
iv. උක්තිකුමය යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?
v. හිරු බැසයයි, සඳ බබළයි, මේවා සන්ධ්‍යා වර්ණනා ලෙස ගත හැකිද?

(05). පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන වාර්ෂික කලා උළෙලේ න්‍යාය පත්‍රය පිළියෙල කරන්න.

* නව සඳරුස් හට
* මහාචාර්ය තිස්ස වෙද ආරච්චි
* මහාචාර්ය පියසිරි විජේතිලක ආරාධිත අමුත්තෝ
* ප.ව. 2.00 සිට සවස 6.00 දක්වා
* ත්‍යාග සහතික පත් ප්‍රදානය
* දිනය 2020 අප්‍රේල් 06

නැතහොත්

මහකනදරාව පොලිස් ස්ථානාධිපති විසින් රඹෑව අරුණ ප්‍රජා මණ්ඩලයේ ලේකම් රුක්මල් මහපොතාන වෙත එවන ලද ලිපියකින් කොටසක් පහත දැක්වේ.එම ලේකම් ඔබ යයි සිතා මෙයට වචන 100 කින් පමණ පිළිතුරක් ලියන්න.

ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාවගේද මුදල් ආධාර ඇතිව මෙවර පැවැත්වෙන බක්මහ උළෙලට ඔබ ප්‍රජා මණ්ඩලයේ සහයෝගය අපේක්ෂා කරමි. ජන ගායනා හා ජන නැටුම් ජාතික ක්‍රීඩා ආදිය පිළිබඳව තරග එහි දී පැවැත්වේ. ගැහැනු, පිරිමි දෙපක්ෂයටම සහභාගීවිය හැකිය. ඉහත කී අංශ සඳහා ඔබ ප්‍රජා මණ්ඩලයේ සහභාගීත්වය ද අපේක්ෂා කරනු ලබන අතර සහභාගීවන තරග ඉසවු පිළිබඳ විස්තර අපට අවශ්‍යය. ළමා තරුණ වැඩිහිටි සියල්ලන්ටම වෙන් වෙන් ව ඉදිරිපත් විය හැකි තරග රාශියක් ඇත.

## III කොටස

- * උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- * **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5, 6, 7** ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- * මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු සංඛ්‍යාව **80** කි.

1. i සිට x තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

i. අ. පන්සිය පනස් ජාතක පොත සිංහලයට නැගූ සියවස කුමක් ද?
ආ. ඒ සඳහා අදාළ කරගත් මූලාශ්‍ර ග්‍රන්ථය කුමක් ද?

ii. අ. ගුත්තිල කාව්‍යයේ කතුවරයා නම් කරන්න.
ආ. ගුත්තිල කාව්‍යය ලියවුණේ කුමන සාහිත්‍ය යුගයක දී ද?

iii. අ. ජාතක කතා ආකෘතියේ අංග තුන නම් කරන්න.
ආ. පන්සිය පනස් ජාතක ලියැවුණේ කාගේ අනුග්‍රහයෙන් ද?

iv. අ. සිංහල පන්සිය පනස් ජාතක පොත ඇසුරු කරගෙන රචිත පරිවාර ග්‍රන්ථ වර්ග කීය ද?
ආ. ඒ මොනවා ද?

v. අ. ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනය කරන ලද්දේ කවුරුන් විසින් ද?
ආ. ගුත්තිල කාව්‍යයේ ඇතුළත් පද්‍ය සංඛ්‍යාව කොපමණ ද?

vi. අ. ගුත්තිල කාව්‍ය නිර්මාණය කිරීමට පාදක වූ ජාතක කතාව කුමක් ද?
ආ. මෙම කාව්‍ය සංග්‍රහය ආරම්භ කිරීමට යොදාගෙන ඇති දෝෂ සහිතයැයි සැලකෙන ගණය කුමක් ද?

vii. අ. පන්සිය පනස් ජාතක පොතේ ඇති ජාතක කතා ගණන කීය ද?
ආ. පන්සිය පනස් ජාතක පොතේ දීර්ඝතම ජාතක කතාව කුමක් ද?

"මේ රජ්ජුරුවෝ ඉතා මරණ භයින් භයට පත්ව ගියාහ"

viii. අ. මේ රජ්ජුරුවෝ යනු කවුරුන් ද?
ආ. මෙම කොටස කුමන පාඩමෙන් උපුටාගෙන ඇත් ද?

ix. අ. ගුත්තිල කාව්‍ය රචකයාගේ ගුරු හිමියන් කවු ද?
ආ. ගුත්තිල කාව්‍යය අදාළ වන කාව්‍ය විශේෂය කුමක් ද?

x. "එසේ හෙයින් කල් නොයවා යහපත් තැනකින් වහා නික්මුණු මැනව"
අ. මෙම ප්‍රකාශය කීවේ කවුරුන් විසින් ද?
ආ. මෙම ප්‍රකාශය සිදු කළේ කුමන ස්ථානයක සිට ද?

2. පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. දිය දිය ගොඩ එලි කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
.....................................................................

අ. මෙම පද්‍යයේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න.

ආ. දිය දිය ගොඩ යන පද දෙකෙහි තේරුම ලියා දක්වන්න.

ii. සුවඳ තෙලෙහි නගන ලද පහන් ආලෝකයෙන් ගන්ධදාම **පුෂ්පදාමාලාවලම්බිත** නානාවර්න විචිත්‍ර **විතානෝපලක්ෂිත** අලංකෘත ශ්‍රී යහන් ගර්භය.

අ. ඉහත වාක්‍ය ඛණ්ඩයෙහි තද කළු අකුරින් දැක්වෙන වචනවල අර්ථය ලියන්න.

ආ. මෙම ප්‍රකාශයට සම්බන්ධ පුද්ගලයා කවු ද?

iii. පියසන් නොව බිඟු දැන් රැඳි කොපුලී
අවසන් නොව වෙණ නදටම කුහුලී
මඳ සන්සුන් පියොවින් සිටි නොසැලී
ගජ සෙන් සිතියම් ගජ සිරි කියෙලී

අ. මෙහි පළමු පද දෙකෙහි තේරුම ලියන්න.

ආ. මෙම පද්‍යයේ ඇති උපමාව ලියා දක්වන්න.

iv. "තෝ දියෙහි යන්නෙහි මට කුමක් දී දැයි"

අ. මෙම ප්‍රකාශය කීවේ කවුරුන් විසින් කා හට ද?

ආ. මෙම ප්‍රකාශය කීවේ කුමන අවස්ථාවක ද?

v. "නිගණ්ඨ සේනාවක් පරිද්දෙන් ඉස් ලූ ලූ අත ලුහුබඳවා පියෙමි"

අ. මෙම ප්‍රකාශයේ ඇතුළත් රචනා උපක්‍රමය කුමක් ද?

ආ. 'නිගණ්ඨ සේනාවක්' යන්නෙන් අදහස් කළේ කුමන පිරිසක් ද?

3. i. මහෞෂධ පඬිතුමාගේ චරිතයේත්,
කේවට්ට බමුණාගේ චරිතයේත්
දක්නට ලැබෙන යහපත් හා අයහපත් චරිත ලක්ෂණ නිදසුන් දක්වමින් විමසන්න.

නැතහොත්

ii. සුදුසු උපමා භාවිතා කිරීමත්
කෙටි වැකි හා දිගු වැකි සුදුසු පරිදි යෙදීමත් නිසා සතරකන්මන්ත්‍රණය කතාව සාර්ථක වී ඇත.
උචිත උදාහරණ තුළින් පැහැදිලි කරන්න.

4. i. ශබ්දාලංකාර භාවිතයන්
   අර්ථාලංකාර භාවිතයන්
   මැනවින් සිදු කිරීම නිසා වෙණ මිහිර පද්‍ය රසවත් වී ඇත. නියමිත කොටස ඇසුරින් නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.

   ii. රූස්ව සිටි සත්වයින් හා
   රූස්ව සිටි මිනිසුන්
   වීණා වාදනය රස විඳි අයුරු ගුත්තිල කාව්‍ය කතුවරයා දැක්වූ ආකාරය උදාහරණ දෙක බැගින් දක්වමින් විස්තර කරන්න.

- 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.

5. මහෞෂධ පඬිතුමන්ගේ ප්‍රඥාව නිරූපණය වන ආකාරය සතරකන්මන්ත්‍රණය තුළින් පැහැදිලි කරන්න.

6. යම් කෙනෙකු වචන විනාශකාරී ලෙස භාවිතයෙන් සමාජයට විය හැකි හානි සතරකන් මන්ත්‍රණය පාඩම ඇසුරින් විමසන්න.

7. වැත්තැවේ හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවීත්වය ගුත්තිල කාව්‍යයෙන් පැහැදිලි වේ. උචිත උදාහරණ 3 ක් වත් දක්වමින් පැහැදිලි කරන්න.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S I

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

# First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : .......................................... සිංහල භාෂාව හා සාහිත්‍යය - I කාලය : පැය 01යි.

වැදගත් :

✳ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40කි.

✳ 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

✳ **අංක 01 සිට 03 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.**

(01) බොහෝ විට ඉහළ නිලධාරීන්ට යැවෙන ලිපි **හමස් පෙට්ටියට** යෑම පිළිබඳව ගැමියෝ පසුතැවිලි වෙති.
(1) ඉක්මනින් ක්‍රියාත්මක වීම. (2) ප්‍රසිද්ධ වීම
(3) ක්‍රියාත්මක නොවී තිබීම. (4) විනාශ වීම

(02) නාය යාමෙන් **මුළු සේසතම** නැති වුවත් ඔහු දිරියෙන් ජීවිතය ජය ගත්තේ ය.
(1) සිය මිතුරන් අහිමි වුවත් (2) නිවසේ තිබූ කොඩි හා සේසත් නැති වුවත්
(3) සියලු සැප සම්පත් අහිමි වුවත් (4) යාන වාහන ආදිය සොරු පැහැර ගෙන ගියත්.

(03) ඇතැම් ප්‍රදේශවල **කැලෑනීතිය** ක්‍රියාත්මක වීම නිසා එහි ජනතාව නිරතුරු අසරණ භාවයට පත්ව සිටිති.
(1) ප්‍රශ්න මහහැර යෑමෙන් (2) එකඟතාවයකට නොපැමිණීමෙන්
(3) බලවතා දුබලයා පෙළීමෙන් (4) වගකීම භාර නොගැනීමෙන්

✳ **අංක 04 සිට 07 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(04) ජනශ්‍රැති ආරක්ෂා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ දේශීය සංස්කෘතියේ .......................... රැකදීමයි.
(1) අඛණ්ඩව (2) අනන්‍යතාවය
(3) අවශ්‍යතාවය (4) දෘශ්‍යතාවය

(05) .......................... යෙදීම හෙවත් නිරන්තරයෙන් පුහුණු වීම කෙටි කතාවක් නිර්මාණයට ඉතා වැදගත් ය.
(1) පරිශීලනයේ (2) සතතාභ්‍යාසයේ
(3) නිර්මාණයේ (4) කියවීමේ

(06) අධ්‍යාපනය සියලු ගාස්තුවලින් නිදහස් කිරීම කන්නන්ගර මහතාගේ අධ්‍යාපන .......................... යෝජනාවකි.
(1) සංස්කරණ (2) ප්‍රතිසංස්කරණ
(3) අභිමානවත් (4) අවියෝජනීය

(07) සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය .................................... කිරීම සඳහා නියෝජිත පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණෙති.
(1) සමාලෝචනය (2) සමෝදානය
(3) සමාරාධනය (4) විශ්ලේෂණය

(08) අකාරාදී පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) අකීකරු, අතිගරු, කුසලතාව, කාර්යය (2) ඉමහත්, ඉරණම, මිතුරන්, මිනිසා
(3) උද්‍යානය, උසාවිය, ගින්දර, ගිව්සුම (4) ආරවුල, ආපසු, නිශ්චල, නිහඬ

(09) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) සමස්ථ කොට්ඨාශය, කාර්යාලය, පිළිවෙල (2) ප්‍රශ්න, ලේකම්, විශිෂ්ට, ඥානය
(3) විශ්මය, විශ්ලෝෂණය, සීඝ්‍රගාමී, දූරකථනය (4) ප්‍රදර්ශණය, මද්‍යසාර, වර්දනය, විස්වය

(10) ඇලපිල්ල, ගයනුකිත්ත, ඇදය, රකාරාංශය පිළිවෙළින් යෙදුණු පද පේළිය තෝරන්න.

(1) පාපිෂ්ඨ, මෞර්ය, ප්‍රසිද්ධ, බැතිබර  (2) ගෞරවය, සහායක, ආක්‍රමණය, රැහැන

(3) කාර්යය, ඖෂධ, පැහැය, අක්‍රමවත්  (4) ආස්‍රව, පාෂාණ, කෞශල්‍ය, වැරදි

(11) ඉරි ඇදි පදවල ක්‍රියා වර්ගය තෝරන්න.

නීල ගොයම **කිරිවැදිලා** - රන් අස්වනු නෙලන දාට

නගෝ අපට ඇඹුල අරං - වෙලට **වරෙන්නේ**

(1) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා  (2) මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා

(3) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා  (4) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා

✳ **නිවැරදි පිළිතුර තෝරන්න.**

(12) දාගැබක් වටා ඇති පිට මළුව මෙම නමින් හඳුන්වනු ලබයි.

(1) හත්ථිපාකාර  (2) පුප්ඵාධාන

(3) වාලිකංගණ  (4) පාදෝනි

(13) මොනරාගල ප්‍රදේශයෙහි ''පැපොල් හෙවත් ගස්ලබු'' හඳුන්වනු ලබන්නේ,

(1) අඹ  (2) පුහුල්

(3) වට්ටක්කා  (4) කිරිඅල

✳ **14 සිට 17 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(14) **සින්ධූපමාන** වැව් තලාමතින් ඇදී

පද්ම රේණුයෙන් සුගන්ධ වී

(1) මිහිකත හා සමාන  (2) ක්ෂිතිජය හා සමාන

(3) සාගරය හා සමාන  (4) ජලය හා සමාන

(15) හෙළ කලා සාහිත්‍ය පෝෂණය කිරීමෙහි ලා **චිරන්තන** ගද්‍ය - පද්‍ය සාහිත්‍යයෙන් සුවිශේෂී මෙහෙවරක් ඉටු විය.

(1) නූතන  (2) අද්‍යතන

(3) පුරාතන  (4) වර්තමාන

(16) නංගී උසස් ලෙස විභාගය සමත් බව ඇසූ අම්මා **ප්‍රහර්ෂයෙන්** ඇය සිප වැළඳ ගත්තා ය.

(1) හඬමින්  (2) අධික සන්තෝෂයෙන්

(3) සිනාසෙමින්  (4) පුදුමයෙන්

(17) විශිෂ්ට සාහිත්‍ය කෘති බිහිකිරීමේ ලා නිර්මාණකරුවා තුළ මනා වූ **හසළත්වයක්** තිබිය යුතු ය.

(1) මැනවින් පුරුදු පුහුණු බව  (2) වාක්කෝෂය

(3) ප්‍රතිභා පූර්ණ බව  (4) ධ්වනිපූර්ණ බව

(18) ''අර්ධස්වර'' නමින් හඳුන්වන අක්ෂර කාණ්ඩය මින් කුමක් ද?

(1) ග, ජ, ඩ, ද  (2) ශ, ෂ, ස, හ

(3) ය, ර, ල, ව  (4) ක, ච, ට, ත

(19) දත්වල ස්පර්ශයෙන් උපදින ශබ්ද හඳුන්වන නාමය කුමක් ද?

(1) ඕෂ්ඨජ  (2) මූර්ධජ

(3) කණ්ඨජ  (4) දන්තජ

(20) මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදයක් ඇතුළත් වර්ණය තෝරන්න.

(1) මධුර - මියුරු, ප්‍රණීත, කන්කලු, මාධුර්යය

(2) මහත් - විපුල, තුමුල, නැබළ, විසල්

(3) අධම - අවමාන, උත්තම, නිගරු, පරිභව

(4) පර - අන්‍ය, මෙරමා, අනුන්, අනෙක්

(21) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොයෙදෙන පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) රජ - භූපති, භූපල්, නිරිඳු, නරපති
(2) පොළොව - ධරණී, මිහි, භූමිය, දෙරණ
(3) නෙළුම් - කමල, උපුල්, තඹුරු, සියපත්
(4) අහස - ගගන, ගුවන, අඹර, නුබ

(22) යුගල පදයක් නොවන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) හරකාබාන, වතු පිටි, ණය තුරුස්, අඩුපාඩු
(2) මිල මුදල්, ගොඩ මඩ, පාරිසරික, ඇඳුම් පැළඳුම්
(3) විහිළුතහළු, ඉඳුම් හිටුම්, රටතොට, අස්සක් මුල්ලක්
(4) හුරු පුරුදු, අනම්මනම්, සටකපට, උදව් උපකාර

✳ **23 සිට 25 තෙක් ප්‍රස්තා පිරුළු සඳහා වඩාත් ගැළපෙන අදහස ඇති වරණය තෝරන්න.**

(23) නිෂ්ඵල දෙයක් කිරීම.
(1) අතු කඩා මොර කන්නා සේ.
(2) දියකාවාගේ පිටේ ලුණු හැංගුවා වගේ.
(3) සෙක්කුවේ බැන්ද හරකා වගේ.
(4) කළුවා මාරපන ගියා වගේ.

(24) කරදරයකින් තවත් කරදරයක වැටීම.
(1) කබලෙන් ලිපට වැටුණා වගේ.
(2) වඳින්න ගිය දේවාලය ඉහේ කඩා වැටුණා වගේ.
(3) හිසරදයට කොට්ටෙ මාරු කරන්නා වගේ.
(4) බොරදියේ මාලු බානවා වගේ.

(25) ''උෟරො කවදද කහ කැවෙ'' මෙම පිරුළ යෙදෙන අවස්ථා වන්නේ,
(1) අරමුණකින් තොරව වැඩ කිරීම.
(2) අධමයන්ට උතුම් දෙයක් පලක් නැති බව
(3) අගයක් නොමැතිවීම.
(4) පිළිකුලෙන් හෝ නොසැලකිල්ලෙන් සැලකීම.

(26) උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් ඇතුළත් පද පේළිය තෝරන්න.
(1) අයෙක්, දුවණියෝ, පුතෙක්, මිනිසෙකු
(2) මාර්ටින් වික්‍රමසිංහ සූරීහු, මම, ඇතැමුන්, අප
(3) දූරියක, පාලකයෝ, ගෙම්බෙකු, රීතීන්
(4) මුවෝ, ගැහැනියක, ගවයෝ, මාධ්‍යවේදීහු

✳ **ඉරි ඇඳි පදවලට අදාළ නිවැරදි ඡත්‍ර පදය තෝරන්න.**

(27) යුද්ධයෙන් විනාශ වූ පළාත් යළි <u>**නගා සිටුවීම**</u> රජයේ ප්‍රමුඛ අරමුණකි.
(1) ප්‍රතිසංස්කරණය
(2) පුනරුක්තිය
(3) පුනරුත්ථාපනය
(4) ප්‍රතිසංවර්ධනය

(28) කිසියම් දෙයක් පිළිබඳ <u>**හොඳින් සොයා බැලීම**</u> විද්‍යාර්ථීන්ගේ කාර්යයි.
(1) පර්යේෂණය
(2) පරීක්ෂණය
(3) ගවේෂණය
(4) නිරීක්ෂණය

(29) ''මං එන <u>තුරු</u> ඉඳිකඩ ළඟ ඉන්නවාද අම්මේ''
මෙහි ඉරි ඇඳි පදය
(1) නාම පද
(2) නිපාත පද
(3) ක්‍රියා පද
(4) උක්ත පද

(30) ''පසුදින රාත්‍රිය ද සඳ එළියෙන් ඉතාම ප්‍රසන්න විය. සෑම තැන්හි පැතිර, ඉතිර ගිය සඳ කැලුම් නිසා සීතාවක සඳ ලොවින් ගෙනා සඳ කඩක් මෙන් රිදී පැහැයෙන් බබළන්නට විය.''
මෙම ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය වන්නේ,
(1) විජයබා කොල්ලය
(2) සුනේත්‍රා
(3) සඳා මෙලෙස පුර දෙරණේ
(4) සක්වාලිහිණි

(31) ''ඇස් දල්වා කට දල්වා
නිශ්ශබ්දව බලා සිටියෙ
යකඩ කදන් උස්සාලා මේ- නගරය ගොඩ නැගුවේ
නුඹේ තාත්තා නිසා ය.
මෙම පද්‍ය නිර්මාණය කරන ලද්දේ
(1) ඇස්. මහින්ද හිමි
(2) මහගමසේකර
(3) පරාක්‍රම කොඩිතුවක්කු
(4) ඩබ්. ඒ. අබේසිංහ

✳ **32 සිට 35 දක්වා ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.**

(32) (1) තාරාවෝ අහසෙහි දීප්තිමත්ව බබළයි. (2) ඔවුහු මහන්සි වී පාර සැදුවේ ය.
(3) අපි අධ්‍යාපන චාරිකාවක් යාමට තීරණය කළෙමු. (4) සියොත් කැල මිහිරි ගී ගයයි.

(33) (1) තුරු පෙළ සුළඟට සෙලවෙයි. (2) මිනිස්සු වන සතුන් දඩයම් කරයි.
(3) එක් අයෙක් තරග බිමෙන් ඉවත් වූහ. (4) ඔහුත් මමත් චාරිකාවට සහභාගි වන්නෙමි.

(34) (1) මැණියෝ දරුවන් තනන්නීය. (2) හිරු කිරණින් පියුම්හු විකසිත වෙති.
(3) නුඹලා මෙවර විභාගයෙන් සමත් වූවෙහි. (4) අහස් යානය ඉහළ අහසේ වේගයෙන් පියාසර කරති.

(35) (1) මා උනන්දුවෙන් විභාගය ජය ගත්තෙමි. (2) මාර්ටින් වික්‍රමසිංහ සූරීහු මඩොල්දූව රචනා කළහ.
(3) සිසුහු පන්තියට පැමිණ නැත. (4) වෙළෙන්දෙකු අඩු මිලට බඩු විකුණති.

(36) දේශකයා වේදිකාවට <u>නැඟ</u> ආපසු <u>බසිද්දී</u> ''ඔබට <u>ජය වේවායි</u>'' මිනිස්සු <u>සුබ පතමින්</u> විසිර ගියහ.
මෙහි ඇතුළත් ක්‍රියා වර්ගයෙහි නිවැරදි පිළිවෙළ වන්නේ,
(1) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා
(3) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා
(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා

(37) නිවැරදි නාම ප්‍රකෘතිය වන්නේ,
(1) ගැහැනිය + ආ (2) කුමර + ආ
(3) මිනිසා + ආ (4) මුවා + ආ

(38) ''අර මිනිස්සුන්ටත් වතුර තිබහ ඇති තේ ටිකක් දුන්නොත් නරක ද?''
මෙම ගද්‍ය කොටස ඇතුළත් කෙටි කතාව වන්නේ,
(1) කරුමක්කාරයෝ (2) අපටත් වැසිකිළියක්
(3) මං තනන්නෝ (4) තොරොක්කෝව

✳ **39 සිට 40 ප්‍රශ්න සඳහා දී ඇති වාක්‍යයේ අර්ථයට වඩාත් සමීප අර්ථය සහිත වාක්‍යය තෝරන්න.**

(39) අධ්‍යාපනයේ සංවර්ධනය වෙනුවෙන් රජය අතිවිශාල මුදලක් වැය කළ ද එයින් සාර්ථක ඵල නෙලා ගැනීමට බොහෝ දෙනෙකු අපොහොසත් වී ඇත.
(1) රජය අති විශාල මුදලක් අධ්‍යාපනයට වැය කර කිහිපදෙනෙකුට ප්‍රතිලාභ දී ඇත.
(2) අධ්‍යාපනය සාර්ථක වීමට නම් රජය සියලු දෙනාගේම අධ්‍යාපනයට සමානව මුදල් වැය කළ යුතු ය.
(3) අධ්‍යාපනය සඳහා රජය විසින් මුදලක් වැය කළ ද ඉන් බොහෝ දෙනෙකු ඵල ලබාගෙන නොමැත.
(4) අධ්‍යාපනය සඳහා සුළු මුදල් රජයෙන් වෙන් කිරීම ප්‍රමාණවත් ය.

(40) දරුවන්ගේ අධ්‍යාපන කටයුතුවල ගුණාත්මක වර්ධනය සඳහා විෂය සමගාමී මෙන් ම බාහිර ක්‍රියාකාරකම් ද එක සේ වැදගත් බව අධ්‍යාපන විශේෂඥයන්ගේ මතයයි.
(1) අධ්‍යාපන විශේෂඥයින් පවසන්නේ අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයට විෂය සමගාමී මෙන් ම විෂය බාහිර ක්‍රියාකාරකම් ද එක සේ වැදගත් වන බවයි.
(2) විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් වැදගත් වන්නේ දරුවන්ගේ ගුණාත්මක වර්ධනයට පමණි.
(3) අධ්‍යාපන විශේෂඥයන් සිසුන්ගේ අධ්‍යාපන කටයුතුවල ගුණාත්මක වර්ධනය කෙරෙහි සැලකිලිමත් වේ.
(4) පාසල්වල ගුණාත්මක අධ්‍යාපන සංවර්ධනය සඳහා විෂය සමගාමී මෙන් ම විෂය බාහිර ක්‍රියාකාරකම් රැසක් ක්‍රියාත්මක කළ යුතු ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

21 S II

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019

## First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : .......................................... සිංහල භාෂාව හා සාහිත්‍යය - II කාලය : පැය 02යි.

වැදගත් :

✳ සියලු ම අනු කොටස්වලට පිළිතුරු සපයන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ.

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට පිළිතුරු සපයන්න. නොලියන කොටස් ඇත්නම් එහි අංකය ලියා ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ මහාප්‍රාණ අක්ෂර දෙකක් හා මූර්ධජ අක්ෂර දෙකක් ලියන්න.

(ii) සිංහල අක්ෂර මාලාවේ ඇති ඌෂ්මාක්ෂර හතරක් ලියන්න.

(iii) මොනරාගල ප්‍රදේශයේ භාවිතාවන පහත සඳහන් පද සඳහා පොදු ජන වහර ලියන්න.

(අ) ඉඟුරු කරල් - (ආ) පොල් ඔයනවා -

(iv) පහත දැක්වෙන නාම පදවල ප්‍රකෘති වෙන් කොට දක්වන්න.

(අ) සිංහයා - (ආ) පහන -

(v) පහත දැක්වෙන (අ) සහ (ආ) යෙදුම්වල පළමුවන වචනය සමග දෙවැනි වචනයේ නොගැළපීමක් ඇත. වඩාත් ගැළපෙන සේ පළමු වචනය හෝ දෙවෙනි වචනය හෝ වෙනස් කර ලියන්න.

(අ) ශ්වේත කුඩය (ආ) පටිමාගෙය

(vi) පහත සඳහන් වාක්‍යවල යටින් ඉරි ඇඳි පද කුමන ක්‍රියා වර්ගයට අයත් දැයි ලියා දක්වන්න.

(අ) උදෑසන කුකුළන් <u>හඬලද්දී</u> අපි ගමන පිටත් වීමු.

(ආ) ගුරුවරයා ශිෂ්‍යයා ලවා අකුරු <u>ලියවයි.</u>

(vii) පහත සඳහන් ඉඟිවැකි මගින් පළවන අර්ථය ලියා දක්වන්න.

(අ) අබමල් රේණුවක්වත් (ආ) අං ඇවිල්ලා

(viii) පහත සඳහන් පද සඳහා විරුද්ධාර්ථවත් පදය බැගින් ලියන්න.

(අ) ආරක්ෂිත - (ආ) ජංගම -

(ix) පහත සඳහන් අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(අ) අවස්ථාවක් ලැබුණු විට ප්‍රයෝජන ගැනීම.

(ආ) උදව් කළ අය අමතක කර වෙනත් අය පැසසීම.

(x) නිවැරදි පදය වරහන් තුළින් තෝරා හිස්තැන් පුරවන්න.

මග සලකුණු නොසලකා ......................... ගිය පිරිස බොරු ........................... ගැන නොදැන එහි වැටී තුවාල වූහ.

(වළ / වල) (ලකුණු 2x10=20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන විස්තර ඇසුරෙන් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න. (ලකුණු 25)

(අ) පරිසරය සුන්දර ව හා පිරිසිදුව තබා ගන්නට අප වෙහෙසෙන විට පරිසරය ද අප නිරෝගීව තබන්නට වෙහෙසෙයි. අප විසින් පරිසරයට මුදා හරින අපද්‍රව්‍ය නිසා අහිංසක සතුන් මරණයට පත්වන්නේ ඛේදනීය ආකාරයට ය. එබැවින් අද ජීවත්වන සතුන් අනාගතයේ වඳවීයාමට ඇති ඉඩකඩ බොහෝ ය. පරිසරය රකිමින් සතුන්ගේ ජීවිතය රැක ගැනීම අපගේ යුතුකම වන්නේ ය.

(ආ) රූපවාහිනිය හා පරිගණකය බොහෝ තොරතුරු ලබා ගත හැකි මාධ්‍යය බවට පත් වී ඇත. බොහෝ දරුවන් නාට්‍ය හා කාටූන්වලින් පරිගණක ක්‍රීඩාවලට නැඹුරුවීම නිසා ඔවුහු රූපවාහිනියෙන් සහ පරිගණකයෙන් නිසි ඵල ප්‍රයෝජන නොගනිති. අධ්‍යාපන කටයුතු ප්‍රවර්ධනය සඳහා යොදා ගත හැකි ප්‍රධාන මෙවලම් ලෙස මෙම උපකරණ භාවිත කිරීම අත්‍යවශ්‍ය ය.

(ඉ) ශ්‍රී ලංකාව දීර්ඝ ඉතිහාසයකට උරුමකම් කියන රටකි. විවිධ සංස්කෘතික දායාදයන්ගෙන් අපේ අනන්‍යතාව ලෝකයාට හෙළි කර තිබේ. අනුරාධපුර, පොළොන්නරුව, දඹදෙණිය ඇතුළු පැරණි රාජධානිවල ඇති නටබුන්වලින් අපේ පැරණි තාක්ෂණික ඥානය පිළිබිඹු වේ. පැරණි සංස්කෘත හර පද්ධතීන්ගෙන් අපගේ අතීත හැදියාව සදාචාර ගුණ පිළිබිඹු වේ. එහෙත් අපේ රට උවමනාවටත් වඩා බාහිර ලෝකයාට සම්බන්ධ වීමෙන් අපගේ පැරණි උරුමයන් විනාශ වෙමින් පවතී.

(ඊ) ශ්‍රමාභිමානය රටකට අත්‍යවශ්‍ය අංගයකි. අද අධ්‍යාපනය ලබන බොහෝ දරුවන් තුළ නැත්තේ ද එයයි. ශ්‍රම අභිමානය පිළිබඳව හැඟීමක් බොහෝ දරුවන් තුළ නොමැති බව පෙනේ. විවිධ රැකියා සඳහා නගරයට එන තරුණ තරුණියන්ගේ වතු පිටි, කුඹුරු පාළු වී තිබේ. නගරයේ සුළු රැකියාවකට වඩා ගොවිතැන සැලසුම් සහගතව කළේ නම් මීට වඩා ආදායමක් ලබා ගත හැකි ව තිබිණි.

(03) පහත දැක්වෙන පාඨය වචන 20 - 30 අතර වනසේ සාරාංශ කොට ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

රටක යම් සාහිත්‍යයක් දියුණු වන්නේ නිදහසේ සිතන්නට පතන්නට පුරුදු වුණු, දුක් කරදරවලින් තොර, බුද්ධිමත් සමාජයක් ඇති වූ විට ය. රට යුද්ධ කෝලාහලවලින් හා දුර්භික්ෂවලින් ද දේශපාලන අස්ථාවරවලින් මහජනයාට හිරිහැර බාධක ඇති වීමේ දී උසස් සාහිත්‍යාංග බිහි නොවේ. රට ආහාර අතින් ස්වයංපෝෂිත වීමට ද සමාදානයෙන් හා සමගියෙන් යුක්තව ජීවත්වීමට රට වැසියන්ට අවස්ථාව ලැබීම ද ජනතාව තුළ නව සිතුම් පැතුම් වර්ධනය වීමට ද හේතු වෙයි. බුද්ධිමත් සාහිත්‍යකරණයකට පිවිසෙනුයේ එවිටය. (ලකුණු 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ඉන්දියාවේ මෙන් ම ඉපැරණි ලංකාවේ ඉතා ම පැරණි දේශීය කාසි වර්ගය වූයේ ''පුරාණ'' නැමැති කාසියයි. ග්‍රේන් 56ක බරක් තිබුණ, සෘජු කෝණාස්‍රාකාර රිදී කැබැල්ලක් වූ මෙහි දෙපැත්තේම නොයෙක් ලකුණු ඔබ්බවා තිබුණේ ය. රජුගේ අවසරය අනුව වෙළඳ ශ්‍රේණි නිකුත් කරන්නට ඇත. සංස්කෘත භාෂාවෙන් කාර්ෂාපණ ලෙස ද පාලියෙහි කහාපණ යනුවෙන් ද මේ කාසි සඳහන් වේ. පසුකල මේ වර්ගයේ කාසි වටකුරු විය. මේවා ක්‍රි. ව. දෙවන ශත වර්ෂය දක්වා භාවිත විය. ලංකාවේ සොයා ගනු ලැබූ මේ වර්ගයේ කාසි උතුරු ඉන්දියාවෙන් ගෙන්වන ලදැයි සිතිය හැකි ය. එහෙත් සංකේත පිළියෙළ කර තිබෙන ආකාරයෙන් පෙනෙන්නේ සමහර කාසි ලංකාවේ සාදන ලද බව ය.

සලකුණු ඔබ්බවා තිබෙන කාසි ළඟට ඇති වූයේ මුද්‍රා සහිත කාසිය. කලින් කල කාසි තුළ ඔබ්බවනු ලැබූ සලකුණු මෙහිදී ඒකාබද්ධ කරන ලදි. මුලදී මුද්‍රා තබන ලද්දේ එක් පැත්තක පමණය. යටිපැත්ත හිස්ව තිබුණේ ය. නැතහොත් ලකුණ ඔබ්බවා තිබුණේ ය.

(i) ''පුරාණ'' නම් කාසි වර්ගය නිකුත් කරන ලද්දේ කවුරුන් දැයි මෙහි අනුමාන කර ඇති ද?

(ii) මුද්‍රා කාසි ඊට පෙර පැවැති කාසි වර්ගයට දක්වන සම්බන්ධය කවරේ ද?

(iii) ''පුරාණ'' නැමැති කාසියේ අංග ලක්ෂණ කවරේ ද?

(iv) ''පුරාණ'' කාසි වර්ගය හැඳින්වීමට මෙහි යෙදී ඇති පර්යාය වචන ලියන්න.

(v) ''කහාපණ'' භාවිත වූ කාලවකවානුව ලියන්න. (ලකුණු 2x5=10)

(05) ස්වයං රැකියාවල නියුතුවීමට කැමැත්තක් දක්වන තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු බව සොඳුරුගම යෞවන සමාජයේ මාසික රැස්වීමේදී තීරණය කෙරිණි. එම යෞවන සමාජයේ ලේකම් රනිල් මල්ලවආරච්චි ඔබ යැයි සිතා එවැනි පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සිදුවන ප්‍රයෝජන ද සඳහන් කරමින් ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමට අවසර ඉල්ලා ඔබ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට සුදුසු ලිපිය ලියන්න. (මේ සඳහා වචන 100 පමණ සෑහේ.)

(ලකුණු 15)

නැතහොත්

ඔබ විද්‍යාලයේ 2019 ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවය 2019.02.02 වන දින පැවැත්වීමට සංවිධානය කර ඇති අතර එම අවස්ථාවේ දී ''අනාගත නායකයා'' යන මැයෙන් විශේෂ දේශනයක් පොලිස් අධිකාරි ජයන්ත වික්‍රමනායක මහතා විසින් පැවැත්වීමට නියමිතය. සෞන්දර්ය අංශයේ විශේෂාංග ද ඇතුළත් ඉහත වැඩසටහන සඳහා න්‍යාය පත්‍රය සකස් කරන්න. (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

21 S III

# පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2019
# First Term Test - Grade 10 - 2019

නම/විභාග අංකය : .......................................... සිංහල භාෂාව හා සාහිත්‍යය - III කාලය : පැය 02යි.

වැදගත් :

❋ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
❋ 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
❋ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු සංඛ්‍යාව ලකුණු 80කි.

(01) (i) සිට (x) තෙක් සියලුම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න.
කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලියවුණු සියවස කුමක් ද?
(ආ) එම කෘතියට මූලාශ්‍ර වූ ග්‍රන්ථය කුමක් ද?

(ii) (අ) ගුත්තිල කාව්‍ය කෘතිය කුමන සාහිත්‍ය යුගය නම් කරන්න.
(ආ) ගුත්තිල කාව්‍යයේ ඇතුළත් පද්‍ය ගණන කීය ද?

(iii) (අ) පන්සිය පනස් ජාතක පොත ලිවීමට අනුග්‍රහය දැක් වූ අමාත්‍යවරයා කවුරුන් ද?
(ආ) එම පොතෙහි සැබැවින් ම ඇතුළත් කතා ගණන කොපමණ ද?

(iv) ''අද පණ්ඩිතයන් වහන්සේට කිය යුතු කිසිවක් අසමි.''
(අ) මේ කාගේ සිතිවිල්ලක් ද?
(ආ) මෙහි සඳහන් පණ්ඩිතයන් කවුරුන් ද?

(v) කැර මිණි බරණ රැස්
රසින් සුර සැව් සුවහස්
....................................................
....................................................
අ) ඉහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
(ආ) මෙම කවිය ඇතුළත් කෘතියේ කතුවරයා කවුරුන් ද?

(vi) (අ) මූසිල නම් ගාන්ධර්වයා වීණා ශිල්පය හැදෑරීමට පැමිණි නගරය කුමක් ද?
(ආ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කළේ කවුරුන්ද?

(vii) (අ) ජාතක කතා ආකෘතියේ එක් අංගයක් නම් කරන්න.
(ආ) මෙම කෘතිය ලියවෙන යුගයේ විසූ රජතුමා කවුරුන් ද?

(viii) ''පුත'' මේ යුක්තිය සලකා පියා කියව.''
(අ) මේ ප්‍රකාශය කරන්නේ කවුරුන් ද?
(ආ) මෙහි පුත යනුවෙන් ඇමතුම් ලැබුයේ කවුරුන් ද?

(ix) (අ) ගුත්තිල කාව්‍ය කතුහිමියන්ගේ ගුරුවරයා කවුරුන්ද?
(ආ) ගුත්තිල කාව්‍ය ආරම්භ කර ඇත්තේ කුමන ගණයෙන් ද?

(x) (අ) ජාතක කතා ඇසුරින් රචිත ගී කාව්‍යයක් ලියන්න.
(ආ) ජාතක කතා ඇසුරින් රචිත සිව් පද කාව්‍ය ග්‍රන්ථයක් නම් කරන්න. (ලකුණු 2X10=20යි)

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ගුත්තිල මහ <u>සිපී</u>
සක්දෙව් බසින් <u>සැතපී</u>
මින් දිනමැයි දැපී
බමර තත පළමුවෙන් සිඳපී
(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න.

(ii) මනුෂ්‍යයෝ <u>ඔල්වර හඬ</u> දෙන්නාහු, අත්පොළසන් දෙන්නාහු, පනන්නාහු, වටලා ගතුම්හ'' යන <u>**සමාධියෙන්**</u> නටමින්, ගර්ජනා කරමින් සිටගත්හ.
(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න.

(iii) <u>පටන්</u> සුරිඳු දුන් උපදෙස් සිහිකොට
<u>ඉටන්</u> බෙලෙන් දුමුවෙන් ගුලි අහසට
.........................................................................
.........................................................................
(අ) ඉහත කවි පදවල ඉරිඇඳි වචනවල අර්ථය ලියන්න.
(ආ) කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.

(iv) <u>**අභිමතාර්ථසාධක**</u> <u>වූ</u> <u>**චිත්තා මාණික්‍යයක්**</u> බඳු වූ මාගේ බෝධි සත්වයන් වහන්සේගේ තේජසින් ම පස් මිටක්වත් කැටක්වත් නුවර දිසාවට දමන්නා තබා සිතිනුත් සිතු එක ද සත්වයෙක් නැත්තේ ය.
(අ) ඉරි ඇඳි ඇති පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත විස්තර වන අවස්ථාව කෙටියෙන් ලියන්න.

(v) නොදනම තමා බල
සබයට අවුත් නොපැකිල
වැඳ රද පද කමල
දෙසක මූසිලයා ද උන් කල
(අ) මෙම කවියේ ඇතුළත් රූපකය ලියන්න.
(ආ) පසුව මුළු කවියේ ම අදහස ලියන්න. (ලකුණු 4X5=20යි)

(03) (i) පරාර්ථකාමී බවත්
(ii) ප්‍රඥාවන්ත බවත්
මහෞෂධ චරිතයේ කැපී පෙනෙන චරිත ලක්ෂණ වේ. උම්මග්ග ජාතකයේ නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න.
**නැතහොත්**
(i) අර්ථ රසයත්
(ii) ශබ්ද රසයත්
යන කරුණු දෙකින් ම පරිපූර්ණ වූ නිර්මාණයක් ලෙස ගුත්තිල කාව්‍ය හැඳින්විය හැකි ය. ගුත්තිල වෙණ නද පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් මේ කියමන විස්තර කරන්න.
(ලකුණු 15යි)

(04) කේවට්ට චරිතයේ හා මහෞෂධ චරිතයේ
(i) සමාන ලක්ෂණයත්
(ii) අසමාන ලක්ෂණයත්
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් සතර කන්මන්ත්‍රණය පාඩම ඇසුරින් පැහැදිලි කරන්න.
**නැතහොත්,**
(i) සරල භාෂා භාවිතයත්
(ii) සජීවී අවස්ථා නිරූපණයක් මගින් පාඨක සිත් දිනා ගැනීමට ගුත්තිල කාව්‍ය කතුවරයා සමත් වී ඇත. නියමිත පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ 2 බැගින් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න. (ලකුණු 15යි)

✳ **අංක 5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

(05) හාස්‍ය හා උපහාසය මුසුව කිසියම් අවස්ථාවක් සිත් කාවදින ලෙස ඉදිරිපත් කර තිබීම උම්මග්ග ජාතකයේ කැපී පෙනෙන ලක්ෂණයකි. සතර කන් මන්ත්‍රණය පාඩමින් උදාහරණ 03ක් ගෙන මේ කියමන විමසන්න. (ලකුණු 10යි)

(06) වෑත්තෑවේ හිමියන්ගේ විශිෂ්ට කාව්‍ය ප්‍රතිභාව නියමිත කොටසින් උදාහරණ 03ක් මගින් පැහැදිලි කරන්න.
(ලකුණු 10යි)

(07) මහෞෂධ පඬිඳුන්ගේ උපායශීලීත්වය වෛදේහ රාජ්‍යයට ආරක්ෂාව සැලසූ ආකාරය උදාහරණ තුනක් යොදා ගෙන සතර කන්මන්ත්‍රණය පාඩම ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# Provincial Department of Education - NWP

21 | S | I

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : ...................................... සිංහල භාෂාව හා සාහිත්‍යය- I කාලය : පැය 01 යි.

වැදගත් :

✳ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40කි.

✳ 1 සිට 40 තෙක් ප්‍රශ්න සඳහා දී ඇති 1, 2, 3, 4 වරණවලින් නිවැරදි පිළිතුර තෝරා පිළිතුරු පත්‍රයෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

✳ **අංක 01 සිට 04 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරෙන් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන උත්තරය තෝරන්න.**

(01) ඇය විභාග ප්‍රතිඵල එනතුරු **ඇඟිලි ගනිමින්** සිටියි.
(1) දින ගණන් කරමින් (2) ඇඟිලි ගණන් කරමින්
(3) බලාපොරොත්තුවෙන් (4) කල්පනා කරමින්

(02) දරිද්‍රතාවයෙන් හා දුඩි අපහසුතාවයන්ගෙන් යුක්ත සිසුනට **අතදීම** හොඳ පුරුද්දකි.
(1) මිල මුදල් දීම (2) ප්‍රශංසා කිරීම
(3) උදවු කිරීම (4) අතිනත ගැනීම

(03) ඔහු නිතරම **අල්ලේ පැළවෙන බොරු** කියන තැනැත්තෙක් බවට පත් විය.
(1) තවත් කෙනකු රවටන බොරු බස් (2) කිසිවෙකුට විශ්වාස කළ නොහැකි දේ
(3) පුහුණු කෙනෙකු රවටන බොරු බස් (4) ඇදහිය නොහැකි තරම් දේවල්

(04) ඔහු කෙතරම් ඇනුම් පද කිව්ව ද සීතා **කරබාගෙන** සිටියා ය.
(1) හිස නමාගෙන (2) අත් පහළට නංවාගෙන
(3) නිහඬව (4) විනීත ලෙස

✳ **අංක 05 සිට 08 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(05) සංඝමිත්තා මෙහෙණින් වහන්සේ සමඟ සපිරිවරින් පැමිණි උගත්තු, ශිල්පීහු අප රට සංවර්ධන ......................... බවට පත් කළහ.
(1) ඒකකයක් (2) කේන්ද්‍රස්ථානයක් (3) මධ්‍යස්ථානයක් (4) ව්‍යාපාරයක්

(06) බාලාංශයේ පටන් විශ්ව විද්‍යාලය දක්වා නොමිලයේ ලබාදෙන අධ්‍යාපන ක්‍රමයක් මෙරට ......................... කිරීමේ පුරෝගාමියා වූයේ සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමා ය.
(1) සංවර්ධනය (2) ප්‍රතිනිර්මාණය (3) ස්ථාපනය (4) නිර්මාණය

(07) කාව්‍යය සඳහා යොදා ගන්නා කියමන් .................................... ලෙස හඳුන්වනු ලබයි.
(1) ධ්වනිපූර්ණ භාෂා (2) කාව්‍යෝක්ති (3) පරිකල්පනය (4) අවස්ථෝචිත යෙදුම්

(08) විශිෂ්ට ගණයේ කවියක් නිර්මාණය කරලීම සඳහා නිරන්තරයෙන් පුහුණු වීම හෙවත් .................................... අවශ්‍ය වේ.
(1) සතතාභ්‍යාසය (2) ප්‍රතිභාව (3) පරිකල්පනය (4) පරිශීලනය

(09) අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පේළිය තෝරන්න.
(1) නවීන්, ෂාරුක්, සාගර, කවීන් (2) ගම්පෙරළිය, කලියුගය, යුගාන්තය, මීනා
(3) අනුරාධපුරය, කුරුණෑගල, කෑගල්ල, රත්නපුරය (4) කළු, කැළණි, මහවැලි, වලවේ

(10) සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) විශ්වය, ආස්වාදය, විස්මයාවහ, විවිධාංගීකරනය (2) විශිෂ්ට, ශ්‍රේෂ්ඨ, කනිෂ්ඨ, උච්චාරණය
(3) ශිෂ්ඨාචාරය, වැලපීම, ජෝෂ්ඨ, ප්‍රගමනය (4) බහ්වර්ත, සැලසුම අන්තස්ථාක්ෂර, නීත්‍යනුකූල

(11) පළාත්වල, මාතෘකාව, ඔරුව අනූන යන වචනවල දෙවෙනි අකුරෙහි අන්තර්ගත පිල්ලම අනුපිළිවෙළින් දැක්වෙන වරණය වන්නේ,
   (1) ඇදය, ගැටය සහිත ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල
   (2) ඇලපිල්ල, ගැටය සහිත ඇලපිල්ල, කෙටි ඇදය, දීර්ඝ පාපිල්ල
   (3) ඇලපිල්ල, ගයනු කිත්ත, ඇදය, දීර්ඝ පාපිල්ල
   (4) ඇලපිල්ල, ගැටය සහිත ඇලපිල්ල, කෙටි පාපිල්ල, දීර්ඝ පාපිල්ල

(12) බොද්දී යන ක්‍රියා පදය අයත් ක්‍රියා වර්ගය වන්නේ,
   (1) මිශ්‍ර ක්‍රියා (2) අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා
   (3) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා (4) ප්‍රයෝජ්‍ය ක්‍රියා

(13) මොනරාගල ප්‍රදේශයේ''වහින්ටත් වපුරව්වා'' යනුවෙන් අදහස් කරන්නේ,
   (1) වැස්ස වහිද්දී වපුරන්නේ නෑ ලෙස ය. (2) 'වහින්ඩ වපුරනවා' යන්න ය.
   (3) වැස්ස වහිද්දීත් වැපිරූ බවකි. (4) වැස්ස වහින්නේ නැති දිනක වී වපුරන බව ය.

(14) ප්‍රාදේශික ව්‍යවහාර අනුව නිවැරදි ව පද සම්බන්ධ කර ඇති වරණය තෝරන්න.

A - සමනලයා E - වට්ටක්කා
B - පුහුල් F - කිරි අල
C - අඹ G - කුරුල්ලා
D - කොකිස් H - ගස්ලබු

   (1) AG, BF, CH, DE (2) AG, BE, CH, DF
   (3) AE, BF, CE, DH (4) AG, BH, CE, DF

✳ **අංක 15 සිට 17 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.**

(15) **පුරාණ කාලයට අයත්** සාහිත්‍ය නිර්මාණ හෙළ කලාකරුවන්ගේ නිර්මාණ ශක්තිය මොනවට කියා පායි.
   (1) නූතන (2) චිරන්තන (3) තත්කාලීන (4) ප්‍රාග්ඓතිහාසික

(16) ඔහුගේ නිර්මාණයන් තුළින් ඔහු භාෂාව **මැනවින් පුරුදු පුහුණු වූ බවක්** දක්නට ලැබුණි.
   (1) හසළත්වය (2) අවස්ථෝචිත (3) දක්ෂතාවය (4) නෛපුණත්වය

(17) සමහරු අනාථ දරුවන් කෙරෙහි **අනුකම්පා සහගත** දෘෂ්ටියක් දක්වති.
   (1) දායනුකම්පිත (2) සානුකම්පිත (3) ළයාන්විත (4) ශික්ෂාකාමී

(18) ත,ථ, ද, ධ, න යන අක්ෂර කාණ්ඩය අයත් වනුයේ,
   (1) මූර්ධජ අක්ෂර ගණයට (2) දන්තජ අක්ෂර ගණයට
   (3) නාසික්‍ය අක්ෂර ගණයට (4) ඌෂ්මාක්ෂර ගණයට

(19) A - ච, ජ, ඣ තාලුජ අක්ෂර වේ.
B - ය, ර, ල වර්ගාන්ත අක්ෂර වේ.
C - ඝ, ඡ, ඪ මහප්‍රාණ අක්ෂර වේ.
D - ශ, ෂ, ෆ අඝෝෂ ශබ්ද අක්ෂර වේ.
මේ ප්‍රකාශන අතරින් නිවැරදි යුගලය වනුයේ,
   (1) A හා D ය. (2) B හා C ය.
   (3) C හා D ය. (4) A හා B ය.

(20) එක් එක් පද පේළිවල දී ඇති පද යුගලවල සමානාර්ථවත් පද යුගලයක් ඇතුළත් **නොවන** පද පේළිය වනුයේ,
   (1) අටසාලිස් - හතළිස් අට, හිතෛෂීන් - හිතවතුන්, පර්ෂදය - පිරිස, අග්‍රභාගය - ප්‍රථම භාගය
   (2) තිර - ස්ථිර, දොස් දෝෂය, දෙස් - දේශය, අබියස - ඉදිරිපිට
   (3) කාරිය - කටයුත්ත, රුවන් මැණික්, දන්ත - දත්, ප්‍රයත්නය - උත්සාහය
   (4) කන්ද- පව්ව, මිදුල - මළුව, ප්‍රාකාරය - පවුර, ආකරය - ආකාරය

(21) විරුද්ධාර්ථවත් පද යුගලක් නොවන්නේ කුමක් ද?
   (1) වියත් - නොවියත් (2) අනුමාන - ප්‍රත්‍යක්ෂ
   (3) ලස් - අනලස් (4) දුගද - කුයිල

✳ **අංක 22 සිට 24 දක්වා ප්‍රස්තාව පිරුළු සඳහා වඩාත් ගැළපෙන අදහස ඇති වරණය තෝරන්න.**

(22) අතු කඩා මොර කන්නා සේ.
(1) අරමුණකින් තොරව වැඩ කිරීම.
(2) අය මාර්ගය මුළුමනින් ම විනාශ කර දැමීම.
(3) අතු කඩමින් අන් අයට දී මොර කෑවා වගේ.
(4) පොඩි දෙයක් විනාශ කර විශාල දෙයක් ආරක්ෂා කරලීම.

(23) පුංචි අම්මත් ඇවිත් කැවුම් පුංචි කළා වගේ.
(1) විශාල බලාපොරොත්තුවක් ඇතිව සිටිය ද ප්‍රතිඵල ඉතා කුඩා වීම.
(2) පුංචි අම්මා කැවුම් බදින විට කැවුම් පොඩි ව සෑදීම.
(3) ලැබීමට ඇති සම්පත් ඉතා සීමිත වීම.
(4) අවාසි සහගත යමක් සැලසුම් සහගතව කරලීම.

(24) කැලේට පායපු සඳ වගේ.
(1) බලාපොරොත්තු සහගත දෙයක් නොලැබීම.
(2) කැලයට සඳ පායන්නා වගේ
(3) කිසිදු වටිනාකමක් නොමැති වීම.
(4) මෝඩ මිනිසුන්ට උතුම් දෙයක ඵලක් නොමැති බව.

(25) වැරදි අදහස සහිත වාක්‍යය තෝරන්න.
(1) අක්ෂර මාලාවක් යනු සංකේත සමූහයකින් සැදුම් ලත් විශේෂ සටහනකි.
(2) තාලුජ අක්ෂර නමින් හඳුන්වනු ලබන්නේ දිවේ මැද කොටස තල්ල වෙත සමීප වන නිසා උපදින ශබ්ද වේ.
(3) 'ෆ' අක්ෂරය ඌෂ්මාකාරයට උදාහරණයක් වේ.
(4) පූර්ව ක්‍රියා පදයක් යනු වාක්‍යයක අවසාන ක්‍රියා පදයට පෙර කරන ලද යැයි සැළකෙන ක්‍රියා පදයකි.

(26) **මං තනන්නෝ** කෙටි කතාව රචනා කරන ලද්දේ,
(1) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.
(2) මහගමසේකර මහතා ය.
(3) මනෝ ප්‍රනාන්දු මහතා ය.
(4) ශ්‍රී රාජශේකර මහතා ය.

(27) **පරිපෝෂිත** යන්නෙන් අදහස් කෙරෙන්නේ,
(1) අංග සම්පූර්ණ වූ
(2) ඌන පෝෂණය වූ
(3) මනාව පෝෂණය වූ
(4) තවදුරටත් පෝෂණය කළ යුතු වූ

(28) පහත නාමපදවල ප්‍රකෘතිය නිවැරදිව දක්වා ඇති වරණය වනුයේ,
A - කන්ද - කඳු
B - ගිරවු - ගිරවා
C - යහපත - යහපත්
D - මිනිසා - මිනිස්සු
මින් නිවැරදි යුගලය වනුයේ,
(1) A හා B ය.
(2) B හා D ය.
(3) A හා C ය.
(4) D හා C ය.

(29) මිශ්‍ර ක්‍රියා පද පමණක් ඇති පේළිය කුමක් ද?
(1) කියමින්, කියා, බලද්දී, කපද්දී
(2) කප කපා, සිටවමින්, සිතුවොත්, බලවයි.
(3) නට නටා, ගයමින්, බලමින්, සොයමින්.
(4) කැපුවොත්, කිය කියා, ලියමින්, නටමින්

(30) උක්ත පද පමණක් යොදා ඇති පද පේළිය වනුයේ,
(1) සේවකයෙක්, දරුවන්, තා, තොප
(2) නුඹ, ඇය, තොපි, දූරියක
(3) රජවරු, මිත්තණියන්, මලණුවෝ, පියාණන් දෑ
(4) ගංගාවෝ, තෝ, නුඹ, සමහරෙක්

(31) මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් නොවන පදයක් සහිත උත්තරය තෝරන්න.
(1) උපසර්ග - ප, පර, අව, සිරි
(2) පූර්ව ක්‍රියා - කියා, නටා, ගයා, කපා
(3) ප්‍රත්‍ය - ඉක, මත්, වත්, අටි
(4) විධි ක්‍රියා - කරව, බලන්න, කපන්ඩ, දකිනු

(32) නිවරදි ඡත්‍ර (තනි) පදය තෝරන්න.
මුඛ පරම්පරාවෙන් පැවතෙන කථා
(1) මුඛ්‍යාර්ථ (2) කෙටිකථා
(3) ජනප්‍රවාද (4) කටකථා

(33) පහත සඳහන් ගී ඛණ්ඩයේ දෙවන පදය තෝරන්න.
නව වැස්සට වැව පිරිලා - ..............................................................
ඒ අතටයි මේ අතටයි - නැමී වැනෙනවා
(1) රන් අස්වනු නෙළන දාට (2) නීල ගොයම කිරි වැදිලා
(3) උඹේ සිනා කිරි උතුරා (4) කෙකටිය මල් උඩ ඇදිලා

(34) චෛත්‍යයෙහි බුබ්බුලාකාරය නැංවුණේ පුප්ඵාධාන යන නමින් හැඳින්වුණු කෙමෙන් පිහිටි තුන්මාල් පේසාව උඩය.
(1) වේදිකා භූමිය (2) සැය වටා ඇති සෑ ගෙය
(3) වාලුකාංගණය (4) ප්‍රාකාරය

✳ **අංක 35 සිට 38 තෙක් ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව වඩාත් නිවැරදි වාක්‍ය තෝරන්න.**

(35) (1) සියලුම ශිෂ්‍යයන් දේශනයට සහභාගි වූහ.
(2) දේශකයාණෝ රැස්වීම අමතයි.
(3) ඔවුහු ක්‍රීඩකයන් නො වේ.
(4) නැන්දා සිනා සිසී මා දෙස බැලුවා ය.

(36) (1) තැඹිලි ගසට ගිය මිනිසෙක් තැඹිලි කැඩූහ. (2) සියලු ම ගංගාවෝ සමනළ කන්ද සිට ගලා බසියි.
(3) සිල් මෑණියෝ දනට වැඩියහ. (4) ඇය බලහත්කාරයෙන් තම දූ දරුවන් රැගෙන ගියහ.

(37) (1) ගංගා ඇළදොළ මුහුදට ගලා බසිති. (2) බුදුන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ සිටියේ ය.
(3) ගුරුවරු විසින් ශිෂ්‍යයෝ යහමඟ යැවෙති. (4) අපි සියල්ලෝ ම ඒ දෙස බලා සිටියෙමු.

(38) (1) මෑණියෝ ආහාර වළඳයි.
(2) තා හොඳින් ඉවසීමෙන් කටයුතු කරන්නෙහි.
(3) දූවරු සිනාසෙන විට අම්මා කෝප වූහ.
(4) වනය දෙවනත් කරමින් ශිෂ්‍යයෝ බිංදුයි ටිකිරියි සෙවූ හ.

(39) ''සූරිය මල අහස් තලේ සිනා මවන - හිමිදිරියේ
- අගනගරේ - මහවීදියෙ - මංසන්දියෙ''
ඉහත සඳහන් කවියේ රචකයා වනුයේ,
(1) කුමාරතුංග මුනිදාස මහතා (2) පරාක්‍රම කොඩිතුවක්කු මහතා
(3) රත්න ශ්‍රී විජේසිංහ මහතා (4) මහගම සේකර මහතා

(40) මුලින් දී ඇති කොටසේ අර්ථයට වඩාත් ගැළපෙන කොටස දී ඇති පිළිතුරු අතරින් තෝරන්න.
''රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට ජනතාව සහය දිය යුතු ය.''
(1) නීතිය සාමය කඩන්නවුන්ට දඬුවම් දිය යුතු ය.
(2) ජනතාව වැරදි දේට පෙළඹීමෙන් නීතිය බිඳ වැටේ.
(3) නීතිය හා සාමය රකින ආයතනවල උපදෙස් නිසි ලෙස පිළිපැදීමෙන් රටක නීතිය හා සාමය රැකේ.
(4) පොලිස් ආරක්ෂාව හා ජනතාව අතර සම්බන්ධතා වැඩිය යුතු ය.

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 21 | S | II |
|---|---|---|

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

**First Term Test - Grade 10 - 2020**

**නම/විභාග අංකය : ......................................සිංහල භාෂාව හා සාහිත්‍යය- II කාලය : පැය 02 යි.**

✳ ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න.

✳ **මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 80ක් හිමිවේ.**

(01) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු ලියන්න. නොලියන කොටස් ඇත්නම් එහි අංකය ලියා ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ ඇති අර්ධස්වර හතර ලියන්න.

(ii) පහත දැක්වෙන පාඨයෙන් උපසර්ග සහිත පද දෙකක් උපුටා ලියන්න.

''සාමාන්‍ය ඇතුන්ගේ අඩි සලකුණු අතර, සුවිශේෂ විසල් අඩි සලකුණු දුටුවහොත් මා අනිවාර්යයෙන් ම හඹා යන්නේ ඒ විසල් අඩි සහිත හස්ති රාජයාය.''

(iii) මොනරාගල ප්‍රදේශයේ භාවිතවන පහත සඳහන් පද සඳහා පොදු ජන වහර ලියන්න.

(අ) ගහමච්චා - (ආ) කුදහනවා -

(iv) පහත දැක්වෙන නාම පදවල ප්‍රකෘති වෙන් කොට දක්වන්න.

(අ) ගොවියා - (ආ) යතුර -

(v) 'කප' යන ධාතු ප්‍රකෘති ඇසුරෙන් පහත සඳහන් ක්‍රියා පද වර්ග ගොඩනගන්න.

(අ) ප්‍රයෝජ්‍ය ක්‍රියා - (ආ) විධික්‍රියා -

(vi) පහත දැක්වෙන වචන සඳහා යෙදෙන සමානාර්ථ පදය බැගින් ලියන්න.

(අ) මළුව - (ආ) ස්තූපය -

(vii) පහත සඳහන් ඉඟිවැකි මඟින් පළවන අර්ථය ලියා දක්වන්න.

(අ) හමස්පෙට්ටියට යැවීම - (ආ) ඉහනිකට බලා -

(viii) පහත සඳහන් අදහස්වලට ගැළපෙන ප්‍රස්තාව පිරුළ ලියන්න.

(අ) පිහිට පතා ගිය තැනකින් විපතක් සිදුවීම -

(ආ) අධමයන්ට උතුම් දෙයක් පලක් නැති කම -

(ix) පහත සඳහන් පාඨයෙහි වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන දෙක පමණක් නිදොස් කර ලියන්න.

''නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිපල බුක්තිවිඳින සෑම පුරවැසියෙක්ම එතුමාට ණය ගැති වෙයි.''

(x) පහත සඳහන් අනුක්ත පදවලට උක්ත රූප ලියා දක්වන්න.

(අ) කාර්මිකයකු (ආ) ඔවුන් (ලකුණු 2x10=20)

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස්වලින් එකක් තෝරාගෙන වචන 250කට නො අඩු වනසේ රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න. (ලකුණු 25)

(අ) ආයුර්වේද වෛද්‍ය ක්‍රමය අද බටහිර රටවල පවා ප්‍රචලිත වෙමින් පවතියි. එය සොබාදහම හා බැඳුණු වෛද්‍ය ක්‍රමයකි. දේශීය ඖෂධ භාවිතයේ වැදගත්කම හා එයින් රටට ලැබිය හැකි ඵල ප්‍රයෝජන පිළිබඳව අදහස් දක්වමින් රචනයක් ලියන්න.

(ආ) ජීවිතයේ හොඳම අවධිය ළමා කාලයයි. අධ්‍යාපනය ලබන කාල සීමාවයි. පාසල් කාලය හෝ ළමා කාලය අපට ආපසු ලබාගත නොහැකි ය. එහෙයින් අපේ ළමා කාලයේ පාසල් අධ්‍යාපනයෙන් උපරිම ප්‍රයෝජන ගැනීමට උනන්දු විය යුතු ය. මේ ඇසුරෙන් රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් යොදන්න.

(ඉ) සොබාදහම මිනිසාට සලසන්නේ අපමණ මෙහෙයකි. එහෙත් මිනිසා සොබාදහමට එරෙහිව ගොස් කටයුතු කරයි. මිනිසා සොබාදහමට කරන අයහපත් බලපෑම් නිසා වර්තමානයේ සොබාදහම මිනිසාට විපත් පමුණුවන බවට උදාහරණ බොහෝ ය. මේ තොරතුරු ඇසුරින් රචනයක් ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

(ඊ) ඔබ ගිය අධ්‍යාපන හෝ විනෝද චාරිකාවක් පිළිබඳව ගමනේ අරමුණු ගමන් මඟ, අතරමග මුහුණදුන් සිදුවීම් හෝ ගමන තුළ මුහුණදුන් ඇත්දැකීම් ආදිය සිහියට නගමින් රචනයක් ලියන්න සුදුසු මාතෘකාවක් යොදන්න.

(03) පහත දැක්වෙන ඡේදය කියවා වචන 50 - 60 ත් වනසේ සාරාංශ කර ලියන්න. ඔබේ පිළිතුරේ වචන සංඛ්‍යාව පහතින් සඳහන් කරන්න.

එක් එක් භාෂාවට සුවිශේෂ වූ සාහිත්‍යයක් ද බොහෝ විට ඇති බව අපි දනිමු. ඇතැම් භාෂාවකට සාහිත්‍යයක් නොමැති විය හැකි වුවද බොහෝ භාෂාවලින් ලියැවුණු සාහිත්‍ය ග්‍රන්ථ ඇත්තේ ය. මේ අතර කාව්‍යයට ද විශේෂ තැනක් හිමි වෙයි. මේ කාව්‍යයන් නිර්මාණය කර ඇත්තේ ඒ ඒ කාලවල විසූ උගතුන් විසිනි. උදාහරණ වශයෙන් කව්සිළුමිණ ගුත්තිල කාව්‍යය, සැළලිහිණි සංදේශය ආදී කෘතින් දැක්විය හැකි ය. මේ එක් එක් කාව්‍ය කිසියම් අවධියක කිසියම් එක් ලේඛකයෙකු විසින් රචනා කරන ලද බවට සැකයක් නැත. සැළලිහිණි සංදේශය ජයවර්ධනපුර කෝට්ටේ විසූ රාහුල හිමියන් ලියූ කෘතියකි.

උගතුන් විසින් සම්පාදනය කරනු ලැබූ මෙවැනි කෘතිවලට අමතරව, ජනතාව අතරේ ම ඇති වී ජනතාව අතරේ ම ආරක්ෂා වී එන තවත් කාව්‍ය වර්ගයක් ද ඇත. ඒවා සාමාන්‍යයෙන් ජනකවි නමින් හැඳින්වේ. මේ අනුව ජනකවි ගැන කරුණු දෙකක් දැක්විය හැකියි. උගත් සාහිත්‍යයක් ඇතත් නැතත් ඕනෑම ජන කොටසක් අතර ජනකවි පහළ විය හැකි ය. පහළවන බව පළමු වන කරුණය. දෙවැන්න නම් උගත් සාහිත්‍යයක් පහළ වීමට පෙරාතුව ජනකවි පහළ වීම ස්වාභාවික බව ය. ලෝකයේ ඕනෑම භාෂාවක් හා සාහිත්‍යයක් ගෙන බැලුව ද උගත් කවීන් කවි ලිවීමට පෙර පටන් පැවැත එන ජනකවි සාහිත්‍යයක් ඇති බව පිළිගත් මතයකි. (ලකුණු 10)

(04) ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

ලොව මෙසේ ප්‍රචලිත වූ කෙටිකතාව සිංහල සාහිත්‍යයට ප්‍රවේශ වූයේ විසිවන සියවසේ මුල් භාගයේ දී ය. පැරණි කතා කලාවෙන් ක්‍රම විකාශිත විශ්ව කෙටිකතාවේ නිර්මාතෘ සෙවීම දුෂ්කර කටයුත්තක් වන්නා සේ ම සිංහල කෙටි කතාවේ නිර්මාතෘ සෙවීම ද දුෂ්කර කටයුත්තක් වන්නේ ය. එයට හේතුව සිංහලයෙහි අනාදිමත් කාලයක සිට සංවර්ධිත කතා කලාවක් බිහිවීමත්, සිංහල කෙටිකතාව එහි විකාශයක ලකුණු පළ කිරීමත් ය. ජන කතා, සද්ධර්මරත්නාවලි කතා, සද්ධර්මාලංකාර කතා ආදී සිංහල කතා ඇසුරේම උපන් නව්‍ය වූ කතා ක්‍රමයක් ලෙස ඇතැම්හු සිංහල කෙටි කතාව දකිති. සිංහලයෙහි පළ වූ ප්‍රථම කෙටිකතා සංග්‍රහය ලෙස දැනට පිළිගැනෙනුයේ 1924 දී පළ වූ මාර්ටින් වික්‍රමසිංහයන්ගේ ගැහැනියක් ''කෙටිකතා සංග්‍රහයයි. එබ්. ඒ. සිල්වාගේ කතාවන්හි ද කෙටිකතා ලක්ෂණ දක්නට ලැබෙතුදු ඔහුගේ මුල් ම කෙටිකතා සංග්‍රහය වූ ''දෙයියන්ගේ රටේ'' පළව ඇත්තේ 1927 දී ය.

(i) කෙටිකතාව සිංහල සාහිත්‍යයට ප්‍රවේශ වූයේ කුමන කාලයේ ද?

(ii) සිංහල කෙටි කතාවේ නිර්මාතෘ සෙවීම දුෂ්කර වන්නේ ඇයි?

(iii) සිංහල කෙටි කතාව නව්‍ය වූ කතා ක්‍රමයක් ලෙස ඇතැමුන් හඳුන්වන්නේ කුමක් නිසා ද?

(iv) පළමු සිංහල කෙටි කතාව පළ වූ වර්ෂය හා එම කෙටිකතා සංග්‍රහය කුමක් ද?

(v) පළමු කෙටිකතා සංග්‍රහය රචනා කළේ කවුරුන් ද? (ලකුණු 2x5=10)

(05) බුවනෙකගම, බුවනෙකබා ජාතික පාසලේ සමාජ විද්‍යා සංගමයේ ලේකම් මාලක මාලින්ද ඔබ යැයි සිතා, සහන බැංකුවේ ශාඛාවක් ඔබ පාසලේ පිහිටුවීමට අවශ්‍ය බව දන්වමින් එම බැංකුවේ කළමනාකාරතුමාට යවන ව්‍යාපාරික ලිපිය ලියන්න. (ලකුණු 15)

**නැතහොත්**

ශ්‍රී ලාංකේය සංගීත ක්ෂේත්‍රයට මහඟු සේවයක් ඉටු කළ හෙළයේ මහා ගාන්ධාර්වයා වන පණ්ඩිත් ඩබ්ලිව් ඩී. අමරදේව මහතාගේ ගුණ සමරු උලෙළ නාමල්ගම මහා විද්‍යාලයේ 2020.03.22 දින පෙ.ව. 10.00ට පැවැත්වීමට පාසලේ සෞන්දර්ය අංශය කටයුතු සංවිධානය කරයි. ඒ සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂතුමා සහභාගි වේ. මේ සඳහා සුදුසු ආරාධනා පත්‍රය සකස් කරන්න. (ලකුණු 15)

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

21 S III

## පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020
## First Term Test - Grade 10 - 2020

නම/විභාග අංකය : .................................. සිංහල භාෂාව හා සාහිත්‍යය- III කාලය : පැය 02 යි.

වැදගත් :

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් පිළිතුරු සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු සංඛ්‍යාව ලකුණු 80කි.

(01) (i) සිට (x) තෙක් සියලුම අනු කොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනු කොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලියවුණු අවධියේ විසූ රජතුමා කවුරුන් ද?
(ආ) ඉහත ජාතක පොත ලියුවේ කුමන යුගයේ ද?

(ii) (අ) ''සලාවත ජයපාල'' කිනම් රජතුමාගේ අග්‍රාමාත්‍යවරයා ද?
(ආ) ගුත්තිල කාව්‍යයේ කතු හිමියන්ගේ නම ලියන්න.

(iii) 'සබඳ තොප විසින් කුමක් දක්නා ලද ද''
(අ) මෙහි සබඳ යනුවෙන් ඇමතුම් ලබන්නේ කවුරුන් ද?
(ආ) මෙසේ අසන තැනැත්තාගේ නම කුමක් ද?

(iv) එමා සත්හු වෙණ නද අසමානය
සමා නොවෙති කොවුලෝ උපමානය
...........................................................................
...........................................................................
(අ) ඉහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න.
(ආ) උපමානය යන්නට සමාන පදයක් ලියන්න.

(v) (අ) දැනට හමු වී ඇති පැරණි ම සිංහල කෘතිය කුමක් ද?
(ආ) පන්සිය පනස් ජාතක පොත ලියවුණ සියවස කුමක් ද?

(vi) (අ) ජාතක කතා ආකෘතියේ එක් අංගයක් නම් කරන්න.
(ආ) පන්සිය පනස් ජාතක පොත ලිවීමට මූලාශ්‍ර වූ කෘතිය කුමක් ද?

(vii) (අ) ගුත්තිල කාව්‍යයේ පද්‍ය ගණන කීයද?
(ආ) ගුත්තිල කාව්‍යයේ මුල් ම කවිය කුමන කාව්‍ය ගණයකින් අරඹා ඇත් ද?

(viii) (අ) ''කව්සිළුමිණ'' ලියා ඇත්තේ කුමන කාව්‍ය විරිතකින් ද?
(ආ) උම්මග්ග ජාතකය ලිවීමේ අරමුණ කුමක් ද?

(ix) (අ) ගුත්තිල කාව්‍යයට පදනමවන කතාව කුමක් ද?
(ආ) ගුත්තිල කාව්‍ය කතු හිමිගේ ගුරුතුමා කවුරුන් ද?

(x) (අ) පන්සිය පනස් ජාතක පොත ලිවීමට අනුග්‍රහය දැක්වූයේ කවුරුන් ද?
(ආ) මහෞෂධ පඬිදුන්ගේ දේවියගේ නම කුමක් ද? (ලකුණු 2x10=20යි)

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) <u>කන්කලු</u> වෙණ නද ඇසුමෙහි ලොබිනේ
රන් රසු දල් කොලහන වන බියෙනේ
<u>සන් සල</u> නොව එහි පිළිරූ ලෙසිනේ
නන් හය සෙන් සිටියෝ සිටි මතිනේ
(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) පසුව මුළු කොටසේ ම අර්ථය ලියන්න.

(ii) .................. **අද වකට** මෙතෙක් නුවර ගන්නා ලද, පණ්ඩිතයන් වහන්ස, නොපමා වන සේක්වා''යි කියා නිරන්තරයෙන් හසුන් එවන්නාහ. උන් වහන්සේ ද ඒ යෝධයනට, ''මම මෙහි පමාවක් නැත්තෙමි. තෙපි **උකටලී** නො වැ නොපමා වැ වසව'' යි කියා යවන සේක.
(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත පණිවිඩ හුවමාරුවට හේතුව කෙටියෙන් ලියන්න.

(iii) අසන **රිසින්** නයි කැල ඔසළෝයා
**ඔවුන වෙතම** සිටිනා ගුරුළෝයා
වයන එ වෙණ නද ලොබම කළෝයා
එදින වයිර සිත සිහි නොකළෝයා
(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) එදින නයි කැල හා ගුරුළන් වෛර සිහි නොකළේ ඇයි?

(iv) මම කැටක් ගෙන කපුටු රැසක් පලවන එකක්හු මෙන් ද දුන්නක් අල්ලාගෙන වඳුරු මුලක් පලවන එකක්හු පරිද්දෙන් ද මේ අටළොස් අක්ෂෞහිණියක් පමණ සේනාව **බඩැ බන් කඩ** පමණකටත් **අස්වාමික** කරවා නිගන්ඨ සේනාවක් පරිද්දෙන් ඉස් ලූ ලූ අත ලුහුබඳවා පියමි.
(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) මෙහි දැක්වෙන උපමා දෙකක් ලියන්න.

(v) නොගොසින් සිට **සිටිවන** නිබඳේයා
වෙසෙසින් සුර නර සෙන් නොමඳේයා
සතොසින් විඳ විඳ **ලොබ** නොසිඳේයා
මෙලෙසින් වෙණ නද අසන සඳේයා
(අ) ඉහත කවියේ ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) මෙම කවියේ විස්තරවන අවස්ථාවෙන් පසු සිදු වූ දෙය කෙටියෙන් ලියන්න. (ලකුණු 4X5=20යි)

(03) (i) කේවට්ට බමුණාගේ කූට බුද්ධියත්,
(ii) මහෞෂධ පඬිඳුන්ගේ ප්‍රඥාවන්ත බවත්
සතර කන් මන්ත්‍රණය පාඩමමෙන් ඉස්මතු වන ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) වෙණ නද ඇසුවන්ගේ සුවිශේෂ හැසිරීමත්,
(ii) සුරඟන රැඟුමේ අපූර්වත්වයත් රසික සිත් ඇඳ බැඳ ගනී. මේ කියමන ගුත්තිල වෙණ නද පාඩම ඇසුරින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

(04) (i) වීරත්වය
(ii) හාස්‍ය යන කරුණු ඉස්මතු කරමින් චරිත නිරූපණය කර ඇති ආකාරය උම්මග්ග ජාතකයේ නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්,**

(i) සරල බස් වහරක් භාවිතයත්
(ii) ප්‍රබල කාව්‍යෝක්ති යොදා ගැනීමත් යන කරුණු අතින් ගුත්තිල කාව්‍ය රසවත් කාව්‍යයක් වී ඇති ආකාරය නියමිත කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

★ **5, 6, 7 ප්‍රශ්නවලින් එකකට පමණක් උත්තර ලියන්න.**

(05) සංවාදාත්මක බස් වහරක් භාවිත කිරීමෙන් ප්‍රබල ලෙස අවස්ථා නිරූපණය කර ඇති ආකාරය සතර කන්මන්ත්‍රණය පාඩමින් උදාහරණ තුනක්වත් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(06) අර්ථ රසය හා ශබ්ද රසය මැනවින් සංකලනය කර අපූර්ව කාව්‍ය සංකල්පනා ඉදිරිපත් කර ඇති ආකාරය ගුත්තිල වෙණ නද පාඩමින් උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(07) මහෞෂධ පඬිඳුන්ගේ උපායශීලී බව මියුලු නුවර ආරක්ෂා වීමට හේතු විය. උම්මග්ග ජාතකයේ නියමිත කොටසින් උදාහරණ තුනක් දෙමින් මේ කියමන පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: 1 | පැය / மணித்தியாலம் / Hours: 01 |

**සැලකියයුතුයි.**

( i ) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.මෙම පත්‍රය සඳහා ලකුණු **40කි.**

( ii ) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති **1 , 2 , 3 , 4** යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

( iii ) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (**x**) ලකුණ යොදන්න.

( iv ) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා,ඒවා ද පිළිපදින්න.

♦ **අංක 01,02 ප්‍රශ්නවල ඉරි ඇඳි කොටසේ අදහස ප්‍රකාශවන පිළිතුර තෝරන්න.**

(01) සේවකයින්ගේ <u>බඩට ගැසීමට</u> කිසිවිටක සූදානම් නොවන බව කාර්යාලයේ ප්‍රධානියා පැවසුවේ ය.

(1) දඬුවම් දීමට (2) රැකියාව අහිමි කිරීමට
(3) බඩට පහරදීමට (4) වැටුප් නොගෙවීමට

(02) නිවසට පැමිණි සේවිකාව <u>ආවාට ගියාට</u>වැඩ නොකරන බව අම්මා කීවාය.

(1) නොසැලකිල්ලෙන් (2) සැලකිල්ලෙන්
(3) යන එන ගමන් (4) උදාසීන ලෙස

♦ **අංක 03 සිට 05 දක්වා ඇති ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(03) සිංහල සාහිත්‍යයේ .................. සඳහා වර්තමාන සාහිත්‍යධරයෝ කැපවීමෙන් කටයුතු කරති.

(1) ප්‍රසාදය (2) ප්‍රරෝහණය
(3) ප්‍රගමනය (4) ප්‍රසාරණය

(04) ශ්‍රී ලංකාවේ රාජ්‍ය පරිපාලනය විධිමත් කිරීම සඳහා නව නීති මාලාවක් ...................... කර ඇත.

(1) සම්පිණ්ඩනය (2) විමර්ශනය
(3) සංරක්ෂණය (4) සම්පාදනය

(05) විශිෂ්ට සාහිත්‍යය නිර්මාණයක් රචනා කිරීම සඳහා ලේඛකයා සතුව උසස් ....................... තිබිය යුතු ය.

(1) පරිකල්පනයක් (2) විචාරයක්
(3) විවරණයක් (4) ප්‍රබෝධයක්

(06) එක් එක් පේළියේදී ඇති සෑම පදයකම අක්ෂර වින්‍යාසය **නිවැරදි** පිළිතුර තෝරන්න.

(1) ජයග්‍රහනය,දෘෂ්ඨිය,යථාර්තය,කළාපය
(2) සශ්‍රීක,අවිනිශ්චිත,ප්‍රහර්ෂය,කාර්යක්ෂම
(3) නිපුනතාව,අභිලාශය, ආශ්වාදය,ශංසෝධනය
(4) ගවේශණය,ඓක්‍යය,ඖධාර්ය,සම්ප්‍රධාය

(07) මුලින් දී ඇති පදයට සමානාර්ථ **නොදෙන** පදයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) අඳුර - තිමිර,තම,කළුවර, අන්ධකාරය
(2) ගත - ශරීරය,දේහය,වෙර,සිරුර
(3) ප්‍රයත්නය - උත්සාහය, වෑයම, මහන්සිය,ධෛර්යය
(4) ප්‍රකට -ප්‍රසිද්ධ,පසිඳු,ප්‍රවීණ,පුවතර

(08) මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය **නොදෙන** පිළිතුර තෝරන්න.
(1) සම්ප්‍රාප්තිය - සමාරම්භය (2) සංක්ෂිප්ත - දීර්ඝ
(3) සංයෝගය - වියෝගය (4) ආඩම්බර - නිහතමානි

(09) මුලින් දී ඇති පදයේ බහු අර්ථ ප්‍රකාශ වන පිළිතුර කුමක් ද?
(1) දිය - ජලය,උදක,පැන්,වතුර (2) සර - විල ,ඊතලය,ස්වරය,ශබ්දය
(3) හය - අශ්ව,සෛන්ධව,සිඳු,තුරඟ (4) වරණ - හස්ති,සිභාල,නාග,මඟ

(10) අර්ථයෙන් සමාන යුගල පද ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ගේ දොර ,වතු පිටි,පොත පත,හොර බොරු (2) හිතා මතා,පඩි නඩි,හරක බාන,දුගී මගී
(3) අවි ආයුධ,ආධාර උපකාර,ශූර වීර,සැප සනීප (4) අය වැය,එහා මෙහා,සිරිත් විරිත්,උස් මිටි

(11) ප්‍රයෝජ්‍ය ක්‍රියාවක් හා අසම්භාව්‍ය ක්‍රියාවක් සහිත පිළිතුර තෝරන්න.
(1) ගොස් , ලියමින් (2) බලනු , යන්න
(3) දිනේවා , උදාවේවා (4) ලියවයි , නටද්දී

(12) තාලුජ අක්ෂර පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) ක,ඛ,ග,ඝ,ඞ (2) ත,ථ,ද,ධ,න
(3) ච,ඡ,ජ,ඣ,ඤ (4) ට,ඨ,ඩ,ඪ,ණ

(13) ඌෂ්මාක්ෂර දෙක බැගින් ඇතුළත් පද සහිත වරණය තෝරන්න.
(1) අවශේෂ,ශාසනය,හසළ,සන්තුෂ්ටිය (2) පහණ,සරල,නිෂ්ඵල,සුදන
(3) සමය,රක්ෂාව,මහිමය,විමතිය (4) සම්භාවනීය,සංකලනය,මිශ්‍රණය,දූරස්ථ

(14) අඝෝෂ අක්ෂර සහිත පිළිතුර තෝරන්න.
(1) ක,ච,ට,ත,ප (2) ය,ර,ල,ව,හ
(3) ග,ජ,ඩ,ද,බ (4) අ,ආ,ඇ,ඈ,ඉ

(15) මහාප්‍රාණ අක්ෂරයක් නොමැති පිළිතුර තෝරන්න.
(1) පටිමාසර (2) ප්‍රතිඵල
( 3) උට්ඨාන (4) පර්යේෂණය

♦ **අංක16 හා17 ප්‍රශ්නවලදී ඇති කොටස සඳහා සුදුසු තනි පදය තෝරන්න.**

(16) හොඳින් පෝෂණය වූ ,
(1) සුරක්ෂිත (2) පරිපෝෂිත
(3) පරපෝෂිත (4) දුෂ්පෝෂිත

(17) වචනයක සැඟවුණු අර්ථය,
(1) වාච්‍යාර්ථය (2) නිශ්චිතාර්ථය
(3) පුනරාර්ථය (4) ව්‍යංග්‍යාර්ථය

(18) එක් එක් පේළියේ දී ඇති පදවල අර්ථය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පුෂ්පාධාන - මල්වැල්,පැළ දිග - නැගෙනහිර,සුලබ - හිඟ,අවංක - බොරු
(2) උපහැරණය - උදාහරණය,ප්‍රතිලාභ - වාසි,උක්තීන් - කියමන්,පරිශීලනය - ඇසුරු කිරීම
(3) පරාධීන - නිදහස්,අනුගත - වෙනස්,වාලුකා - මළ,ශ්වේත - කුඩය
(4) පියගැට - පඩි පෙළ,අභියස - පිටුපස,උවම් - මුහුණ,ප්‍රෞඪ - උසස්

(19) A - මම අම්මා ............... ගමනක් ගියෙමි.

B - රාජ සභා කවියෝ .................. වන්දිභට්ටයෝ ප්‍රශස්ති ගායනා කළහ.

C - දැරිය මල් කඩනු .................... උයනට ගියාය.

D - ඔහු නායකයකු ....................කටයුතු කළේ ය.

ඉහත වාක්‍යවල හිස්තැන්වලට සුදුසු නිපාත පද අනුපිළිවෙළ වන්නේ,

E - හෙවත් F - පිණිස G - මෙන් H - සමඟ

(1) E,G,F,H (2) H,G,F,E

(3) F,H,G,E (4) H,E,F,G

(20) අකාරාදී පිළිවෙළට නිවැරදිව නම් යොදා ඇති පිළිතුර තෝරන්න.

(1) නිමාලි,ඉසුරි,නවෝදී,නිර්මලී (2) චාමර,චතුර,තරිඳු,නිශාන්ත

(3) කල්පනී,කාවින්දි,නයෝමි,මනෝරි (4) ධනුෂ්ක,චම්පික,ගයන්ත,කවීෂ

(21) උක්ත නාම පද **පමණක්** ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) රිතීන්,අප,ඔවුන්,සිසුන් (2) දැරියක,ඇතැමුන්,අයෙකු,මුවන්

(3) වීරයෙක්,නුඹලා,ඔවුහු,පිහුම්හු (4) සමහරුන්,නදීහු,සතුන්,මා

(22) පහත දැක්වෙන වාක්‍යයේ ඉරි ඇඳි පදයේ අදහස දෙන පිළිතුර තෝරන්න.

සන්දේශයක් ගෙන යන දූතයෙකු මෙන් පැමිණි හීය දෙස නීලමණි <u>විස්මයෝත්ඵුල්ල නයනයෙන්</u> බැලුවා ය.

(1) සන්තෝෂයෙන් පිරුණු මුවින් (2) දොම්නසින් පිරුණු මුවින්

(3) සැකයෙන් පිරුණු මුවින් (4) පුදුමයෙන් පිරුණු ඇසින්

(23) ප්‍රාදේශීය භාෂා ව්‍යවහාරයට අයත් "කොයි" යන උපකාරක පදය භාවිත කරන්නේ,

(1) මොනරාගල පළාතේ ය. (2) උඩරට පළාතේ ය.

(3) දකුණු පළාතේ ය. (4) ඌව පළාතේ ය.

(24) 'අ' කොටසේ දැක්වෙන සාහිත්‍ය නිර්මාණ 'ආ' කොටස සමඟ ගැළපූ විට නිවැරදි අනුපිළිවෙළ වන්නේ,

| අ | ආ |
|---|---|
| විජයබා කොල්ලය | A - ජී.බී.සේනානායක |
| සක්වා ලිහිණි | B - පරාක්‍රම කොඩිතුවක්කු |
| පලි ගැනීම | C - ඩබ්.ඒ.සිල්වා |
| අකීකරු පුත්‍රයකුගේ ලෝකය | D - මහගමසේකර |

(1) B,A,D.C ය. (2).D,B,C,A, ය

(3) C,D,A,B ය (4) D,A,C,B ය.

♦අංක **25, 26** යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළු වලට වඩාත් සමීප අර්ථය දෙන පිළිතුර තෝරන්න.

(25) අකල් වැස්සකින් තෙමුණා වගේ

(1)හදිස්සියේ පැමිණි වැස්සකින් පීඩා සිදුවීම (2)බලාපොරොත්තු වූ කරදරයකට මුහුණ දීම.

(3) බලාපොරොත්තු නොවූ විපතකට මුහුණ දීම (4)ඉතා අයහපත් ප්‍රතිඵලයක් ලැබීම

(26) අහසට ඉණිමං බැන්දා වගේ.
(1) යහපත් ක්‍රියාවකට උත්සාහ කිරීම (2) දිගු ගමනක් යාමට සූදානම් වීම.
(3) ඉතා අමාරු වැඩක් කිරීම. (4) නිෂ්ඵල උත්සාහයක යෙදීම.

(27) උපසර්ග පද ගණයට අයත් පද ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) කැටුව,නිරතුරු (2) දාර්ශනික,නැණවත්
(3) අභිමානය,ප්‍රවර්ගය (4) උදාරතර,කුසලතා

(28) " මේ මිනිස්සු තමයි මහ පොළොවේ නියම පුත්තු." ඉහත දැක්වෙන ප්‍රකාශය ඇතුළත් සාහිත්‍ය නිර්මාණය වන්නේ,
(1) සඳා මෙලෙස පුර දෙරණේ (2) සුනේත්‍රා
(3) ලක්බිම වන සැරිය (4) මං තනන්නෝ

(29) "උකුස්සෙක්" යන පදයේ නිවැරදි ප්‍රකෘතිය හා ප්‍රත්‍ය ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) උකුසු + වෙක් (2)උකුස් + එක
(3) උකුසු + එක් (4) උකුස්ස + එක්

(30) 'බැලුවේ ය' යන ක්‍රියාපදයේ කර්මකාරක ක්‍රියා රූපය තෝරන්න.
(1) බලන ලද්දේ ය. (2) බලන්නේ ය.
(3) බලන ලදහ. (4) බලනු ලැබේ.

(31) රූපකයක් යෙදී නැති පිළිතුර තෝරන්න.
(1) තරුමල් යායට සඳකැන් වැටිලා
(2) සිරුරත ඝන නිල් මේඝ වළාවයි.
(3) ප්‍රඥා ප්‍රදීප දල්වා
(4) සිතිවිලි නැති රූ විලස මුවෝ ය.

(32) ඇදපිල්ල,දීර්ඝ පාපිල්ල,ගැටපිල්ල,ඇලපිල්ල පළමු අක්ෂරයේ ඇති පද ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) පැන්සල,පූජනීය,තෘෂ්ණාව,වානරයා
(2) ග්‍රහණය,කාන්තාරය,නෞකාව
(3) මාලය,ගුණවත්,වැරහැලි,සිරිමත්
(4) රුවල,තාරාවා,දීපාවලී,රැකියාව

(33) වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
(1) ඌෂ්මාක්ෂර " සර්ෂ" නමින් ද හැඳින් වේ.
(2) 'ෆ' අක්ෂරය ඉංග්‍රීසි හා අරාබි භාෂාවලින් සිංහල භාෂාවට පැමිණ ඇති තත්සම වචනවල යෙදේ.
(3) කෙටිකතාවක් රසවත් වීමට සංකේත භාවිතය ද වැදගත් වේ.
(4) වර්ගාන්ත අක්ෂර සඤ්ඤක අක්ෂර නමින් ද හැඳින් වේ.

(34) පහත සඳහන් කාව්‍ය කොටසේ මුල් පදය තෝරන්න.

......................................
රන් අස්වනු නෙළන දාට
නගෝ අපට ඇඹුල අරං
වෙලට වරෙන්නේ

(1) නව වැස්සට වැව පිරිලා (2) නීල ගොයම කිරි වැදිලා
(3) ඉහළ වෙලේ ඉස්මත්තේ (4) කෙකටිය මල් සුද තවරා

(35) **අංක 35 හා 36 යටතේ දී ඇති වාක්‍ය අතුරෙන් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න .**

(1) නුඹද මමද උත්සවයට ගියෙහි.
(2) ළමයින් සරුංගල් යවද්දී අපි බලා සිටියෙමු.
(3) මෑණියෝ දරුවන් ආරක්ෂා කරයි.
(4) අධික වර්ෂාව නිසා ගෙවල් රාශියක් විනාශ වූහ.

(36)(1) ගායිකාවන් විසින් ගී ගයන ලදහ.
(2) සමහරෙක් අවංක ව කටයුතු කරයි.
(3) වනජීවී නිලධාරින් විසින් සත්තු ආරක්ෂා කරනු ලබති.
(4) සංවිධායකයන් විසින් අමුත්තෝ පිළිගන්නා ලදී.

(37) පේමතෝ ජායතී සෝකෝ,මහාසාර,නාට්‍ය රචනා කරන ලද්දේ,
(1) දයානන්ද ගුණවර්ධන මහතා ය.
(2) ආර්.ආර්.සමරකෝන් මහතා ය.
(3) හෙන්රි ජයසේන මහතා ය.
(4) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ය.

(38) ''සාහිත්‍යය යනු භාෂාව ඇසුරෙන් පුදුම සහගත දේ කරන්නකි'' යනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ,
(1) විමල් දිසානායක මහතා ය.
(2) මාර්ටින් වික්‍රමසිංහ මහතා ය.
(3) කුමාරතුංග මුණිදාස මහතා ය.
(4) ගුණදාස අමරසේකර මහතා ය.

(39) '' සූරිය මල අහස් තලේ සිනා මවන හිමිදිරියේ'' කාව්‍ය කොටස ඇතුළත් නිර්මාණයට පාදක වී ඇත්තේ,
(1) කුඩා දැරියකි. (2) පාසල් යන දරුවෙකි.
(3) උදෑසනකි. (4) සූරියකාන්තමලකි.

(40) පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න. මානව සංහතියේ පැවැත්මට තර්ජනයක් වන ආකාරයේ පර්යේෂණ මෙහෙයවීමට පවා ඇතැම් නූතන විද්‍යාඥයෝ පෙළඹී සිටිති.

(1) නූතන විද්‍යාඥයින් සිය පර්යේෂණ සිදු කළ යුත්තේ මිනිස් සංහතියේ යහ පැවැත්මට පිටිවහලක් වන පරිදි ය.
(2) ඇතැම් නූතන විද්‍යාඥයින්ගේ පර්යේෂණ මිනිස් වර්ගයාගේ යහපතට යොමු නොවීම අභාග්‍යයකි.
(3) නව විද්‍යාත්මක පර්යේෂණවල අභිමතාර්ථය විය යුත්තේ මිනිස් සංහතියේ පැවැත්මට ඇති බාධා ඉවත් කිරීමයි.
(4) සමහර නූතන විද්‍යාඥයෝ මිනිස් වර්ගයාගේ පැවැත්මට හානිකර විය හැකි පර්යේෂණවල ද නියුක්ත වෙති.

(ල.1 x 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாந்தவணைமதிப்பீடு - 2019
First Term Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 10 | |
| විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | |
| පත්‍රය / வினாத்தாள் / Paper | II | |
| පැය / மணித்தியாலம் / Hours | 02 | |

**සැලකිය යුතුයි:**

♦සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.

(01) අංක ( i - x ) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු **නොලියන්නේ නම් එහි ප්‍රශ්න අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

( i ) (අ) උච්චාරණයේ දී මුඛයෙන් උණුසුම් වායුධාරාවක් නිකුත් වන ශබ්ද හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

(ආ) යටිතොල හා උඩුතොල ආධාරයෙන් උපදින ශබ්ද හැඳින්වෙන්නේ කුමන නමකින් ද?

( ii ) පහත දැක්වෙන අනුක්ත පදවල උක්ත රූප ලියන්න.

(අ) බිසවක - (ආ) රීතීන් -

(iii) දකුණු පළාතේ ව්‍යවහාර වන පහත සඳහන් පද සඳහා පොදු ව්‍යවහාර ලියන්න.

(අ) මුත්තා - (ආ) අම්මණ්ඩි -

(iv) පහත දැක්වෙන නාම පද සහ ක්‍රියා පද වල ප්‍රකෘති ලියා දක්වන්න.

(අ) බලා - (ආ) වැසියාට -

( v ) පහත දැක්වෙන පද සඳහා සමානාර්ථ පද ලියන්න.

(අ) චිරන්තන - (ආ) ප්‍රයත්නය -

(vi) පහත දැක්වෙන වාක්‍යයෙන් උපසර්ග පද 2ක් උපුටා ලියන්න.

"මිහිඳු මාහිමියන්ගේ සම්ප්‍රාප්තිය ගැන ප්‍රබල කරුණු රැසක් ශේෂ ව පවතී."

(අ) ..................... (ආ) .........................

(vii) පහත දැක්වෙන වචන සඳහා යෙදෙන සිංහල වචන ලියන්න.

(අ) පටිමාසර - (ආ) පාද පීඨිකා -

(viii) පහත දැක්වෙන වගන්ති සඳහා ගැළපෙන පිරුළ හෝ ඉඟි වැකිය ලියන්න.

(අ) ජන්මයෙන් ආ දුර්ගුණ ඉවත ලිය නොහැකි ය . (ආ) විනාශය ළං වෙලා.

(ix) පහත දැක්වෙන යුගල පද සම්පූර්ණ කරන්න.

(අ) තුටු (ආ) ඉඟින්

(x) " කෙකටිය මල් සුද තවර උඹේ සිනා කිරි උතුරා.." ඉහත පද්‍ය පාදය ඇසුරෙන් ,

. (අ) රූපකාලංකාරයක් (ආ) මධ්‍යම පුරුෂ නාම පදයක් ලියා දක්වන්න

(ලකුණු : 2 x 10 = 20)

(02) පහත දැක්වෙන (අ) ,(ආ) ,(ඉ) ,(ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන **250** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න.වරහන් තුළ ඇති අක්ෂරය ඔබේ උත්තර පත්‍රයේ ලියා රචනය ලිවීම ආරම්භ කරන්න.රචනය සඳහා සුදුසු **මාතෘකාවක්** ද යොදන්න.

(අ) පිළිකාව ඉතා භයානක ප්‍රතිඵල ගෙන දෙන මාරාන්තික රෝගයකි.මෙහි තවත් භයානක ලක්ෂණයක් නම් රෝගය අසාධ්‍ය වනතුරු වේදනාවක් හෝ පැහැදිලි රෝග ලක්ෂණයක් ඉස්මතු නො වීමයි. මෙය මුල් අවස්ථාවේ හඳුනාගත හැකි වුවහොත් සුව කළ හැකි බව වෛද්‍ය මතයයි.පිළිකාවෙකැ'යි සැක සිතෙන ඉතා සුළු අවස්ථාවක දී පවා වෛද්‍යවරයෙකු හමුවීම එය වැළක්වීමේ හොඳම ක්‍රමයයි. එමෙන් ම කුඩා කල සිට ම මේ පිළිබඳ ව දැනුම්වත් කිරීමට අපේ සෞඛ්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ ඉඩක් වෙන් කළ යුතුයි.

(ආ) ඕනෑම රටක් සංවර්ධනය කරා පිය නගන ගමනේදී ප්‍රබල බාධකයක් වී ඇත්තේ නාස්තිය හා දූෂණය යි. කාලය නාස්ති කිරීම මෙන්ම පොදු දේපල නාස්තිය ද අතිශයින්ම භයානක ය. ජාතික අනුරාගය ඇති කවරෙකුගේ වුවද හදවත කම්පා කෙරෙන අයුරින් සිදුවන නාස්තියත් දූෂණයත් ශිෂ්ට සම්පන්න ලෝකයාගේ පිළිකුලටත් විස්මයටත් භාජනය වෙයි.මේවා මැඩලනු සඳහා විධිමත් නීති පද්ධතියක අවශ්‍යතාව මෙන්ම හදවතේ හැඟීම් ද වෙනස්කර ගැනීමේ ඕනෑකම තිබිය යුතු ය.

(ඉ) විෂ මත්ද්‍රව්‍ය අද බොහෝ රටවල යොවුන් පරපුර ගිලගන්නා රකුසෙකි.විවධ නම්වලින් හැඳින්වෙන මේ මත්ද්‍රව්‍ය බටහිර රටවල වේගයෙන් පැතිර යයි.දැන් දැන් ලංකාවේ ද පහසුවෙන් මුදල් උපයා ගැනීමේ පහත් චේතනාවෙන් මත්ද්‍රව්‍ය ජාවාරම ජයට ම සිදු වේ.භෞතික දියුණුව මිස ගුණධර්ම ගැන තැකීමක් නැති සමාජවලට අයත් යෞවනයෝ පහසුවෙන් ම මේවාට ගොදුරු වෙති. සමහර පාසල් සිසු දරුවන් ද මේ විපතට ගොදුරු වී සිටින බව පර්යේෂණවලින් හෙළි විය. දෙමාපියන්ගේ පමණක් නොව අධ්‍යාපනඥයන්ගේ හා පාලක පක්ෂයේත් අවධානය මෙය මැඩලීම සඳහා යොමු කළ යුතු කාලය එළඹ ඇත.

(ඊ) ළමා සාහිත්‍ය කෘති සහ ළමා චිත්‍රපට දරුවන්ගේ බුද්ධි වර්ධනයට මහෝපකාරී වන ප්‍රබල මාධ්‍ය දෙකකි.මෙම නිර්මාණ තුළින් සංස්කෘතික උරුමයන් පමණක් නොව අනාගත අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය ශක්තිය ද ලබා දෙයි.තම රටට ජාතියට ළැදියාවක් ඇති පිරිපුන් මිනිසුන් වීමට අවශ්‍ය පදනම මෙම ළමා නිර්මාණ තුළ ගැබ් වී තිබිය යුතුයි. එම නිසා මෙම ක්ෂේත්‍රවල නියැලෙන්නෝ දරුවාගේ වයස් මට්ටම,බුද්ධි මට්ටම, තර්කන හැකියාව,චින්තන රටාව හා ළමා සිතිවිලි පිළිබඳ අවබෝධයකින් සිටීම අත්‍යවශ්‍යයි.

(ලකුණු 25)

(3).පහත දැක්වෙන පාඨය **වචන 40-50 අතර** වන සේ සාරාංශ කොට ලියන්න.ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

කොළඹ යුගය සිංහල පද්‍ය සාහිත්‍යයේ යම් තරමකට දියුණු කාල පරිච්ඡේදයක් ලෙස සැලකිය හැකියි.ගුවන් විදුලිය,පුවත්පත්,වාර සඟරා ආදී මධ්‍ය කිහිපයක සිංහල කවිය ජනප්‍රිය ම අංගය බවට පත් වී තිබිණි.කවි මඩු,කවි වාද මගින් සාමාන්‍ය ජනතාව අතර ද කවිය ඉමහත් සේ ජනප්‍රිය ව තිබූ බව පෙනේ.පසු කලෙක නිදහස් පද්‍යය කොළඹ යුගයේ පද්‍ය ආක්‍රමණය කරන තෙක් ම එම ජනප්‍රියත්වය රැකගෙන සිටීමට කොළඹ කවියන්ට හැකි විය.විමලරත්න කුමාරගම,පී.බී.අල්විස් පෙරේරා,එස්.මහින්ද හිමි වැන්නෝ කොළඹ යුගයේ ජනප්‍රියම කවියෝ වූහ.මේ යුගයේ පද්‍ය බොහෝ කොට ශබ්දය මත පදනම් ව පැවතුණි.එළිසමය පිහිටුවා විරිතකට ඇද පැද කියන සිව්පද ගුණය මේ යුගයේ පද්‍යවල ජනප්‍රිය ආරක් විය.මාත්‍රා හා විරිත් අතින් වෙනස් වුවද හුදෙක් ගායන කළ හැකි ශ්‍රව්‍යගෝචර බව මේ යුගයේ පද්‍යයේ පදනම වී ය.මේ යුගයේ පද්‍ය අතර ඉතාම කලාත්මක කෘති හා නිර්මාණ අතර දැකිය හැක්කේ ළමා පද්‍ය රචනා ය. (ලකුණු 10)

(04) පහත දැක්වෙන පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

විද්වතුන් කීප දෙනෙකුගේ විශ්වාසය අනුව මොහෙන්ජෝදාරෝ සහ හරප්පා යනු එක්තරා අවස්ථාවක ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත්ව පැවතී එක සමාන නගර දෙකකි.මෙය වර්ග සැතපුම් 1200 x 700 පමණ විශාල වූ ප්‍රදේශයක පැතිර ඇති බව පංජාබ් හා සින්ධ් ආදී ප්‍රදේශවල කරන ලද කැණීම්වලින් අනාවරණය වී තිබේ. මොහෙන්ජෝදාරාවේ ජීවත් වූ මිනිසුන් ඉතා සැපවත් ජීවිත ගතකර ඇති බව දැනට සොයාගෙන ඇති නෂ්ටාවශේෂ දෙස බැලීමෙන් අනුමාන කළ හැකි ය.කාන්තාවෝ ද උසස් සමාජමය තත්ත්වයක් භුක්ති වින්දාහ.පවුලක සියලු සාමාජිකයෝ ස්ත්‍රී පුරුෂ භේදයකින් තොර ව ආභරණ පැළඳියහ.ළමයින් සඳහා වූ ක්‍රීඩා භාණ්ඩ සහ බෝනික්කන් දෙස බලන කල එම සංස්කෘතියට අයත් මිනිසුන් ළමයින් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කොට ඇති බව පැහැදිලි වෙයි.ඔවුන්ගේ ආහාර රටාව ද මස් ,මාලු ,එළවලු සහ පළතුරු,කිරි ආදියෙන් සමන්විත වූ බව පෙනේ.

(1) ඡේදයට අනුව ඉන්දු නිම්න ශිෂ්ටාචාරයට අයත් වූ නගරදෙක ලියන්න.

(2) කැණීම්වලදී අනාවරණය වූ තොරතුරු මොනවාද?

(3) මෙහි ජීවත් වූ වැසියන් දරුවන් සඳහා විශේෂ අවධානයක් ලබා දුන් බවට ඉතිරිව ඇති සාක්ෂි දෙක ලියන්න.

(4) එම වැසියන්ගේ ජීවන රටාව පිළිබඳ ව අනුමාන කළ හැකි කරුණු දෙකක් ඡේදය ඇසුරෙන් ලියා දක්වන්න.

(5) ඡේදයේ සඳහන් පහත දැක්වෙන පද සඳහා **සමාන පදයක්** බැගින් ලියන්න.

(අ) නෂ්ටාවශේෂ (ආ) විද්වතුන්

(ලකුණු 2 x 5 = 10)

(05) ඔබේ පාසලේ සිසු දරුදැරියන්ගේ කියවීමේ රුචිය වර්ධනය කර ගැනීමේ අදහසින් පාසලේ ප්‍රධාන ශාලාවේ දී පොත් කියවීමේ වැඩසටහනක් සහ පොත් සල්පිලක් පැවැත්වීමට අවශ්‍ය වී තිබේ.මේ සඳහා දායකත්වය ලබාදෙන ලෙසත්, අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට උපදෙස් ලබාදෙන ලෙසත් දන්වමින් ප්‍රදේශයේ ප්‍රසිද්ධ පොත්හලක කළමනාකාරතුමා වෙත යවන ව්‍යාපාරික ලිපිය සකසන්න.ඔබ සාහිත්‍ය සංගමයේ ලේකම්වරයා යැයි සිතන්න.

(වචන 100 –125 ත් අතර සෑහේ.)

**නැතහොත්**

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමාගේ ප්‍රධානත්වයෙන් සම්භාවනීය කලාකරුවන්ගේ සහභාගිත්වයෙන් පාසලේ පැවැත්වෙන වාර්ෂික විවිධ ප්‍රසංගය සඳහා සහභාගී වන ලෙස දන්වමින් දෙමාපියන්ට යවන ආරාධනා පත්‍රය සකස් කරන්න.

(ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாந்தவணைமதிப்பீடு - 2019
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper: III | පැය / மணித்தியாலம் / Hours: 02 |

**සැලකිය යුතුයි:**

- උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න <u>පහකට</u> පමණක් උත්තර ලියන්න.
- 1,2,3,4 <u>ප්‍රශ්නවලටත්</u> 5,6,7 ප්‍රශ්න වලින් **එකකටත්** උත්තර ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.

(01) ( i ) සිට ( x ) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න.කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්,එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) (අ) පන්සීය පනස් ජාතක පොත ලියවුණේ කිනම් සාහිත්‍ය යුගයකදී ද ?
(ආ) එකල රාජ්‍යත්වය දැරූ රජතුමා කවුරුන් ද?

( ii ) (අ) ජාතක කතා පොතට මූලාශ්‍රය වූ පාලි ග්‍රන්ථය නම් කරන්න.
(ආ) සිංහල ජාතක කතාවන්ට නියමිත ආකෘතියේ ඇති ලක්ෂණ තුන කවරේද?

( iii ) (අ) ජාතක පොත සිංහලයට නැගුණු පසු වෙන් වෙන් වශයෙන් ලියවුණු ජාතක කතාවක් නම් කරන්න.
(ආ) ජාතක කතා පොත ඇසුරෙන් ලියවුණු කාව්‍ය ග්‍රන්ථයක් ලියන්න.

( iv ) " කේවට්ටය,තෝ තමාගේ මන්ත්‍රණය සතර කන් මන්ත්‍රණය යැයි සිතයි ද?දැන් ම සකන් වැ ගියේය."
(අ) සතර කන් මන්ත්‍රණයට සම්බන්ධ වූ දෙදෙනා කවුරුන් ද?
(ආ) එය දැන් ම සකන් වැ ගියේ කෙසේ ද?

( v ) "ආචාරිනී ඒ උපාය ඉතා යහපත,සෙට උදැසන ධර්ම යුද්ධ වන්නේ ය.ඉදින් ධර්ම යුද්ධයට නො අවු නම් එයින් පැරැද්දා නම් වන්නේ යැ"
(අ) මෙසේ පණිවිඩය යවන්නේ කාට ද?
(ආ) "ධර්ම යුද්ධය" නමින් හඳුන්වා ඇත්තේ කුමක් ද?

( vi ) (අ) ගුත්තිල කාව්‍යය ලිවීමට මූලාශ්‍රය කොට ගත් ජාතක කතාව කුමක් ද ?
(ආ)ගුත්තිල කාව්‍යයරචනා කිරීම අරඹා ඇත්තේ කිනම් කාව්‍ය ගණයකින් ද?

( vii ) (අ) වැත්තෑවේ හිමියන්ගේ ගුරු හාමුදුරුවන් කවුරුන් ද?
(ආ) ගුරු හාමුදුරුවන් වැත්තෑවේ හිමිට අප්‍රසාදය පළ කිරීමට යෙදූ උපක්‍රමය කුමක් ද?

( viii ) දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි
ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි
ගිය ගිය දිය නද එන මෙන් ගෙන මිණි
........................................................................

(අ) මෙහි ඉතිරි කවි පාදය සම්පූර්ණ කරන්න.
(ආ) දිය, දිය ගොස යන පදවල අර්ථ දක්වන්න.

(ix) සතොස් කරන වීණා නද ඇසුමට
නොගොස් සිටින පිල්බර ගණ ගොදුරට
වෙසෙස් රුවින් තම මැවුවත් බඹහට
සඳැස් සවන් නොකළැයි වූ නොසතුට

(අ) පිල්බර ගණ නොසතුටු වීමට හේතුව කුමක් ද?
(ආ) අර්ථ දක්වන්න.

- පිල්බර -
- සඳැස් -

(x) ගුත්තිල මහ සිපී
සක් දෙව් බසින් සැතපී
මින් දිනමැ යි දැපී
බමර තත පළමුවෙන් සිඳපී

(අ) ගුත්තිල පඬිතුමාට සක් දෙව් රජුගෙන් ලැබුණු උපදෙස කුමක් ද?
(ආ) බමර තත යනු කුමක් දැයි ලියන්න (ලකුණු 2 x 10 = 20)

(02) පහත සඳහන් ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

( i ) " දේවයන් වහන්ස,නොසිතා වදාළ මැනව,අනෙක් බලවත් මාගේ උපායෙක් ඇති,නුවර ඇතුළේ වලක් නැති හෙයින්..."
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?
(ආ) මෙහි සඳහන් බලවත් උපාය කුමක් ද?

( ii ) " එසේ වී නම් තට රුවියක් හැර ගෙන යව"යි කීය.ඒ තෙමේ මසු දාහ අතට ගත.
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?
(ආ) එම පුද්ගලයා ළඟ තිබූ අනෙකුත් දේ මොනවා ද?

(iii) " නැඟී සිටුව! ආචාරිනී,නැඟී සිටුව ආචාරිනී,මම බාලයෙමි;තොපගේ මුනුබුරු තරමට ඇත්තෙමි.මා නොවඳුව"
(අ) මෙසේ ප්‍රකාශ කළේ කවුරුන් ද?
(ආ) මෙම සිද්ධියට පෙර සිදු වූයේ කුමක් ද?

(iv) පටන් සුරිඳු දුන් උපදෙස් සිහිකොට
**ඉටන්** බෙලෙන් දැමුවෙන් ගුළි අහසට
**තුටන් වඩන** සුර අඟනෝ බැස සිට
පටන් ගත්තු නව සියයක් නැටුමට
(අ) අංකිත පදවල අර්ථ දක්වන්න.
(ආ) උපදෙස් ක්‍රියාත්මක කළ පසු සිදු වූ දේ ලියන්න.

(v) පන් සිළු වීණා නද පසු බැස්වූ
මන් පිනවන **වෙණ නදයෙන්** **තොස්වූ**
**නන් දන කැන්** දුටුව ද බිය සිස්වූ
මින් රළ වුත් ගං වෙරළට රැස්වූ
(අ) අංකිත පදවල අර්ථ දක්වන්න .
(ආ) මත්ස්‍ය සමූහයා ගං වෙරළට රැස් වූයේ කුමක් සඳහා ද?

(ලකුණු 4 x 5 = 20)

♦ **03,04 ප්‍රශ්නවලට වචන 150 – 200අතර විය යුතු ය.**

(03) පන්සීය පනස් ජාතක කතාකරුවා උම්මග්ග ජාතකයේ දී මහෞෂධ පඬිතුමාගේ බුද්ධි මහිමය ප්‍රකාශ කිරීමට සමත් වන්නේ,

(අ) කේවට්ටගේ යුද උපක්‍රම ව්‍යර්ථ කිරීමට විවිධ උපක්‍රම භාවිත කිරීමේ හැකියාව

(ආ) උපායශීලී ව සුදුසු පරිදි සන්නිවේදන උපක්‍රම යොදා ගැනීමේ දක්ෂතාව නිසා ය.

එක් කොටසකට උදාහරණ **දෙක බැගින්** ගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**නැතහොත්**

උම්මග්ග ජාතකය සාර්ථක කතා වස්තුවක් වී ඇත්තේ කතාවට උචිත පරිදි චරිත හසුරුවා ගැනීම නිසා ය.

(අ) වෛදේහ රජුගේ හා

(ආ) බ්‍රහ්මදත්ත රජුගේ චරිත ඇසුරෙන් උදාහරණ **දෙක බැගින්** දක්වමින් සාකච්ඡා කරන්න.

(04) (අ) මනුෂ්‍යයන්ගේ ගති ස්වභාවය ද

(ආ) සත්ත්ව සමූහයාගේ ගති ස්වභාවය ද

සාර්ථක ව නිරූපණයකිරීමට ගුත්තිල කවියා සමත් වී ඇත. වීණා වාදනයෙන් එක් කරුණකට නිදසුන් **දෙක බැගින්** දක්වමින් මෙම අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**නැතහොත්**

(අ) අවස්ථාවට උචිත ලෙස විරිත් භාවිතය ද

(ආ) කාව්‍ය රස තීව්‍ර වන සේ උපමා භාවිතය ද

නිසා ගුත්තිල කාව්‍යය වඩාත් රසවත් වීමට හේතු වී ඇත.එක් කරුණකට උදාහරණ **දෙක බැගින්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15)

(05) 'ගුත්තිල කවියා වීණා වාදනයෙහි වශී වූවන්ගේ ප්‍රතිචාර මගින්,වාදනයෙහි අපූර්වත්වය නිරූපණය කරයි.' උදාහරණ **තුනක්වත්** දෙමින් විස්තර කරන්න.

(ලකුණු 10)

(06) 'සුරඟන රැඟුම මනහර අයුරින් නිරූපණය කිරීමට වෑත්තෑවේ හිමියන්ට හැකි වූයේ උන් වහන්සේ සතු ප්‍රතිභා ශක්තිය නිසා ය.'උදාහරණ **කවි තුනක්** නිදසුන් ගෙන පෙන්වා දෙන්න.

(ලකුණු 10)

(07) 'ජාතක කතාකරුවා හාස්‍යයෙන් හා උපහාසයෙන් යුක්තව කේවට්ට බමුණාගේ චරිතය නිරූපණය කොට ඇත.' උදාහරණ **තුනක්වත්** ඇසුරෙන් මෙම අදහස පැහැදිලි කරන්න.

(ලකුණු 10)

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம
## Sabaragamuwa Provincial Department of Education

**පළමු වාර පරීක්ෂණය - 2016** **10 ශ්‍රේණිය**
**முதலாம் தவணைப் பரீட்சை 2016**
**First Term Test - 2016** **Grade 10**

***සිංහල භාෂාව හා සාහිත්‍ය I***
***சிங்களமொழியும் இலக்கியமும I***
***Sinhala Language and Literature I***

***පැය එකයි***
***One hour***

නම/විභාග අංකය :- ………………………………………………………………………………………

සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 40 ක් ලැබේ.

අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) උත්තරවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන උත්තරය තෝරන්න.

- අංක 1 සිට 3 තෙක් ප්‍රශ්න වල එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය දෙන වචනය තෝරන්න.

1. **මුළු සේසතම** යොදා නිමල් සැදූ නිවස ගංවතුරින් විනාශ විය.
   I. වෛර වීරිය
   II. සම්පූර්ණ උත්සාහය
   III. සන්තක සියලු ධනය
   IV. සියලු තනතුරු

2. යහළුවන් විසින් නයනා **ගොනාට අන්දවන** ලදී.
   I. දැඩි රැවටීමකට
   II. ගොනකුගේ ඇඳුමක් ඇන්ද වීම
   III. උපහාසයට ලක් කිරීම
   IV. කෝපයට පත් කිරීම

3. ශාස්ත්‍රකරු ප්‍රකාශ කළ අනාවැකිය **සිකුරට ම** හරියන බව බොහෝ දෙනකුගේ විශ්වාසය විය.
   I. සිකුරු ග්‍රහයා සමග ගැළපෙන බව
   II. හරියට ම හරි යන බව
   III. සිකුරාදා සිදුවන බව
   IV. සැපතක් ලැබෙන බව

- අංක 4 සිට 6 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

4. මිහිඳු හිමිගේ ආදාහන උත්සවයට පැමිණ සිටි සැමගේ මුහුණු ...................................... වී ඇති බව පෙනුණි.
   I. රූබර
   II. සෝබර
   III. විඩාබර
   IV. හරබර

5. ජනාධිපතිතුමාගේ සම්ප්‍රාප්තිය..................... මහජනතාව බලා සිටියහ.
   I. උපේක්ෂාවෙන්
   II. පරික්ෂාවෙන්
   III. නිරපේක්ෂාවෙන්
   IV. අපේක්ෂාවෙන්

6. අප සියලු දෙනා තුළ ම ..................... ගෞරවය පැවතීම අවශ්‍යය.
   I. අන්‍යෝන්‍ය
   II. අනන්‍ය
   III. අකර්මණ්‍ය
   IV. වියෝජනීය

- සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.

7.
   I. ප්‍රතිඵල , මර්දනය , වර්දනය , සංකීර්ණ
   II. නිර්මානශීලී , ශිෂ්‍යාචාරය , වීරෝධාර , පෙළහර
   III. විශිෂ්ට , පුස්තකාලය , ලේකම් , සලකුණු
   IV. මධ්‍යස්ථානය , කළමණාකරු , අබිරුචිය , සම්ප්‍රධාය

8.

I. දර්ශනය , සමස්ත , ප්‍රධානය , එලඹීම
II. සම්භාව්‍ය , උපදේශක , කතනය , ප්‍රස්ථාව
III. ප්‍රශංසාව , විමර්ශනය , යථාර්ථය , පිළියෙල
IV. පරිවර්ථනය , නිශ්පාදනය , භාෂනය , ප්‍රශ්ණ

9. " බලවි පොළොන්නරු අනුරාපුර පෙදෙස "මෙහි ඉරි ඇඳි පදය අයත් ක්‍රියා වර්ගය වනුයේ,

I. පූර්ව ක්‍රියා II. මිශ්‍ර ක්‍රියා III. ආශිර්වාද ක්‍රියා IV. විධික්‍රියා

10. "වැටි වැටි ඇවිදින මගේ පුංචි පුතා හැංගුණ දෝ" මෙහි ඉරි ඇඳි පදයේ ක්‍රියා වර්ගය වනුයේ,
I. අවසාන II. මිශ්‍ර ක්‍රියා III. විධි ක්‍රියා IV. පූර්ව ක්‍රියා

- 11 සිට 12 දක්වා ප්‍රශ්නවල ප්‍රකෘතිය හා ප්‍රත්‍ය නිවැරදිව ඇති පිළිතුර තෝරන්න.

11. බලයි
I. බල + යි
II. බලා + යි
III. බල් + යි
IV. බලු + යි

12. මහල්ලා
I. මහල් + ආ
II. මහලු + ආ
III. මහල් + ල් + ආ
IV. මහා + ල්ලා

13. උපසර්ග පදයක් යෙදී නැති වරණය තෝරන්න.
I. උප සභාපතිතුමා එදින සභාව මෙහෙය වීය.
II. රත්නපුර ප්‍රදේශයෙන් දුලබ මැණිකක් හමුවිය.
III. දකුණත ඔසවා ගත් සෙබළා ඉදිරියට ගියේය.
IV. ගුරු අවවාද නොපිළිගත් දරුවා නොමඟට ගියේය.

14. 'අනුන් ගැන අතිශයෝක්තියෙන් වර්ණනා කරන්නා 'යන්නට දිය හැකි තනිපදය වනුයේ
I. අනුකාරකයා
II. නිවේදකයා
III. අනුශාසකයා
IV. වන්දිභට්ටයා

15. 'බොහෝ ඇසූ පිරූ තැන් ඇති තැනැත්තා ' යන්නට දිය හැකි තනි පදය වනුයේ
I. පණ්ඩිත
II. බහුශ්‍රැත
III. අල්පශ්‍රැත
IV. මහාශ්‍රැත

- මුලින් දී ඇති පදයට සමාන පදයක් නොමැති වරණය තෝරන්න.

16.
I. ඇස - නෙත , නයන , නුවන්
II. ආලෝකය - පහණ , පැහැය , කාන්තිය
III. දෛනික - දිනපතා , හැමදාම , දවස්පතා
IV. කාන්තාව - කත , මහිලාව , දිගැසි

17.
I. දිය - වතුර , ලෝකය , දෝත
II. දද - බමුණා,කොඩිය , තුවාලය
III. නෙළුම - කමල , තඹර , පද්ම
IV. මුහුද - සයුර , සමුද්‍රය , දලනිදු

- මුලින් දී ඇති පදයට විරුද්ධ පදයක් දී ඇති වරණය තෝරන්න.

18.
I. නාදය - නද , රාවය , රැව්
II. අහස - ගගන , ගුවන , අඹර
III. චංචල - චචල , චල , නිශ්චල
IV. පියා - පීතෘ, පියාණ , අප්පච්චි

19.

I. ප්‍රසිද්ධ - පවර , ප්‍රකට , පතළ

II. රජ - නිරිඳු , භූපති , මීපල්

III. වාසය - කුලය , පරපුර , පෙළපත

IV. අනිවාර්ය - වෛකල්පිත , ස්ථිර , තිරසාර

- අංක 20 සිට 21 දක්වා ඇති ප්‍රස්තාව පිරුළ සඳහා වඩාත් ගැළපෙන අදහස සහිත තෝරන්න.

20. ''ඇවිලෙන ගින්නට පිදුරු දානවා වගේ ''

I. හොඳ දේවල් තවත් අගය කිරීම

II. වැඩි වැඩියෙන් අවුල් කිරීම

III. එක කරදරයකසිට තවත් කරදරයකට පත්කිරීම

IV. පිදුරු ගොඩකට ගිනි තැබීම

21. '' බළලුන් ලවා කොස් ඇට බාවනවා වගේ ''

I. කළ නොහැකි දේවල් ගරහා කතා කිරීම

II. කරන්නට බැරි වැඩක් බළලුන් ලවා කරවා ගැනීම

III. අවදානම් කාර්යයන් වෙනත් අයෙකු ලවා කරවා ගැනීම

IV. අනුන් ලවා ම වැඩකර ගැනීමට උත්සහ කිරීම

- 22 හා 23 ප්‍රශ්නවල එක් එක් පද යුගලයෙහි සම්බන්ධය නිවැරදිව දැක්වෙන වරණය තොරන්න.

22. වාදභේද

I. වෙනස් II. විරුද්ධ III. වැඩි IV. සමාන

23. යනඑන

I. වැඩි II. සමාන III. වෙනස් IV. විරුද්ධ

- 24 හා 25 ප්‍රශ්නවල දී ඇති පදයේ අර්ථය නිවැරදිව දක්වා ඇති වරණය තොරන්න.

24. ප්‍රතිභාව

I. අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාව

II. යමක් නැවත නැවත ලිවීමේ හැකියාව

III. වස්තූන් තෝරා බේරා ගැනීමේ හැකියාව

IV. භාවයන් තෝරා ගැනීමේ හැකියාව

25. සතතාභ්‍යාසය

I. නිරන්තරයෙන් අභ්‍යාසයේ යෙදීම

II. නිරන්තරයෙන් සත්‍ය තකා කිරීම

III. ක්‍රීඩාකටයුතුල යෙදීම

IV. නිතර අභ්‍යාස නො කිරීම

26. අක්ෂරමාලාව හැඳින්වීම සඳහා යෙදෙන නමක් නොවනුයේ,

I. ශබ්දමාලාව II. හෝඩිය III. වර්ණ මාලාව IV. අකාරාදිය

27. අන්තඃස්ථාක්ෂරයක් නොයෙදුණු වචනයක් සහිත වරණය තොරන්න.

I. බලන බැලුම් II. රඟන රැඟුම් III. සවන පිනන IV. සතුටු සිනහ

28. මහාප්‍රාණ අක්ෂර දෙකක් යෙදී ඇති වරණය තොරන්න.

I. අර්බුදය , ලේඛන

II. සෞඛ්‍යය , ප්‍රතිඵල

III. අනර්ඝ, තරංග

IV. ලඹය , ප්‍රභේද

29. ඌෂ්මාක්ෂර පමණක් යෙදී ඇති වරණය තොරන්න.

I. හ , ළ , ච , ර

II. ශ , අඃ , ක , ද

III. ස , ෂ , ශ , ෆ

IV. ෂ , ම , ඩ , ව

30. සඤ්ඤක අක්ෂර පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

I. ගල , ඇඳ , වැද
II. දඟරය , කඹය , හොඬය
III. අබ , අඹ , කඳ
IV. කඳ , වද , මද

31. ' විසිකරපං ' යන පොදු ව්‍යවහාරයට ' ගහමප ' යන ප්‍රාදේශිය ව්‍යවහාරය භාවිතා වන්නේ,

I. මොනරාගල
II. බලංගොඩ
III. මහනුවර
IV. රත්නපුර

32. සීයාට ' මුත්තා ' යැයි ව්‍යවහාර වන්නේ,

I. ඌව පළාතේ ය
II. දකුණු පළාතේ ය
III. බස්නාහිර පළාතේ ය
IV. සබරගමු පළාතේ ය

33. විශේෂණ පද දෙකක් ඇතුළත් වරණය තෝරන්න.

I. වන මල් සිනාසුනා
II. හයියෙන් විලාප දුන්නා
III. ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
IV. පුංචි කුඩුවක කැලයේ

34. කවි පදයක මුල මැද අග සමාන අකුරු වලින් අවසන් වන පදයෙදීම,

I. රිද්මය
II. එළිසමය
III. ශබ්දරසය
IV. අනුප්‍රාසය

35. ' අම්මා සඳකි මම ඒ ලොව හිරුය රිදී ' මෙහි ඇත්තේ,

I. රූපකයකි
II. උපමාවකි
III. අනුප්‍රාසකයකි
IV. එළිසමයකි

- 36- 40 දක්වා ප්‍රශ්න වල දී ඇති වාක්‍ය අතුරින් ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

36.

I. මම හෙට කෝම්පිට්ටු උයන්නෙමු.
II. තරු පෙළ අහසේ බබළති.
III. ගොවියෝ ගවයන් දක්කයි.
IV. නංගී ගීයක් ගැයුවාය.

37.

I. හිරු රැසින් පියුම් පිපෙති.
II. නළඟන රැඟුමක් දැක්වීය.
III. දූවණියෝ මවුපියන්ට උවටැන් කළහ.
IV. අපි වෙහෙස වී අකුරු උගනිව්.

38.

I. කාන්තාවන් දහ දෙනෙක් තරගයට සහභාගී වූහ.
II. සිසුවෝ උද්දාමයට පත්විය.
III. ගංගා බාධක බිඳ සයුරට ඇදීයති.
IV. අපි සත්‍ය ගරුක වෙමු.

39.

I. කඩපෙළ ගින්නෙන් විනාශ විය.
II. පයින් යන්නෝ දකුණින් යනු.
III. ළමයින් සෙල්ලම් කරති.
IV. මිනිසුන් බුද්ධිමත් වෙත්වා.

40.

I. සඟ ගණ වෙහෙරට වඩියි.
II. සියලු සත්ත්වයින් නිදුක් වෙත්වා.
III. හඳ සහ තරු බබළයි.
IV. නාහිමි දහම් දෙසූහ.

**සබරගමුව පළාත්අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**சபரகமுவமாகாணக் கல்வித் திணைக்களம**

**Sabaragamuwa Provincial Department of Education**

**පළමු වාර පරීක්ෂණය- 2016** — **10 ශ්‍රේණිය**

**முதலாம் தவணைப் பரீட்சை 2016** — **தரம் -10**

**First Term Test - 2016** — **Grade 10**

***සිංහල භාෂාව හා සාහිත්‍ය II***

***சிங்கள மொழியும் இலக்கியமும்II***

***Sinhala Language and Literature II***

*පැය දෙකයි*

**இரண்டு மணித்தியாலம்**

*Three hours*

නම/විභාග අංකය ඃ- ……..………………………………………………………………………………………

*සැලකිය යුතුයි ඃ*

**(i) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමිවේ.**

01) I සිට X තෙක් ඇති සියලුම අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න.

I. සිංහල අක්ෂර මාලාව ප්‍රධාන කොටස් කීයකට බෙදේද? ඒ මොනවාද?

II. (අ) අන්තඃස්ථ අක්ෂර 2 ක් ලියන්න.
(ආ) ඌෂ්මාක්ෂර 2 ක් ලියන්න.

III. පහත සඳහන් පද වල ඇති නාම ප්‍රකෘති වෙන්කර දක්වන්න.
(අ ) ගිරව් (ආ) හැන්ද

IV. පහත සඳහන් ඉරි ඇඳි පද වල ක්‍රියා රූපය නම් කරන්න.
(අ) තාත්තා රූපවාහිනිය **<u>නරඹමින්</u>** බත් කෑවේය.
(ආ) ගුරුතුමා ශිෂ්‍යයා ලවා අකුරු **<u>ලියවයි</u>**

V. පහත සඳහන් පදවලට විරුද්ධ පද ලියන්න.
(අ) ආගන්තුක - (ආ) උත්තම -

VI. පහත සඳහන් යුගල පද සම්පූර්ණ කරන්න.
(අ) උදව් - (ආ) දඩ -

VII. පහත දැක්වෙන ප්‍රස්ථාව පිරුළු සම්පූර්ණ කරන්න.
(අ) කලකදී වහලු ………………………………………………………………………….
(ආ) උණ හපුළුවාට උගේ ……………………………………………………………………

VIII. පහත සඳහන් වාක්‍යයේ ඇති නිපාත පද 2 ක් උපුටා දක්වන්න.
(අ) විදුහල්පතිතුමා එනතුරු අම්මා සමග මම බලා සිටියෙමි.

IX. පහත සඳහන් පොදු සිංහල වචන සඳහා ප්‍රාදේශික ව්‍යවහාර ලියන්න.
(අ) කුරුල්ලා- (ආ) ලොකු අම්මා-

X. පහත සඳහන් උක්ත රූපයට ගැළපෙන අනුක්ත රූපය ලියන්න.
(අ) ගැහැනියක්- (ආ) අපි-

(ලකුණු 10×2 = 20)

02) පහත දැක්වෙන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන ඒ ඇසුරෙන් වචන 250 ට නොඅඩු රචනයක් ලියන්න.

(අ) ජන සන්නිවේදන මාධ්‍ය පාසල් දරුවන්ගේ දැනුම් පිපාසයට තෝතැන්නකි. ඒවා ළමා දිවියට, අධ්‍යාපනයට බලපෑම් ඇති කරන්නේ සියුම් අයුරිනි. එබැවින් හොඳ දේ තෝරා බේරා ගැනීමට දරුවන් යොමු කිරීම වැඩිහිටියන්ගේ වගකීමකි.

(ආ) කෘත්‍රිම ආහාරවලට පාසල් දරුවන් යොමු වීම නිසා බෝ නොවන රෝග ඇති වීම වැළැක්විය නොහැකිය. එම නිසා කෘත්‍රිම ආහාර භාවිතයෙන් දරුවන් බේරා ගනිමු.

(ඉ) පරිගණක තාක්ෂණය ලොව පුරා ව්‍යාප්ත වීමත් සමග දරුවන්ගේ කියවීමේ හැකියාව අඩුවෙමින් පවතී. එය නිසි ලෙස පරිහරණය කිරීමට පෙළඹවීම වගකිව යුත්තන්ගේ යුතුකමක් හා වගකීමකි.

(ඊ) තම දිවිපැවැත්මේ විවිධ අවස්ථාවලදී පැරණි ගැමියන්ගේ මුවින් ගලා ආ නිදහස් සිතුවිලි මඟින් ඔවුන්ගේ ජීවිතයේ විවිධ අංශ විසිතුරු අන්දමින් විවරණය කරයි. එම නිර්මාණ අතරේ දක්නට ඇති ජනකවි, ජනකතා අනාගතය සඳහා ආරක්ෂාකර ගත යුතුය.

ලකුණු 25

03) පහත සඳහන් ඡේදය වචන 50- 60 අතර වනසේ සාරාංශ කොට ලියන්න.

අලුත් දේ සොයා යාම මනුෂ්‍යයා තුළ පවතින ස්වාභාවික ලක්ෂණයකි. මනුෂ්‍ය ශිෂ්ටාචාරය ලෝකයේ පැතිරයාමටත්, විද්‍යාවන්ගේ දියුණුව ඇතිවීමටත්, මනුෂ්‍යයාගේ ආධ්‍යාත්මික ගතිගුණ දියුණුවීමටත් මෙම ලක්ෂණය බෙහෙවින් උපකාරී වී තිබේ. කලින් නොදැන සිටිදේ සොයා දැන ගැනීම තරම් මනුෂ්‍යයාගේ සිතට ප්‍රාණවත් ගතිය ගෙන දෙන තවත් දෙයක් නැති තරම්ය. මෙය සෑම මනුෂ්‍යයකු තුළම ස්වාභාවික වශයෙන් පිහිටි ලක්ෂණයකි. මනුෂ්‍යයා කුඩාකාලයේදී මෙය වේගවත් අන්දමින් ක්‍රියාවේ යොදවන බැව් කුඩා ළමයෙකු හැසිරෙන ආකාරය ගැන සිත යොමු කරන විට කෙනෙකුට පහසුවෙන් පෙනීයයි. වයස යත්ම ළමයෙකු කෙරෙහි තිබෙන කුතුහලය හෙවත් නොදන්නා දෙය දැන ගැනීමට තිබෙන ආශාව ක්‍රමයෙන් යටපත් වෙයි. එය යට පත් නොවී පවතී නම් මනුෂ්‍යයාගේ දියුණුව මීට වඩා කීප ගුණයකින් වැඩි වනවාට සැක නැත. අලුත් දේ සොයා යන කෙනෙකුට එම ගමනේදී හමුවන්නේ ප්‍රියජනක දේ පමණක් නොවේ. නොයෙක් අප්‍රිය දේද සිත බිය ගන්වන දේ ද එම ගමනේදී ඔහුට මුණ ගැසෙන්නට පුළුවනි. ඒ සියල්ලම ඔහුගේ ගමනේ කොටස් හෙයින් එකක් අතහැර අනෙක පමණක් ලබා ගැනීමට කෙනෙකුට නුපුළුවන.

ලකුණු 15

04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර සපයන්න.

ගාන්ධි තුමා දකුණු අප්‍රිකාවේ සිට 1941 දී පෙරළා භාරත දේශයට පැමිණි අවස්ථාව වන විට එ රට නිදහස පතා සිදුකෙරෙන නිදහස් සටන ආරම්භ වී තිබිණි. ගෝඛාලේ, රවීන්ද්‍රනාත් ඨාකුර්, ලාල් බහදූර්, ශාස්ත්‍රි වැනි දේශප්‍රේමී නායකයෝ මේ වන විට ඉන්දියාවට නිදහස දිනා ගැනීම සඳහා බ්‍රිතාන්‍ය පාලකයන් සමඟ සටන් වැද සිටියහ. ඉන්දියානු නිදහස් සටන ද සාර්ථක කරගත හැක්කේ තමන් අප්‍රිකාවේදී ලද අත්දැකීම් පදනම් කරගෙන යැයි වටහා ගත් ගාන්ධි තුමා පළමු කොට විවිධ බෙදීම්වලින් වියවුල් ව පැවති භාරතය එක්සත් කිරීමට ඉදිරිපත් වූයේය. ඒ සඳහා එතුමා වසරක් පමණ කාලයක් භාරතයේ ජනතාව අතර සැරිසර මින් ඔවුන්ගේ අදහස් උදහස් අවබෝධ කර ගෙන ඔවුන් අතර තමන්ගේ හැඟීම් හා ආකල්ප පතළකර ගැනීමට උත්සාහ කළේය. එසේ ක්‍රියා කළ සමයේ තන්හි තන්හි එතුමාගෙන් පිටවූ මෙවැනි කියුම් භාරතිය ජනතාව එක ධජයක සෙවණ යටතට ගැනීම සඳහා බලපාන්නට ඇත.

I. ඉන්දියාවේ නිදහස් සටන ආරම්භ වී තිබුණේ කවර කාලයකද?
II. ඉන්දියාවට නිදහස ලබා ගැනීම සඳහා කටයුතු කළ පුරෝගාමීන් දෙදෙනෙකු නම් කරන්න.
III. ඉන්දියාවේ නිදහස් සටන සාර්ථක කර ගැනීමට ගාන්ධි තුමා ගත් ක්‍රියාමාර්ගය කුමක්ද?
IV. භාරතය එක්සේසත් කිරීමට ගාන්ධි තුමාට කොපමණ කලක් ගතවීද?
V. ප්‍රසිද්ධ යන පදයට සමාන පදයක් ඡේදයෙන් සොයා ලියන්න.

ලකුණු 10

05) ඔබ ප්‍රදේශයේ කැළි කසල ඉවත් කිරීමේ ශ්‍රමදානයක් පිළිබඳව දැනුවත් කිරීම සඳහා දැන්වීම් පත්‍රිකාවක් පිළියෙල කරන්න.

නැතහොත්,

ඔබ පාසලේ පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උළෙල සඳහා න්‍යාය පත්‍රයක් සකස් කරන්න.

ලකුණු 10

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| **පළමු වාර පරීක්ෂණය - 2016** | **10 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை 2016** | **பகனபனகடி 10** |
| **First Term Test - 2016** | **Grade 10** |

| | |
|---|---|
| ***සිංහල භාෂාව හා සාහිත්‍ය III*** | ***පැය දෙකයි*** |
| ***சிங்களமொழியும் இலக்கியமும் III*** | **மூன்று மணித்தியாலம** |
| ***Sinhala Language and Literature III*** | ***Three hours*** |

නම/විභාග අංකය :- ........................................................................................................

*සැලකිය යුතුයි :*

**1) උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න. 1,2,3,4 ප්‍රශ්න වලටත් 5,6,7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකටවත් පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

i. “දේවයන් වහන්ස, රාජ්‍ය සුව අනුභව කළ මැනැව”
(අ) ඉහත සඳහන් ප්‍රකාශය උපුටා ගත් ග්‍රන්ථය කුමක්ද?
(ආ) එය ලියැවුණු සාහිත්‍ය යුගය නම් කරන්න.

ii.
(අ) පන්සිය පනස් ජාතක පොතේ සැබැවින්ම ඇති කතා ගණන කීයද?
(ආ) සිංහල ජාතක කතාවන්ට නියමිත ආකෘතිය කුමක්ද?

iii.
(අ) ජාතක කතා ඇසුරින් රචිත ගී කාව්‍යයක් නම් කරන්න.
(ආ) ජාතක පොත ඇසුරින් බිහි වූ කාව්‍ය ග්‍රන්ථයක් නම් කරන්න.

iv.
(අ) ජාතක කතා අතර දීර්ඝතම කතාව නම් කරන්න.
(ආ) එය රචනා කිරීමේ අරමුණ කුමක්ද?

v. “දෙවයන් වහන්ස ,කොට - පිය යුතු කථාවෙක් ඇත.”
(අ) මෙහි ,”දේවයන් වහන්ස ” යනුවෙන් අමතන ලද රජතුමාගේ නම කුමක්ද?
(ආ) ඉහත සඳහන් ප්‍රකාශය කරන්නේ කවුද?

vi. “සබඳ ”, තොප විසින් කුමක් දක්නා ලද ද?
(අ) මෙහි ”සබඳ ” යනුවෙන් අමතන්නේ කාටද?
(ආ) මෙම ප්‍රකාශය කරන්නේ කවුරුන් විසින්ද?

vii.
(අ) ගුත්තිල කාව්‍ය රචනා කළේ යැයි සැළකෙන්නෙ කවුරුන්ද?
(ආ) ඒ කුමන අවධියකද?

viii.
(අ) ගුත්තිල කාව්‍ය සඳහා පාදක වූ ජාතකය කුමක්ද?
(ආ) ගුත්තිල කාව්‍යයේ ඇති පද්‍ය ගණන කොපමණද?

ix.
(අ) “ තත මතුද සින්දේ - පිළිමල් දප ද සින්දේ ”
යන කවිය සම්පූර්ණ කරන්න
(ආ) “ පිළිමල් ” යන්නෙහි අර්ථය ලියන්න

x.

(අ) " දියුණු දියුණුව නද - නික්ම පැතිරෙත දසත විනිවිද "

මෙම කවියේ මුල් පද දෙක ලියන්න

(ආ) " දියුණු දියුණුව " යන්නෙහි අලංකාරය ලියා දක්වන්න.

(ලකුණු 2x 10-20)

2) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ වල ඉරි ඇඳි පද වල අර්ථය වෙන් වෙන් ව ලියා සමස්ත කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.

i. " චූලනී රජද 'එක් සියයක් රජ දරුවන් මරන පිනිස ශෘංගිලා ඉදි කරන ලද මෙබඳු සුරා පානය මහෞෂධ පණ්ඩිතයන් විසින් බාධා කෙළේ යැයි කිපියේ ය."

ii. "ඒ අසා පණ්ඩිතයන් වහන්සේ 'මා බඳු පණ්ඩිත කෙනෙකුන් ජීවත් වැ හින්ද දීම මෙතෙක් රජ දරුවන් මිය යාම යුක්ත නොවන්නේ ය. උනට මා පිටුවහල් වුව මැනැවැ සිතා...."

iii. අනුවණකම් කෙළේ
ගුරුන් ගුණ සිහි නොකෙළේ
නද ඉන් නොතළේ
අයසමය මුළු දියත පතළේ

iv. පියසත් නොව බිඟු දැල් රැඳි කොපුලී
අවසන් නොව වෙණ නදට ම කුහුලී
මද සන්සුන් පියොවින් සිටි නොසැලී
ගජසෙන් සිතියම් ගජ සිරි කියෙලී

(ලකුණු 4 x 5- 20)

3,4 ප්‍රශ්න සඳහා වන පිළිතුරු වලට වචන 125 ක් පමණ සෑහේ.

3)

i. උපමා යොදාගැනීමත් ii. සංවාද යොදා ගැනීමත්

නිසා උම්මග්ග ජාතකය සාර්ථක වී ඇත. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දෙමින් විමසන්න.

නැතහොත් ,

මහෞෂධ පඬිතුමාගේ උපාය කෞශල්‍යය හා දුර දක්නා නුවණ නිසා වේදේහ රාජ්‍ය ආරක්ෂා විය . එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් විස්තර කරන්න.

(ලකුණු 15 යි)

4)

i. අර්ථ රසයේ ශබ්ද රසයේ මනා සංකලනයක්

ii. අවස්ථාවට ගැළපෙන ලෙස විරිත් වෙනස් කිරීමත් නිසා ගුත්තිල කාව්‍ය වඩාත් රසවත් වී ඇත. එක් කරුණකට උදාහරණ දෙක බැගින් යොදාගෙන සාකච්ඡා කරන්න.

(ලකුණු 15 යි)

නැතහොත්

සක් දෙව් රජුගේ ආරාධනයෙන් ගුත්තිල ගාන්ධර්වයා තම ගෝලයා පරාජය කළ ආකාරයත්, ඒ තුළින් මතුවුණු මිහිරියාව නිසා තමාට තමාව අමතකව ගිය ආකාරයත් , ගුත්තිල කාව්‍යයෙන් විද්‍යාමාන වේ. එක් කරුණකට උදාහරණ දෙක බැගින් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15 යි)

- 5,6,7 ප්‍රශ්න වලින් එකකට පමණක් පිළිතුරු ලියන්න. වචන 100ක් පමණ ප්‍රමාණවත්ය.

5) . හාස්‍යයෙන් හා උපහාසයෙන් යුක්තව කේවට්ට බමුණාගේ චරිතය නිර්මාණය කර ඇති අන්දම උදාහරණ 3ක් දෙමින් පහදන්න. (ලකුණු 10 යි)

6) "වචන විනාශකාරී ලෙස භාවිතයෙන් සමාජයකට වියහැකි හානිය සතර කන් මන්ත්‍රණය පාඩමෙන් පෙනේ" උදාහරණ 3ක් යොදා ගෙන විස්තර කරන්න.

(ලකුණු 10 යි)

7) "වෑත්තෑවේ හිමියන්ගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය විදහාපාන කැටපත ගුත්තිල කාව්‍යයයි" නිදසුන් 3ක් යොදාගනිමින් මේ කියමන විමසන්න.

(ලකුණු 10 යි)

NALANDA COLLEGE – COLOMBO 10.

**නාලන්දා විද්‍යාලය - කොළඹ 10**
**පළමු වාර පරීක්ෂණය - 2020**
**10 ශ්‍රේණිය**
**සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය 03**

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
**අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි ඉරි ඇඳි කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.**

(1) "**සීරුමාරුවට** වැඩක් කරලා පුරුද්දක් නැති හැටි" යි අත්තම්මා නංගිට දොස් නැගුවා ය.
1. නිවැරදි ව 2. පරිස්සමට 3. මග හරිමින් 4. ඉතා හොඳින්

(2) "**මට හොඳ පල්ලමක් අහුවුණා**" යැයි ඔහු ප්‍රීතියට පත් විය.
1. කඳු පාමුල පාමුල නිවසක් ලැබීම 2. පහසු තැනක් හමු වීම
3. පහසුවෙන් ජීවත් වීමට හැකි වීම 4. වෙහෙසක් නැතිව කටයුතු කිරීම

(3) ඔහු අප සමග අමනාප වී **පැදුරටත් නොකියා ම** යන්නට ගියේ ය.
1. ඉතා නිහඬ ව 2. පැදුර දෙස නොබලා ම
3. කිසිවකුටත් නොකියා ම 4.හිමිදිරි පාන්දර

(4) තම දියණියගේ සරණ මංගල්‍යය ඉතා ඉහළින් පවත්වන බව පැවසූ ගුණපාලගෙන් කපු මහතා දැවැද්ද ගැන විමසා සිටි කළ, **ඇසළ පෙරහැරට බෙරත් හිඟ දැයි** ගුණපාල පවසා සිටියේය.
1. සරණ මංගල්‍යයට බෙර ඇති බව 2. සියල්ල සම්පූර්ණ බව
3. පෙරහැරේ බෙර හිඟ වූ බව 4. ඇසල මාසයට බෙර ගසන්නේ නැති බව

(5) රජයේ ආයතන වලට **පස්ස දොරෙන්** සේවකයන් බඳවා ගැනීම පිළිබඳව තරුණ සංගමය සිය විරෝධතාව පෙන්වී ය.
1. රහසිගතව 2. සංවිධානාත්මකව 3.සුදුසුකම් නැතිව 4. අයුතු ලෙස

**අංක 6 සිට 10 තෙක් ඇති එක් එක් වාක්‍යයේ හිස්තැන ට වඩාත් සුදුසු වචනය තෝරන්න.**

(6) සිංහලයේ ........................................ කාව්‍යය කව්සිළුමිණ බවට වාදයක් නැත.
1. අග්‍රදාන 2. ආග්‍රගණය 3. අග්‍රහාර 4. අග්‍රකාය

(7) පුරාණ විහාර බිතුසිතුවම් වල දක්නට ඇත්තේ අපට ම ........................................ චිත්‍ර සම්ප්‍රදායකැයි විචාරකයෝ කියති .
1. ආරෝපිත 2. ආවේණික 3. ආකස්මික 4. ආරාධිත

(8) තමන්ගෙන් සේවයට සරිලන වැටුපක් නොලැබෙතැයි සේවිකාවෝ .............................. නගති.
1. ඇගවිලි 2. සිතිවිලි 3. මැසිවිලි 4. ඇවිටිලි

(9) ජනශ්‍රැති ආරක්ෂා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ දේශීය සසංස්කෘතියේ .......................... රැක දීමයි.
1. අඛණ්ඩතාව 2. අවශ්‍යතාව 3. අනන්‍යතාව 4. දෘශ්‍යතාව

(10) කිසියම් අවස්ථාවක කෙනකු හැසිරෙන ආකාරය ................ පෞරුෂ ලක්ෂණ මිණිය හැකි යැයි මනෝවිද්‍යාවේ සඳහන් වේ.
1. අධීක්ෂණයෙන් 2. නිරීක්ෂණයන් 3. සමීක්ෂණයෙන් 4. විචක්ෂණයෙන්

**අංක 11 සහ 12 යන ප්‍රශ්න වල දැක්වෙන සෑම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති පද පේළිය තෝරන්න.**

(11) 1. විමර්ශණය, පිළිරුව, ප්‍රස්ථාරය, ආකර්ෂණය
2. කුෂ්ටය, මද්‍යසාරය, ප්‍රසංශාව, පරිඝණකය
3. කාර්යාලය, ශිෂ්‍යාචාරය, විශ්වාසය, පුස්තකාලය
4. ඵෙක්‍යය, ප්‍රතිඵලය, සම්ප්‍රදාය, දෘෂ්ටිය

(12) 1. ලේඛනය, ප්‍රතිපත්තිය, ඖෂධාලය, දෙපාර්තමේන්තුව
2. දෘශ්‍යතාව්‍යය, සංස්ථාව, සජ්ඣායනය, සංදර්ශනය
3. අන්තරාය, ඡන්දදායකයා, සෞන්දර්යය, ප්‍රභලය
4. සමස්තය, වර්දනය, විශේශණය, සම්ප්‍රධාය

(13) අකාරාදි පිළිවෙළට නම් යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. කතරගම, කුරුණෑගල, මඩකලපුව, බදුල්ල, ගම්පහ
2. මහසෙන්, වලගම්බා, පැරකුම්බා, දුටුගැමුණු, රාජසිංහ
3. ගුත්තිලය, ථූපාරාමය, නම් පොත, බුත්සරණ, සැළලිහිණිය
4. අක්කර පහ, චරිත තුනක්, ගම්පෙරළිය, සිරිත්මල්දම, රතු රෝස මල

(14) හැම පදයකම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වාක්‍ය තෝරන්න.

1. පෞරානික අනුරාධපුර නගරයේ නෂ්ඨාවශේෂ සංචාරකයන්ගේ සිත් ඇද ගනී.
2. ඓතිහාසික වටිනාකමකින් ද යුක්ත වූ චිත්තාකර්ෂණීය ස්තූප සමූහය පුරාණ රජවරුන්ගේ අනර්ග නිර්මාණයකි.
3. ඒ වීරෝදාර රණකාමී පුරුෂතෙම සෙබලුන් ධෛර්යයට පත්කොට දේසද්‍රෝහී සතුරු හමුදාව විනාශයට පත් කළේ ය.
4. පරිගණක විද්‍යා පරීක්ෂණයෙන් විශිෂ්ට සාමාර්ථ්‍යය ලත් සියලු දෙනාම ත්‍යාග ප්‍රදානෝත්සවයට සහභාගි වූහ.

**එක් එක් පේළියේ මුලින් දැක්වෙන පදයේ අර්ථයට විරුද්ධ අර්ථයක් ගෙන පදයක් යෙදී ඇති පද පේළිය තෝරන්න.**

(15) විලිකුන් - ඉදුණු, පැසුණු, වැටුණු, හැළුණු
ආධුනික - ළාමක, විශේෂ, උත්තම, ප්‍රවීණ
දක්ෂ - ශික්ෂක, සක්‍රීය, පරිණත, ක්‍රියාශීලී
ව්‍යක්ත - බහුශ්‍රැත, ආකස්මික, කාර්යක්ෂම, ප්‍රගල්භ

**මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරන්නී**

(16) 1. ආස්වාදය - ආනිශංසය 2. ශිථිල - දෘඪ
3. සංවර්ධනය - නිෂේධනය 4. උත්තේජනය - උත්ථානය

(17) 1.බහුශ්‍රැත - අල්පශ්‍රැත 2.සංක්ෂිප්ත - කෙටි
3. ප්‍රයත්නය - උත්සාහය 4. පසිඳු - ප්‍රසිද්ධ

**අංක 18 සිට 20 තෙක් ප්‍රශ්නවල හිස් තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.**

(18) ශ්‍රී කාන්තා තොමෝ ලෝකවාසීන්ට නිති යස ඉසුරු .......................................
1. ගෙන දෙන්නාහ 2. ගෙන දෙති 3. ගෙනදෙයි 4. ගෙන දෙන්නාය

(19) කාලයක් තිස්සේ ගමට සේවය කළ ...................... අභිමානවත් විලාසයකින් වේදිකාවට පිය නැගුහ. 1. නිලධාරීන් 2. නිලධාරීහු 3. නිලධාරීවරුන් 4. නිලධාරියෙක්

(20) ග්‍රන්ථ ලියා ඇති ..................................ශෛලිය පාඨක රුචිය ඇද ගැනීමට බෙහෙවින් සමත් විය.
1. ප්‍රවීණ 2. ප්‍රයුක්ත 3. ප්‍රස්තුක 4. ප්‍රශස්ත

**අංක 21 සිට 23තෙක් දී ඇති එක් එක් ප්‍රකාශයෙහි අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.**

(21) තමන්ට නුපුරුදු කාර්යයක් කිරීමට ගොස් අපහසුතාවට පත් වීම.

1. ගහෙන් වැටුණු මිනිහට ගොනා ඇන්නා වගෙයි.
2. අනුන්ට කැපූ වළේ තමන් වැටුණා වගේ.
3. ගමරාල සිල් ගත්තා වගෙයි.
4. ඉගුරු දීලා මිරිස් ගත්තා වගෙයි.

(22) කිසියම් දෙයක යථා තත්ත්වය නොදැන අදහස් ප්‍රකාශ කිරීම(,)

1. ඇට් කෙහෙල් කෑ උගුඩුවා වගෙයි.
2. පරංගියා කෝට්ටේ ගියා වගෙයි.
3. කතරගම ගිහින් කිරිවෙහෙර නොදැක්කා වගෙයි.
4. අන්ධයන් අලියාගේ හැඩ රුව කීවා වගෙයි.

(23) වැරදි ක්‍රියාවක නිරත වූ පුද්ගලයා ඒ පිළිබඳව නිරන්තරයෙන් පසුතැවීම

1. අබ කෑ මිනිහගේ නාහෙ දන්නා වගෙයි.
2. කපන්ට බැරි අත ඉඹින්නා වගේ
3. දැළි පිහියෙන් කිරි කන්න වගෙයි.
4. කටුස්සාගේ කරේ රත්තරන් බැන්දා වගෙයි.

(24) ඇලපිල්ල , පාපිල්ල, ඉස්පිල්ල සහ ගයනුකිත්ත යන පිල්ලම් පිළිවෙලින් යෙදුණු පද දැක්වෙන පේළිය තෝරන්න.
1. කාර්යාලය, අනුවාදය, රක්ෂණය, විස්තෘත
2. සාංකාව, විරාගය, සංසිද්ධිය, ඖෂධ
3. සංලාපය, පර්යේෂණය, සංවර්ධනය, කෞතුක
4. රාත්‍රිය, අංශුක, පරිකල්පන, ඖදාර්ථයය

(25) "හී වැල් මොටද බිම හාරන ඌරන්ට" යන පදයෙහි හී වැල් යනු,
1. නගුලට සම්බන්ධ කොටසකි.
2. වනාන්තරයේ වැවෙන වැල් විශේෂයකි.
3. ඌරන්ගේ ශරීර අංගයකි.
4. රිතලයේ කොටසකි.

(26) මුලින් දී ඇති පදයට නිවැරදි අර්ථයක් සපයා නැති පිළිතුර තෝරන්න.
1. කුරුල්ලා - සකලයා, වහලා, රිලවා, ඌරා
2. බක්අම්මා - ලොකු අම්මා, මහම්මා, බත් අම්මා, කොට අම්මා
3. කුදහස - විසි කරපන්, ගහපන්, දුවපන්, බීපන්
4. කැටුං - එකතුව, සමඟ, කැටුව, කරවල

**මුලින් දී ඇති පද වල නිවැරදි අර්ථය දැක්වෙන පද පේළිය තෝරන්න.**

(27) කනටිය, මුත්තෙට්ටුව, යතුර, කුරුණිය
1. පැදුර වී, මනින ඒකකයක්, කුල්ල , අටුව
2. කුඩා ලියද්ද, කමත් බත , කුල්ල , වී මනින ඒකකයක්
3. වී බිස්ස, සුළඟ, දැකැත්ත , කමත අතුපතු ගාන දෙය
4. කොළ පෑගීම, පාවර පොළ, කීඩෑවන්, නගුල

(28) කඹුරනවා, කැස කවනවා, කුරුබිලිය, තත්කාලීන
1. මෙහෙ කිරීම, උත්සාහ කිරීම, අප්‍රකට රහස් දොරටුව, ඒ කාලයට අයත්
2. කුඹුරු කොටනවා, කස ගහනවා, කෙටියෙන් දැක්වීම, වර්තමාන කාලයේ
3. තියුණු ලනු අඳිනවා, බිලී කොක්ක, කෙටිකාලීන
4. ඉහලට, දොස් කීම, දොරටුව, කැළඹුණු

(29) මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා අනුපිළිවෙළින් ලැබී ඇති පද පේළිය තෝරන්න .
1. ලියමින්, ගයා, කරව, දුවවයි
2.ලියමින්, කරව, ගයා, දුවවයි
3. කරව, ගයා, බලනු, කරව
4. ලියමින්, ගයා, දුවවයි, කරව

(30) උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ, ප්‍රථම පුරුෂ සහ ස්ත්‍රී ලිංග බහු වචන පද පිළිවෙළින් ඇතුළත් වරණය තොරන්න .
1. මම, ඔහු, තොපි, ඕ, තොමෝ
2. මම, තොපි, ඔහු, බිසව් තුමු
3. අපි, බිසව් තුමු, ඔහු, සෙබඩක්
4. අපි, බිසව් තුමු, තොපි, සෙබඩක

(31) ව්‍යුත්පත්තිය, සතතාභ්‍යාසය යනුවෙන් අදහස් වන්නේ,
1. උචිත අනුචිත දේ තෝරා බේරා ගැනීමේ හැකියාව, ව්‍යවහාර යෙදුමකි
2.වස්තුවක් තවත් වස්තුවකට ආරෝපණය කිරීම, නිරන්තරයෙන් අභ්‍යාස කිරීම
3. උචිත අනුචිත දේ තෝරා බේරා ගැනීමේ හැකියාව, නිරන්තරයෙන් අභ්‍යාස කිරීම
4. උචිත අනුචිත දේ තෝරා බේරා ගැනීමේ හැකියාව, නිශ්චිතාර්ථය දැක්වීම

**අංක 32 සිට 36 දක්වා තිස් හය දක්වා ඇති ප්‍රශ්න වල ව්‍යාකරණානුකූලව වඩාත් නිවැරදි වාක්‍ය තෝරන්න .**

(32) 1. මම නොහොත් නුඹලා ක්‍රීඩා කරන්නෙහු.
2. අවතැන්වූවෝ කැටුව නිලධාරීහු කඳවුරු වලට එති.
3. ළමයින් පස් දෙනෙකු එතෙර සංචාරයක යෙදුණේය.
4. නුඹලා සමග මම කිසි කිසිදිනක සටන් නො කරමු.

(33) 1. ඇතැමෙක් එතෙර සංචාරයක යෙදුණහ.
2. අයකු නටත් සුරා මතින්
3. සමහරෙක් අවංකව කටයුතු කරයි
4. කවුරු දන් දෙයි ද?

(34) 1. සංවිධායකයන් විසින් අමුත්තෝ පිළිගන්නා ලදී.
2. සංවිධායකයෝ විසින් අමුත්තන් පිළිගන්නා ලදී.
3. සංවිධායකයන් විසින් අමුත්තෝ පිළිගත්තා ලදහ.
4. සංවිධායකයෝ විසින් අමුත්තෝ පිළිගන්නා ලදී.

(35) 1. අධික වර්ෂාව නිසා ගෙවල් ද පාරවල් ද විනාශ වූහ.
2. සමහරක් අවංකව කටයුතු කරයි.
3.මැණියෝ දරුවන් ආරක්ෂා කරති.
4. ගංගා තොමෝ ගලා බැස්සේ ය.

(36) 1. තාරකා පෙළ නුබ ගැබ වර්ණවත් කළා ය.
2. තාරකා පෙළ නුබ ගැබ වර්ණවත් කළේ ය.
3. තාරකා පෙළ නුබ ගැබ වර්ණවත් කරති.
4. තාරකා පෙළ නුබ ගැබ වර්ණවත් කරයි.

(37) මහගමසේකර සූරීන් විසින් රචිත නිර්මාණයක් ව˚න්නේ,
1. සුනේත්‍රා 2. සක්වා ලිහිණි
3. අකීකරු පුත්‍රයකුගේ ලෝකය 4. සඳා මෙලෙස සුර දෙරණේ

(38) "මාණික්‍ය සේ පොලෝ ගැබේ නිධාන වී.." යන පද පේළිය ඇතුලත් කාව්‍ය නිර්මාණය කරන ලද්දේ,
1. එස්. මහින්ද හිමි 2. මඩවල එස්. රත්නායක
3. පරාක්‍රම කොඩිතුවක්කු 4. මහගමසේකර

(39) නිවැරදි නාම ප්‍රකෘතිය හා ක්‍රියා ප්‍රකෘතිය ඇතුළත් පද පේළිය තෝරන්න.
1. මහලු, ගය 2. ගස, කඩා
3. යතුරු , බැලූ 4. යක්ෂයා, ගයයි

(40) පහත දී ඇති අක්ෂර ගැළපීමෙන් සුචනය වන නිවැරදි ග්‍රන්ථ නාමය වන්නේ,
1. රිචත තුක්න 2. ඩොමල්සුවඳු
3. පෙගරම්යළි 4. සක්වෙසණහප

II පත්‍රය

(i) සිට (x) තෙක් ඇති සියලුම අනු කොටස් වලට කෙටි පිළිතුරු ලියන්න.

(01) i. සිංහල අක්ෂර මාලාවේ ඇතුළත්,
(අ) ඝර්ෂ අක්ෂයක්
(ආ) අර්ධ නාසික්‍ය අක්ෂරයක් ලියා දක්වන්න.

ii. පහත දැක්වෙන වචන යොදා අර්ථවත් වාක්‍ය බැගින් නිර්මාණය කරන්න.
(අ) කරණ
(ආ) සරන

iii. පහත දැක්වෙන පොදු ව්‍යවහාරය සඳහා ප්‍රාදේශික ව්‍යවහාර ලියන්න.
(අ) වට්ටක්කා
(ආ) කිරි අල

iv. පහත දැක්වෙන වාක්‍යාංශ සඳහා තනි පද ලියන්න.
(අ) යහපත් සේවයක් සලකා දෙනු ලබන තෑග්ග
(ආ) මැනවින් පුරුදු පුහුණු බව

v. පහත සඳහන් (අ) සහ (ආ) යෙදුම් වල පළමුවැනි වචනය සමග දෙවැනි වචනයෙහි නොගැළපීමක් ඇත. වඩාත් ගැලපෙන සේ පළමු වචනය සකස් කර ලියන්න.
(අ) පාසල් ශිෂ්‍යයෝ
(ආ) ස්ථිර අදිටන

vi. පහත දී ඇති පද සඳහා විරුද්ධාර්ථවත් පද ලියන්න.
(අ) ජන ශූන්‍ය
(ආ) ප්‍රවීණ

vii. පහත සඳහන් පදවල ප්‍රකෘති වෙන්කර වෙන් කර දක්වන්න.
(අ) කුරුල්ලෝ
(ආ) බලති

viii. මෙම පද අයත් වන ක්‍රියා වර්ගය ඉදිරියෙන් ලියන්න.
(අ) දුවමින්
(ආ) රඟ රඟා

ix. මෙම අර්ථය ලබා දෙන ඉඟි වැකි ලියන්න.
(අ) බැණ වැදුනා
(ආ) අස්ථාන බිය

X පහත වැකිවල තද කළු පැහැයෙන් මුද්‍රිත පද කිනම් ක්‍රියා පද වර්ගයට අයත්දැයි ලියන්න
අ) කැරකන් බිහිරියේ -ී කරත වෙන ගායනා සරියේ
ආ) මා ප්‍රිය පුතණුවනි හා දූවණුවනි මා වෙත එනු මැන

(02) පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) විස්තර අතරින් එකක් තෝරාගෙන ගෙන වචන 250කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න.

(අ) අප රටේ පාරිසරික පද්ධතිය පද්ධතියට ප්‍රබල බලපෑමක් ඇති කරන සාධකයක් වන්නේ දිරාපත් නොවන අපද්‍රව්‍යයි. මිනිස් ජීවිත වලට වඩාත් තර්ජනයක් වන නිසා මේ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුය. මේ සඳහා විවිධ ක්‍රියාමාර්ග රැසක් මේ වන විට ගෙන ඇතත් මහජනයාගේ දැනුවත් බව මෙහිදී වඩාත් වැදගත් සාධකයකි.

(ආ) මත්ද්‍රව්‍ය රකුසා සමාජයක පරිහානියට ප්‍රබල ලෙස බලපාන බව පෙනේ. යහපත් සමාජයක් ප්‍රාර්ථනා කරන සෑම දෙනාම මේ මත් රකුසා තුළ ඇති අව ගතිගුණ හැඳිනගෙන එම රකුසා මේ මිහි තලයෙන් තුරන් කිරීමට පෙරමුණ ගත යුතු ය. එසේ වුවහොත් මේ මිහිතලය මානව වර්ගයාට සුරපුරක් වනු ඇත.

(ඉ) අතීත සංස්කෘතියත් සාරධර්මත් අපට හුරු කර තිබුණේ තිබුනේ සරල ජීවන රටාවකි. එහි විවේකය, සතුට, සැනසීම වැනි ගුණාංග නොඅඩුව තිබුණි. බහු භාණ්ඩික වීමත් නාගරීකරණයත් නිසා ලෝකය වෙනස් මගකට ඇද දැමීමෙන් මේ සියල්ල වෙනස් විය. ඒ නිසා එකිනෙකා ලෙසත් සමාජයක් ලෙසත් මේ ගැන අලුතින් සිතන්නට කාලය පැමිණ ඇත.

(ඊ) අතීතයේ පටන් ඉන්දියන් සාගරයේ මුතු ඇටය නමින් විරුදාවලිය ලත් සිරි ලංකා දීපය පින්වන්ත භූමියකි. ඇළ දොළ, ගංගා, දියඇලි වලින් සමන්විත ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයෙන් පිරිපුන් රටකි. අප ජීවත්වන ලංකාවේ සුන්දරත්වය රැක ගැනීම අපගේ යුතුකමකි.

(03) පහත දැක්වෙන පාඨය වචන 40 - 45 ත් අතර වනසේ සාරාංශ කොට ලියන්න. ඔබේ සාරාංශය ඇතුලත් වචන ගණන පිළිතුර අග ලියන්න.

පාසල් කළමනාකරුවන් එදිනෙදා මුහුණ මුහුණපාන තත්ත්වයන් කල්තියා දැනගත හැකි හා එසේ දැන සෑහෙන්න කලකට පෙරාතු ව සැලසුම් කළ හැකි ඒවා නොවේ අනපේක්ෂිතව අහඹුවෙන් මෙන් පැන නගින එබඳු තත්ත්වයන් නිසා ඇතිවන ගැටලු ගැටළු නිරාකරණය කිරීම කල් දැමීමට ඔවුන්ට නුපුළුවන. මෙම පසුබිම මත නිවැරදි දේ නිවැරදි වේලාවට කළ යුතු බවට ආපතිකතාවාදීන් කරන ප්‍රකාශය පාසල් කළමනාකරුවනට බෙහෙවින් ප්‍රයෝජනවත් වනු ඇත. පාසල නිර්මාණය විය යුතුය යන පිළිගැනීම අද ලෝකය පුරාම පැතිර ගොස් තිබේ. මෙයින් පැහැදිලි කෙරෙනුයේ පාසල තමන්ට තම ගැටලු හා ඌනතා විශ්ලේෂණය කරමින් ඒවාට විසඳුම් සෙවිය යුතු බවයි. මෙම නවීකරණ ක්‍රියාදාමයේ දී ක්‍රියාදාමයේදී පාසැලේ ඒ ඒ සංරචක වල වෙනස්කම් ඇති කරන විට ආපතිකතාවාදීන් පෙන්වා දී ඇති කිසියම් එක් සංවිධාන සංරචකයක වෙනස්වීමක් ඇති කරතොත් එම සංරචකයක් තුළ ද සුදුසු වෙනස්කම් ඇති කළ යුතු ය

(04) පහත දැක්වෙන කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

නදින් බඹර ගී සරින් පිරුණු විල්  
තෙරේ පවන වැලපේ  
නිලින් බැබළි තුරුලතා පිපුණු හිම  
පෙනේ ඉපල් ලෙසිනේ

කැලේ කවිය නැත රැයේ තනිය ඇත ගින්න ඇවිළේ  
ලිපේ අඟුරු මත තබා පිසින්නට  
දෙයක් නොමැත ගෙපැලේ

ගිරා කොබෙයි රැළ රිළා වඳුරු පෙළ  
පලා ගියා වැන්නේ  
ඇදී වලා වැසි නිවා තැවුල් ගිනි  
නගා සිනා දෙරණේ

1. මුලදී විල්වල පැවති තත්වය කුමක්ද?
2. දැන් වනයේ වී ඇති වෙනස කවරේද?
3. 'පැලේ කවිය නැත' යනුවෙන් කවියා අදහස් කරන්නේ කුමක්ද?

4. මේ කවියාගේ ප්‍රාර්ථනය කුමක්දැ'යි තනි වාක්‍යකින් ලියන්න.
5. සරින්, ඉපල් පද වල පදවල තේරුම් ලියන්න.

(05) ඔබ පාසලේ වාර්ෂිකව පැවැත්වෙන ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවය පැවැත්වීමට සියලු කටයුතු සූදානම් වී ඇත.එහි න්‍යාය පත්‍රය පිළියෙල කිරීමේ වගකීම පැවරී ඇත්තේ ඔබටයි. නිවැරදි ශිල්පීය ක්‍රම අනුගමනය කරමින් එය සකසන්න.

නැතහොත්

රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිට විය යුතු බව ද ඊට සුදුසු ගොඩනැගිල්ලක් ඉදි කළ යුතු බව ද මොනරවිල දීප්ති යෞවන සමාජය විසින් මාසික රැස්වීමේදී තීරණය කරන ලදී. යෞවන සමාජයේ ලේකම් වන උදේශ් පතිරණ ඔබ යැයි සිතා ස්වයං රැකියා පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීමෙන් ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සිදුවන සේවය පිළිබඳව අවධාරණය කරමින් දැනට ප්‍රජාශාලාව පවතින භූමියේ නව ගොඩනැගිල්ල ඉදිකිරීමට අවසර ඉල්ලමින් ප්‍රාදේශීය ලේකම් වෙත යැවීමට සුදුසු ලිපියක් සකස් කරන්න.

NALANDA COLLEGE – COLOMBO 10.

**නාලන්දා විද්‍යාලය - කොළඹ 10**

**පළමු වාර පරීක්ෂණය - 2020**

**10 ශ්‍රේණිය**

**සිංහල භාෂාව හා සාහිත්‍යය** **කාලය පැය 02**

III පත්‍රය

(01) (i) සිට (x) තෙක් ඇති සියලුම අඩු කොටස්වලට කෙටි උත්තර ලියන්න.

(i) (අ) පන්සිය පනස් ජාතක පොත ලියැවුණු සියවස කුමක්ද ?

(ආ) පන්සිය පනස් ජාතක පොත රචනා කිරීමට අනුග්‍රහය දක්වනු ලැබුවේ කවුරුන් විසින් ද?

(ii) (අ) පන්සිය පනස් ජාතක පොතේ ඇති ජාතක කතා ගණන කීයද?

(ආ) උම්මග ජාතකය රචනා කිරීමේ අරමුණ කුමක්ද?

(ii) (අ) ජාතක කතාවක දැකිය හැකි ආකෘතිමය ලක්ෂණ තුන නම් කරන්න.

(ආ) ජාතක කතා රචනා කොට ඇති ශෛලිය හඳුන්වන නම කුමක්ද?

(iv) (අ) ජාතක කතා ඇසුරින් රචිත ගී කාව්‍ය දෙකක් නම් කරන්න.

(ආ) ජාතක කතා ඇසුරෙන් රචිත ජාතක කාව්‍ය දෙකක් නම් කරන්න.

(v) (අ) චූලනී බ්‍රහ්මදත්ත රජු රජකම් කරන ලද රාජ්‍ය කුමක්ද?

(ආ) චූලනී බ්‍රහ්මදත්ත රජුගේ මෑණියන් වහන්සේගේ නම කුමක්ද?

(vi) (අ) උම්මග්ග ජාතක කථාවේ ඇති විශේෂ ලක්ෂණය කුමක්ද?

(ආ) කේවට්ඨ බමුණා විසින් ඉදිරිපත් කරන ලද යුද්ධෝපායන් දෙකක් නම් කරන්න.

(vii) (අ) ගුත්තිල කාව්‍ය රචිත සාහිත්‍ය යුගය නම් කරන්න.

(ආ) එම යුගයේ රජකම් කරන ලද්දේ කවුරුන් විසින්ද?

(viii) (අ) ගුත්තිල කාව්‍ය රචනා කිරීමට ආරාධනා කරනු ලැබුවේ කවුරුන්ද?

(ආ)ගුත්තිල කාව්‍යය ඇති කවි ගණන කීයද?

(ix) (අ) වෙළඳ කණ්ඩායමට මූසිලයන් හමු වූයේ කිනම් නුවරක දී ද ?

(ආ) ගුත්තිල කාව්‍ය රචනා කිරීම ආරම්භ කර ඇත්තේ කිනම් කාව්‍ය ගණයකින් ද?

(x) (අ) 'දේවයන් වහන්ස, කොට පිය යුතු කතාවක් ඇතැ'යි යන ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින්ද?

(ආ) මෙහි සඳහන් පිය යුතු කතාව වන්නේ කුමක්ද?

(02) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

1." බ්‍රහ්මදත්ත රජ්ජුරුවෝ එබස් අසා දණ්ඩෙන් ගසන ලද ආශිර්විෂයන්හි මෙන් ක්‍රෝධයෙන් දිලිහී කිපුණාහු"
(අ) මෙලෙස බ්‍රහ්මදත්ත රජු කෝපයට පත් වූයේ ඇයි ?
(ආ) මෙම ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය සඳහා මූලාශ්‍ර සපයන ලද ග්‍රන්ථය කුමක් ද ?

2. වර වෙණ නද අසමින් සිත සතොසිනි
සර හැර සියොතුන් පියපත් විදමිනි
(අ) මෙම කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි තේරුම ලිහිල් බසින් ලියන්න.

3. මා දන්නේ මෙපමණක් මය. ඉදින් නුඹ වහන්සේ අමුත්තක් දන්නා සේක් වී නම් පසිඳුව මැනැව.
(අ) මෙය කවුරුන් කා හට පැවසුවේ ද?
(ආ) මෙම අවස්ථාවට පාදක වූ සිද්ධිය කෙටියෙන් ලියන්න.

4. නුවරින් නික්ම රථයෙන් බැස කෙසරු සලා විදහා කිලිපොලන්නා වූ සිංහ රාජයකු සේ විජෘම්භනය කෙරෙමින් ධර්ම යුද්ධ මණ්ඩලයට වැඩි සේක.
(අ) මෙහි සඳහන් උපමා උපමේය වෙන් කර දක්වන්න.
(ආ) මෙහි විස්තර වන්නේ වන්නේ කවුරුන් පිළිබඳව ද?
ඔහු ධර්මයට යුද්ධයට පිවිසෙන්නේ කා සමග ද?

5. කැර මිණි බරණ රැස් - රසින් සුරසැව් සුවහස්
(අ) ඉහත කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.
(ආ) පහත වචන දෙකෙහි අරුත් ලියන්න.
සුරසැව්
සුවහස්

(03) සතර කන් මන්ත්‍රණයේ එන මහෞෂධ පඬිතුමාගේ උපාය කෞශල්‍ය හේතුවෙන් වෛදේහ රාජ්‍ය ආරක්ෂා වූ ආකාරය නිදසුන් හතරක් දක්වමින් විමසන්න.

නැතහොත්

හාස්‍යයෙන් හා උපහාසයෙන් යුක්තව කේවට්ට බමුණාගේ චරිතය නිර්මාණය කර ඇති අන්දම නිදසුන් හතරක් දක්වමින් විග්‍රහ කරන්න.

(04) තමාට තමා අමතක වන තරමටම වීණා නාදය මිහිරි බව පැවසීමට කතුවරයා අවට රැස්ව සිටි පිරිසේ ස්වභාවය වර්ණනා කිරීම අපූරුය. මෙය නිදසුන් හතරක් දක්වමින් විමසන්න

නැතහොත්

"ගුත්තිල ගාන්ධර්වයා තම ගෝලයා පරාජය කළේ සක්දෙව් රජුගේ උපකාරයෙන් ය." අදාළ සිදුවීම් නිදසුන් සේ ගෙන ඔබේ අදහස පහදන්න.

**(05), (06), (07) ප්‍රශ්න වලින් එකකට පිළිතුරු ලියන්න**

(05) ගුත්තිල කාව්‍ය වඩාත් රසවත් වීමට හේතු වී ඇත්තේ අවස්ථාවට උචිත වන පරිදි විරිත වෙනස් කිරීමට කතුවරයා දැක්වූ හැකියාවයි. උදාහරණ තුනක් පැහැදිලි කරන්න.

(06) වචන විනාශකාරී ලෙස භාවිතයෙන් සමාජයකට විය හැකි හානි සතර කම්මන්ත්‍රනය පාඩම ඇසුරින් නිදසුන් තුනක් දක්වමින් විමසන්න.

(07) මහෞෂධ පණ්ඩිතයාගේත් කේවට්ට බමුණාගේත් චරිත තුළ ඇති සම විෂමතා නිදසුන් තුනක් දක්වා විදහා හරින්න.

*************

# පිළිතුරු



**Answer**

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

21 S I,II,III

පළමු වාර පරීක්ෂණය - 10 ශ්‍රේණිය - 2020

# First Term Test - Grade 10 - 2020

සිංහල භාෂාව හා සාහිත්‍යය පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | |
|---|---|---|---|
| (1) - 3 | (11) - 4 | (21) - 4 | (31) - 1 |
| (2) - 3 | (12) - 3 | (22) - 2 | (32) - 3 |
| (3) - 2 | (13) - 3 | (23) - 1 | (33) - 1 |
| (4) - 3 | (14) - 2 | (24) - 3 | (34) - 2 |
| (5) - 2 | (15) - 2 | (25) - 1 | (35) - 4 |
| (6) - 3 | (16) - 1 | (26) - 2 | (36) - 3 |
| (7) - 2 | (17) - 2 | (27) - 3 | (37) - 4 |
| (8) - 1 | (18) - 2 | (28) - 3 | (38) - 4 |
| (9) - 4 | (19) - 1 | (29) - 3 | (39) - 2 |
| (10) - 2 | (20) - 4 | (30) - 4 | (40) - 3 |

(ලකුණු 1 x 40 = 40)

## II පත්‍රය

(01) (i) ය, ර, ල, ව

(ii) සලකුණු විසල්, සුවිශේෂ

(iii) (අ) විසිකළා (ආ) නිදාගන්නවා

(iv) (අ) ගොවි + ආ (ආ) යතුරු + අ

(v) (අ) කපවයි

(ආ) කපනු, කපනු මැනවි, කපන්න.

(vi) (අ) මිදුල (ආ) චෛත්‍යය, දාගැබ, සෑය

(vii)(අ) ක්‍රියාත්මක නොවී තිබීම.

(ආ) තරාතිරම බලා

(viii)(අ) වඳින්න ගිය දේවාලේ හිස මත කඩා වැටුණා වගේ

(ආ) ඌරෝ කවදද කහ කෑවේ

(ix) ප්‍රතිඵල, භුක්ති විඳින

(x) (අ) කාර්මිකයෙක් (ආ) ඔවුහු

(ලකුණු 2x10=20)

(02) රචනය

(i) සාරවත් භාවය, මාතෘකාව ද ඇතුළුව
ලකුණු 08

(ii) සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය
ලකුණු 12

(iii) ශිල්පීය දක්ෂතා හා ඡේද බෙදා ලිවීම
ලකුණු 05

**(මුළු ලකුණු 25)**

(03) සාරාංශකරණය

(i) අන්තර්ගතය = ලකුණු 06

(ii) වචන ගණන = ලකුණු 02

(iii) ශිල්පීය දක්ෂතා = ලකුණු 02

**(මුළු ලකුණු 10)**

අන්තර්ගතය

* බොහෝ භාෂාවලට සුවිශේෂ සාහිත්‍යයක් ඇත.
* උගතුන් විසින් ලියන ලද කාව්‍යයට විශේෂ තැනක් හිමි වේ.
* සෑම කාව්‍යයක් ම කවර හෝ යුගයක එක් ලේඛකයෙකු විසින් ලියා වී ඇත.
* ජනතාව අතරම ඇති වී ආරක්ෂා වී එන කවි ජන කවි වේ.
* උගත් සාහිත්‍යයක් නැති ජන කොටසක් තුළ වුවද ජන කවි බිහි විය හැකි ය.
* උගතුන් කවි ලිවීමට පෙර පටන් ම ජන කවි සාහිත්‍යය බිහි වී ඇත. (ලකුණු 2x5=10)

(04) අවබෝධය

(i) විසිවන සියවසේ මුල් භාගයේ දී

(ii) සිංහලයේ ආනාදිමත් කාලයක සිට සංවර්ධිත හා කතා කලාවක් බිහිවීමත් එහි සිංහල කෙටි කතාවක විකාශය පහළ වීමත් ය.

(iii) ජාතක කතා, සද්ධර්මරත්නාවලිය, සද්ධර්මාලංකාරය ආදී සිංහල කතා ඇසුරේම උපන් නිසා

(iv) 1924, ගැහැනියක් කෙටි කතා සංග්‍රහය

(v) මාර්ටින් වික්‍රමසිංහ මහතා (ලකුණු 2x5=10)

(05) ව්‍යාපාරික ලිපිය

ආකෘතිය ලකුණු 05

අන්තර්ගතය ලකුණු 07

ශිල්පීය දක්ෂතා ලකුණු 03

මුළු ලකුණු 15

නැතහොත්

ආරාධනා පත්‍රය

(1) ආකෘතිය 06

(i) මාතෘකාව 01

(ii) නිර්මාණාත්මක භාවය 02

(iii) ආරාධනා කරන්නා 01

(iv) ආරාධිත දිනය 01

(v) ආරාධිත ස්ථානය 01

(2) අන්තර්ගතය 06
(i) අරමුණ 01
(ii) පැවැත්වෙන දිනය 01
(iii) පැවැත්වෙන වේලාව 01
(iv) පැවැත්වෙන ස්ථානය 01
(v) ආරාධනය කුමක් සඳහා ද යන්න 01
(vi) ආරාධනය ලබන්නා 01
(3) ශිල්පීය දක්ෂතා ලකුණු 03
(සම්පූර්ණ ලකුණු 15යි.)

## III පත්‍රය

(01) (i) (අ) iv වෙනි පරාක්‍රමබාහු
(ආ) කුරුණෑගල යුගය
(ii) (අ) vi වෙනි පරාක්‍රමබාහු රජතුමාගේ
(ආ) වෑත්තෑවේ හිමි
(iii) (අ) ගිරා පෝතකයා
(ආ) මහෞෂධ පඬිතුමා
(iv) (අ) තමා නාද මිහිරයි යනමානය
දමා එයින් වින්දෝ අවමානය
(ආ) උපමාව
(v) (අ) දම්පියා අටුවා ගැට පදය
(ආ) 14 වෙනි සියවස
(vi) (අ) වර්තමාන කතාව / අතීත කතාව /සමෝධානය
(ආ) පාලි ජාතකට්ඨ කතාව
(vii) (අ) 511යි
(ආ) වායු ගණය
(viii)(අ) ගී විරිත
(ආ) මහෞෂධ පඬිඳුන්ගේ බුද්ධ මහිමය කියා පෑම සඳහා
(ix) (අ) ගුත්තිල ජාතකය
(ආ) තොටගමුවේ ශ්‍රී රාහුල හිමි
(x) (අ) වීරසිංහල පතිරාජ ඇමති
(ආ) අමරා දේවිය (ලකුණු 2x10=20)

(02) (i) (අ) කනට මිහිරි
චංචල යන අදහස
(ආ) කනට මිහිරි වූ වීණා නාදය ඇසීමේ අශාවෙන් රන් රසු දූල් කෝලහල වෙතැයි යන බියෙන්, චංචල නො වී එහි පිළිරූ මෙන් නොයෙක් අශ්ව සේනාවෝ නිසල ව හිටිවන ම සිටියෝ ය.
(ii) (අ) අද වන විට / උදාසීන යන අදහස
(ආ) චූලනී බ්‍රහ්ම දත්ත රජ එක් සියයක් රජ දරුවන් පිරිවරාගෙන මියුලු නුවර වට ලෑමට පැමිණෙමින් සිටීම.
(iii) (අ) කැමැත්තෙන් / ඔවුන් ළඟම
(ආ) වීණා නාදයට ආශා කිරීම නිසා
(iv) (අ) ඉනට ඇඳි රෙදි කඩ / ඉන බැඳි රෙද්ද (වැනි අදහසක් )
අභිමිව, හිමිකමක් නැතිව
(ආ) මම ගල් කැටයක් රැගෙන කපුටන් රංචුවක් පලවා හරින කෙනෙකු ලෙස ද / දුන්නක් ගෙන වඳුරන් සමූහයක් එළවා දමන කෙනෙකු ලෙස ද / නිගණ්ඨ සේනාවක් ලෙස
(v) (අ) සිටිතැන්වලම / ආශාව
(ආ) සුරගනන් නමසීයක් දෙන වීණා වාදන භූමියට පැමිණ නැටීමට පටන් ගැනීම.
(ලකුණු 4X5=20යි)

(03) (i) **කේවට්ටගේ කූට බුද්ධිය**
★ සතර කන්මන්ත්‍රණ අවස්ථාව
★ ශ්‍රී යහන් ගර්භයේ සිට කල්පනා කිරීම
★ ධර්ම යුද්ධය සැලැසුම් කිරීම
★ මියුලු නුවරට දර, පැන්, සහල් නැවැත්වීමේ උපාය
★ එක් සියයක් රජ දරුවන් මැරීමට සැලසුම් කිරීම.
(ii) **මහෞෂධ පඬිඳුන්ගේ ප්‍රඥා මහිමය**
★ රාජධානිවල චර පුරුෂයන් රැඳවීම.
★ ගිරා පෝතයාගේ තොරතුරු ප්‍රයෝජනයට ගැනීම.
★ ධර්ම යුද්ධය පැරදවීම.
★ නගරයේ ධනවතුන් පදිංචි කරවීම.
ඉහත ආකාරයේ සුදුසු උදාහරණ
නැතහොත්
(i) ★ කන්කළු වෙණ නද .....
★ මන්මත් කරවන ........
★ සතොස් කරන ......
මෙවැනි සුදුසු උදාහරණ
(ii) ★ ළඟ ළඟ වා ...... ★ යටසින් ........
★ රූ රැසේ ..... ★ පුන් මදාරා .......
ඉහත උදාහරණ 2ක් (ලකුණු 15යි)

(04) (i) ★ සුරා පානය වැළැක්වීම (යෝධයන් යැවීම)
★ ධර්ම යුද්ධය
★ වේදේහ රජු ඇතුළු පිරිසකගේ බිය දුරු කිරීම
වැනි සුදුසු උදාහරණ
(ii) ★ ගිරාපෝතකයා වසුරු හෙළීම
★ ධර්ම යුද්ධය පැරදීම
★ දර, වතුර, සහල් උපාය පැරදීම
ආදී සුදුසු උදාහරණ
**නැතහොත්**
(i) ★ 1- 8 කවි ★ 11- 13 කවි
(ii) ★ කන්කලු වෙණ නද .......
★ පන්සිළු වීණා .....
★ වර වෙණ නද .....
ආදී ගැළපෙන කවි (ලකුණු 15යි)

(05) ★ චූලනී රජු හා කේවට්ට අතර සාකච්ඡා
★ වේදේහ හා මහෞෂධ පඬි අතර සාකච්ඡා
★ චූලනී රජ හා තලතා දේවි අතර සාකච්ඡා
★ චර පුරුෂ, ගිරා මහෞෂධ පඬි අතර සාකච්ඡා
ආදී ලෙස සුදුසු උදාහරණ (ලකුණු 10යි)

(06) කරුණු දෙකම සහිත සුදුසු උදාහරණ (ලකුණු 10යි)

(07) ★ චරපුරුෂ සේවා
★ මියුලු නුවර වැට ලූ අවස්ථාවේ ගත් පියවර
★ ධර්ම යුද්ධය
ආදී සුදුසු උදාහරණ (ලකුණු 10යි)

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

ස්තූතියි !

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ